# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,867 — 1969 අගෝස්තු 15 වැනි සිකුරාද — 1969.8.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1395 | කොටුපල් වරෙන්ද හා වෙනත් වරෙන්ද විකිණීම ... ... | 1444 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1411 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 1413 | රට සීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1442 | විවිධ දැන්වීම ... ... | 1445 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ශෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසි වලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. ඊ. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

(ii) අඩුගණනේ අවුරුදු 6 ක පළපුරුද්දක්. ඒ පළපුරුද්ද පිරිවැය කටයුතු සම්බන්ධයෙන් නම් වැඩි සැළකිල්ලක් දැක්වේ.

(ඩී) 1969 අගෝස්තු 29 වැනි දිනට වයස අවුරුදු 30 ට නොඅඩුවූ ද, අවුරුදු 45 ට නොවැඩිවූ ද වීය යුතුයි.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ 1, ගාලුමුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායඝීලයේදී ය.
තැ. පෙ. 500.

8–860/1—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 75/එක්ස් 2131/69.

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### ප්‍රධාන ගමනාගමන පිරිවැය නිළධාරි තනතුර

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ගමනාගමන පිරිවැය නිලධාරී තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කායඝීලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන් හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 අගෝස්තු මස 29 වැනිදා.

**(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 සැප්තැම්බර් මස 5 වැනිදා.**

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්ද වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කායඝීල වලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කායඝීලයට නියමිත කාල සීමාව ඇතුළතදී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගත් අයදුම්කරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේය : රු. 4,080—360×12 හා 480×10—රු. 13,200.

(මේ වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රුපියල් 8,400 හා රුපියල් 11,760 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ද, වර්ෂයකට රුපියල් 11,280 මත දෙවර්ෂයක නැවතීමක් ද වේ.)

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) (i) ලන්ඩන්හි පිරිවැය හා වැඩ ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණයෙන් සාමාර්ථය ;

නැතහොත්

(ii) ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ ගණකාධිකරණය පිළිබඳ වෙනත් පිළිගත් ආයතනයක මධ්‍ය පරීක්ෂණයේ සාමාර්ථය හෝ ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ අවසාන ඩිප්ලෝමා සහතිකය සහ මේ සුදුසුකම් ලබාගැනීමෙන් පසුව පිරිවැය කටයුතු පිළිබඳ අඩුගණනේ අවුරුදු 3 ක වත් පළපුරුද්දක්.

(සී) 1969 අගෝස්තු 29 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් වීය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

**සැ. යු.**—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තමන්ට එවන ලද ("බී" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ 1, ගාලුමුවදොර ඔහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායසීලයේදී ය.
තැ. පෙ. 500.

8–860/2—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : සාප 5/102.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කාර්මික අධ්‍යාපන ආයතනවල I වැනි පන්තියේ යාන්ත්‍රික වැද්දුම්කරු තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ I වැනි පන්තියේ යාන්ත්‍රික වැද්දුම්කරු තනතුරු සඳහා පහත දක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 අගෝස්තු මස 31 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම් ට ලැබෙන සේ එවිය යුතුය. කවරයේ වම් කෙළවර උඩ "යාන්ත්‍රික වැද්දුම්කරු තනතුර" යන්න සඳහන් කළ යුතුයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :**

(i) තනතුර ස්ථිරය. පත් කරනු ලබන්නාගේ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය 1964.2.7 වැනි දින අංක 633 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධිවිධානයන්ට යටත්වනු ඇත. මාසික වැටුප් ක්‍රමයෙහි තැබීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ප්‍රදානය කළ විට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතුයි.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්ෂා කාල සීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුව හොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ හෝ ආධුනික තත්ත්වයේ පවතිනු ඇත.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

**3. වැටුප් හා දීමනා :**

(අ) කොළඹ නාගරික සීමාව සහ නාගරික සීමාවේ සිට සැතපුම් 5 ක අරය තුල වූ ප්‍රදේශය තුල හෝ ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබ ඇති ආයතනවල හෝ සේවය කරන්නවුන් සඳහා —

පළමු හය මස තුළ දිනකට රු. 3.86 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 1,170 — 42 × 12 — රු. 1,674.

(ආ) පිට පළාත්වල ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතන හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු නො ලැබ ඇති ආයතනවල සේවය කරන්නවුන් සඳහා —

පළමු හය මස තුල දිනකට රු. 3.30 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 1,044 — 42 × 8 — රු. 1,380.

රජයේ නීති රීති අනුව ජීවනාධාර දීමනා, විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී දීමනා ද ගෙවනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වෙයි.

(අ) ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 25 ට නො අඩු හා අවුරුදු 35 ට නො වැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ආ) (i) කියවීමට හා ලිවීමට පිළිවන් විය යුතුයි.

(ii) සූක්ෂම මානයක් කියවීමට හා දශම සටහන් කිරීමට පිළිවන් විය යුතුයි.

(iii) ඔහු යෙදවිය යුතුවන යන්ත්‍රයේ හෝ ඉංජිනේරු අංශයේ ක්‍රියාකාරීත්වයට පදනම් වන ප්‍රධාන මූලධර්ම පිළිබඳව සෑහෙන දැනීමක් තිබිය යුතුයි. එබඳු යන්ත්‍රවල තිබෙන දෝෂ සොයා ගෙන, ඒවාට පිළියම් කිරීමට පිළිවන් විය යුතුයි.

(iv) එබඳු වැඩ සම්බන්ධයෙන් යෙදෙන ඇඳීම් කියවා තේරුම් ගැනීමට පිළිවන් විය යුතුයි.

(v) පහත දක්වෙන ඕනෑම එකක් ක්‍රියා කරවීමට පිළිවන් විය යුතුයි:—

(අ) ලියවන පට්ටල,

(ආ) මිලිං යන්ත්‍ර,

(ඇ) හැඩ ගස්වන යන්ත්‍ර.

(ඇ) පිළිගත් ආයතනයක පළමුවැනි පන්තියේ අදල වෘත්තීයකරුවෙකු (යාන්ත්‍රික වැද්දුම්කරුවෙකු) වශයෙන් අවුරුදු 6 ට නොඅඩු සේවයක් සහිතව අදල වෘත්තීයකරුවෙකු වශයෙන් අවුරුදු 10 ට නොඅඩු සේවයක් තිබිය යුතුයි. (සහතික පත් මගින් සනාථ කළ යුතුයි.)

**සටහන.**—එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තීකයෙකු ලෙස කළ සේවය පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තව සිටිය යුතුයි.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක් ම සූදනම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ආ) උප්පැන්න සහතිකය.

(ඇ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) 4 වැනි ඡේදයේ (ඇ) අනුඡේදය යටතේ සඳහන් වන පිළිගත් ආයතනයන්හි පූර්වසේවය පිළිබඳ සහතික.

(ඉ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත් වූ ඉහළම විභාගය දක්වෙන සහතිකය.

(ඊ) චරිත සහතික දෙකක්—මින් එකක් ග්‍රාම සේවකගෙන් විය යුතුයි.

**සටහන.**—(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල සිටපත්වත් අයදුම්පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ නමටද එවිය යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. ඒහෙත් නියම අවස්ථාවේ දී

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළ හොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍යසේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් බාරගන්නා අවසාන දිනය පසුවී දින 21 ක් ඇතුළත ඉල්ලුම්පත ලැබුණ බවට ලිපියක් නොලද හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමිවනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දී ය.

## ඉල්ලුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය

(මෙම ඉල්ලුම් පත්‍රය අඟල් 8½ × 13½ ප්‍රමාණයේ කඩදසියක පිළියෙල කළ යුතුය.)

**I වැනි පන්තියේ යාන්ත්‍රික වැද්දුම්කරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි**
**සාප/5/102**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ස්ථිර ලිපිනය :————.
3. ගම් ප්‍රදේශය :————.
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට නියම වයස :————.
   උපන් දිනය :————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග :——
7. අධ්‍යාපන සුදුසුකම් :—
   (i) සාමාන්‍ය :————.
   (ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත්වී ඇති උසස්ම විභාගයේ විස්තර: ————.
8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (ඇ) අනු ඡේදය යටතේ සේවා විස්තර· (සේවය කළ ආයතන, සේවා කාලයන්, දරූ තනතුර සඳහන් කළ යුතුයි.:-
9. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————
10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම්, (අ) දිනය (ආ) නඩු නොම්මරය (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.
11. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.
12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.
14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—
   (i) දරන ලද තනතුර :————.
   (ii) නියුක්තව සිටි වකවානුව :————.
   (iii) අස්වීමට හේතුව :————.
15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කළින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්—
   (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
   (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
   (ඇ) සේවය නතර කිරීමට හේතු :————.
16. දැනට යෙදී සිටින රක්ෂාව :—
   (i) ආයතනය :————.
   (ii) තනතුර හා ශ්‍රෙණිය :————.
   (iii) ඊට පත් වූ දිනය :————.
   (iv) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම් ද :————.
   (v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය :————.
   (vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.
17. වෙනත් කරුණු :————.
18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

අධ්‍යා. සං./ලේ.
මගේ අංකය :
ඔබේ අංකය : සාප/5/102.

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාරගන්නා අවසාන දිනට පසුය/පෙරය.* මොහු තෝරාගනු ලැබුව හොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන් ……….. අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන,
පදවි නාමය :————.

දිනය :————.

*අදල නැති කොටස් කපා හරින්න.

8—868/1—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

සාප/5/115.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික තනතුර

අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික තනතුර සඳහා පහත දක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 අගෝස්තු මස 31 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සාංස්කෘතික අමාත්‍යාංශයේ, සාමාන්‍ය පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ උඩ " ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික " යන්න සඳහන් කළ යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි. —

(i) තනතුර ස්ථිරයි. විශ්‍රාම වැටුප් සහිතයි. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්ෂ: කාල සීමාව අවුරුදු 3ක් වන්නේය.

(iii) රජයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුවහොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ තත්ත්වයේ පවතිනු ඇත.

(iv) පත්කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තීරණය කරනු ලැබුවහොත එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප තබන ලෙස පත් කරනු ලබන්නාට නියම කරනු ඇත.

(vi) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3. වැටුප් හා දීමනා.—මේ තනතුරට අයත් වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,860—120—රු.3,780 වේ. රජයේ නීතිරීති අනුව ජීවනාධාර දීමනා විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී දීමනාදිය ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක් ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වෙයි.

(අ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, හෝ

(ii) සිංහල/දෙමළ භාෂාව හා අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු (සාමාන්‍ය පෙළ) සහතිකය

(iii) ඊට සමාන හෝ උසස් විභාගයක සාමාර්ථය ලබා සිටිය යුතුයි.

සටහන.—අධ්‍යාපන සුදුසුකම් නොතකා අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තු යටතේ සිනමායන්ත්‍ර ක්‍රියාකරු සහ සහකාර සිනමායන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් අවුරුදු දහයකට නොඅඩු සේවයක් තිබෙන අයද සළකා බලනු ලැබේ.

(ආ) ඡායාරූප ශිල්පය පිළිබඳ අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුයි.

(ඇ) පහත දැක්වෙන උපකරණ ක්‍රියා කරවීමට හා නඩත්තු කිරීමට පිළිවන් විය යුතුයි :—

මිලිමීටර් 35 ප්‍රක්ෂේපකය
කද ප්‍රක්ෂේපකය
එපිඩස්කෝපය
තැටි වාදනය කිරීමේ යන්ත්‍රය
පටිගත කිරීමේ යන්ත්‍රය
මිලිමීටර් 16 චිත්‍රපටි හා ශබ්ද ප්‍රක්ෂේපකය

(ඇ) ඉල්ලුම් පත් බාරගන්නා අවසාන දිනට (1969.8.31) වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නො වැඩි විය යුතුය. දැනට රජයේ සේවයේ නියුක්තවූවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.

5. පහත සඳහන් ලියකියවිලි අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම් විය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ පාඨශාලාවලට ඇතුලත්වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවන්ට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය බාරගත නොහැක.),

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන හා වෘත්තීය සහතික,

(ඇ) 4 වැනි ඡේදයේ (ආ) සහ (ඇ) අනුඡේදයන් යටතේ සඳහන්වන පළපුරුද්ද හා දැනුම සනාථ කෙරෙන සහතික,

(ඇ) සිංහලෙන්/දෙමලෙන් සමත්වූ ඉහළම විභාගය දක්වෙන සහතිකය,

(ඉ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්. මින් එකක් ග්‍රාම සේවක ගෙන් විය යුතුයි.

සැළකිය යුතුයි.—දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් විසින් චරිත සහතික ඉදිරිපත් කළ යුතු නැත.

සටහන.—(i) ලියකියවිලි හෝ ඒවායේ පිටපත් හෝ අයදුම්පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ගැන සළකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් විසින් තම ඉල්ලුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් කළ දිනයට පසුව එවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට නියම අවස්ථාවේදී ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසිද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුණු වග දන්වනු ඇත. ඉල්ලුම් පත් බාර ගන්නා අවසාන දින පසුවී දින 21 ක් තුල ඉල්ලුම් පත ලැබුණු බවට ලිපියක් නො ලද හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන ශාඛාවේ දී ය.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය—අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි—(සාප/5/115)**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. තැපැල් ලිපිනය :————.

3. (i) ජාතිය :————.

(ii) ලාංකික වන්නේ පරම්පරාවෙන්ද ? :————.

(iii) ලියාපදිංචිවීමෙන් ද? :————.

(iv) එසේ නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනය හා අංකය ————.

4. (අ) උපන් දිනය :————.

(ආ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස :—

අවු :————. මාස :————. දින :————.

5. උපන් ස්ථානය : (අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ සීයා :————.

(ඇ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. විවාහකද අවිවාහකද වැන්දඹුද :————.

7. (අ) වයස 15 සිට ඉගෙන ගත් පාඨශාලා සහ අනිකුත් ආයතන :

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/කාර්මික අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාසල | සිට | දක්වා | ආයතනය | සිට | දක්වා |
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

(ආ) අන්තිමට ඉගෙනගත් පාසලෙන් අස් වූ දිනය :————.

8. අධ්‍යාපන සුදුසුකම් :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකයේ විෂයයන් හා වර්ෂය :————.

(ආ) අධ්‍යයන පොදු සහතිකයේ විෂයයන් හා වර්ෂය :————.

(ඇ) වෙනත් සුදුසුකම් :————.

9. ලබාගෙන ඇති වෘත්තීය/කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :—

සහතිකය :————.

ආයතනය :————.

වර්ෂය :————.

10. ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්ද ලැබූ ආයතන හා කාලය පිළිබඳ විස්තර :————.

11. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබ තිබේද ? එසේ නම්, (අ) දිනය (ආ) නඩු නොම්මරය (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

12. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.

13. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර :————.

14. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

15. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා :—

(i) දරන ලද තනතුර :————.

(ii) නියුක්තව සිටින වකවානුව :————.

(iii) අස්වීමට හේතුව :————.

16. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්—

(අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.

(ආ) සේවයේ යෙදී සිටි කාලය :————.

(ඇ) සේවය නතර කිරීමට හේතු :————.

17. දැනට යෙදී සිටින රක්ෂාව—

(i) ආයතනය හෝ දෙපාර්තමේන්තුව :————.

(ii) තනතුර හා ශ්‍රේණිය :————.

(iii) ඊට පත්වූ දිනය :————.

(iv) විශ්‍රාම වැටුප් සහිත ද? තාවකාලික හෝ අනියම් ද :————.

(v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය:————

(vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.

18. වෙනත් කරුණු :————.

මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නො මැතිව සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම් පත් පහත සඳහන් සටහන සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මගේ අංකය :

ඔබේ අංකය සාප/5/115.

අධ්‍යා. සං./ලේ.

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය*.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් .................. අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව් පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

..................................

..................................

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය :————.

දිනය :————.

* අදාල නැති කොටස් කපා හරින්න.

8–868/2—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : සාප/5/90.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### කාර්මික අධ්‍යාපන ආයතනවල I වැනි පන්තියේ වඩු කාර්මික තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ I වැනි පන්තියේ වඩු කාර්මික තනතුරු සඳහා පහත දක්වෙන සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 අගෝස්තු මස 31 වැනි දින හෝ ඊට පෙර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම් ට ලැබෙන සේ එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ උඩ ''වඩු කාර්මික තනතුර'' යන්න සඳහන් කළ යුතුයි.

**2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—**

(i) තනතුර ස්ථිරය. පත් කරනු ලබන්නාගේ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය 1964.2.7 වැනි දින අංක 633 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධිවිධානයන්ට යටත්වනු ඇත. මාසික වැටුප් ක්‍රමයෙහි තැබීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ප්‍රදානය කළ විට වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) පත් කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් පරීක්ෂා කාල සීමාව අවුරුදු 3 ක් වන්නේ ය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නකු තෝරා ගනු ලැබුව හොත් පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ හෝ ආධුනික තත්ත්වයේ පවතිනු ඇත.

(iv) පත් කරනු ලබන්නා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගිනි.

**3. වැටුප් හා දීමනා.—**

(අ) කොළඹ නාගරික සීමාව සහ නාගරික සීමාවේ සිට සැතපුම් 5 ක අරය තුල වූ ප්‍රදේශය තුළ හෝ ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබ ඇති ආයතනවල හෝ සේවය කරන්නවුන් සඳහා—

පළමු හය මස තුළ දිනකට රු. 3.86 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 1,170—42 × 12—රු.1,674

(ආ) පිට පළාත්වල ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතන හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු නො ලැබ ඇති ආයතනවල සේවය කරන්නවුන් සඳහා —

පළමු හය මාස තුල දිනකට රු. 3.30 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 1,044—42 × 8—රු.1,380.

රජයේ නීතිරීති අනුව ජීවනාධාර දීමනා, විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී දීමනා ද ගෙවනු ලැබේ.

**4. අවශ්‍ය සුදුසුකම්.—**

සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටු දායක සාක්ෂි ඉදිරිපත් කළ යුතු වෙයි.

(අ) ඉල්ලුම් පත් බාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ආ) (i) කියවීමට හා ලිවීමට පිළිවන් විය යුතුයි.

(ii) 1/32" පරිමාණයක් කියවීමට පිළිවන් විය යුතුයි.

(iii) ඇඳීම් කියවීමට පිළිවන් විය යුතුයි.

(iv) සිය වෘත්තීය හා සම්බන්ධ ආයුධවල නම්, භාවිතය හා ඒවා තබා ගැනීම පිළිබඳ ව හොඳ පළපුරුද්දක් තිබිය යුතුයි.

(v) තමන් යොදවනු ලබන්නාවූ වඩුවැඩ හා මූට්ටු කිරීමේ වැඩ පිළිබඳව සම්පූර්ණයෙන් දැන ගත යුතු අතර, එවැනි ඕනෑම වැඩක් කිරීමට හැකි විය යුතුයි.

(ඇ) පිළිගත් ආයතනයක පළමුවැනි පන්තියේ අදල වෘත්තීයකරුවෙකු (වඩු කාර්මික) වශයෙන් අවුරුදු 6 කට නොඅඩු සේවයක් සහිතව අදල වෘත්තීයකරුවෙකු වශයෙන් අවුරුදු 10 කට නොඅඩු සේවයක් තිබිය යුතුයි. (සහතික පත් මගින් සනාථ කළ යුතුයි).

සටහන.—එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තිකයෙකු ලෙස කළ සේවය පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

(ඈ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තව සිටිය යුතුයි.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක් ම සූදනම් විය යුතුය :—

(අ) ලැබූ ඉහළම අධ්‍යාපන සහතිකය.

(ආ) උප්පැන්න සහතිකය.

(ඇ) ලබා ඇති වෘත්තීය හා/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) 4 වැනි ඡෙදයේ (ඇ) අනුඡෙදය යටතේ සඳහන් වන පිළිගත් ආයතනයන්හි පූර්වසේවය පිළිබඳ සහතික.

(ඉ) සිංහලෙන් හා/හෝ දෙමළෙන් සමත්වූ ඉහළම විභාගය දක්වෙන සහතිකය.

(ඊ) චරිත සහතික දෙකක්—මින් එකක් ග්‍රාම සේවකගෙන් විය යුතුයි.

සටහන.—(i) ලියකියවිලිවත්, ලියකියවිලිවල පිටපත්වත් අයදුම්පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

6. අයදුම්කරුවන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත් තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ නමටද එවිය යුතුය. නියමිත දිනට ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණයක් ඉදිරිපත් කළ හොත් පමණක් එසේ ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් බාර ගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡෙදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍යසේවා තනතුරුවලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත් බාර ගන්නා අවසාන දිනය පසුවී දින 21 ක් ඇතුළත ඉල්ලුම් පත ලැබුණ බවට ලිපියක් නොලද හොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සළකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 8 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
සාමාන්‍ය පරිපාලන ශාඛාවේදී ය.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

(මෙම ඉල්ලුම් පත්‍රය අඟල් 8½ × 13½ ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ යුතුය).

**I වැනි පන්තියේ වඩු කාර්මික තනතුර සඳහා ඉල්ලුම් පත්‍රයයි**

**සාප/5/90**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ස්ථිර ලිපිනය :————.
3. ගම් ප්‍රදේශය :————.
4. අයදුම් පත් බාර ගන්නා අවසාන දිනට නියම වයස :————.
   උපන් දිනය :————.
5. උපන් ස්ථානය —
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.
6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග : ————.
7. අධ්‍යාපන සුදුසුකම් :—
   (i) සාමාන්‍ය :————.
   (ii) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකවල විස්තර :————.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත්වී ඇති උසස්ම විභාගයේ විස්තර :————.
8. ත්‍රිවේදනයේ 4 වැනි ඡෙදයේ (ඇ) අනු ඡෙදය යටතේ සේවා විස්තර : (සේවය කළ ආයතන, සේවා කාලයන්, දරූ තනතුර සඳහන් කළ යුතුයි.) :————.
9. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.
10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම්, (අ) දිනය (ආ) නඩු නොම්මරය (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.
11. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණද ? :————.
12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.
13. සේවා මුක්ත හටයෙක් වී නම් (අ) සේනාංකය (ආ) නිලය (ඇ) සේවයට බැඳුනු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.
14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකී රක්ෂා—
    (i) දරන ලද තනතුර :————.
    (ii) නියුක්තව සිටි වකවානුව :————.
    (iii) අස්වීමට හේතුව :————.
15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම්—
    (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර :————.
    (ආ) සේවයේ යෙදී සිටි කාලය :————.
    (ඇ) සේවය නතර කිරීමට හේතු :————.
16. දැනට යෙදී සිටින රක්ෂාව :
    (i) ආයතනය :————.
    (ii) තනතුර හා ශ්‍රේණිය :————.
    (iii) ඊට පත් වූ දිනය :————.
    (iv) විශ්‍රාම වැටුප් සහිතද ? තාවකාලික හෝ අනියම් ද :————.
    (v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය : ————.
    (vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය :————.
17. වෙනත් කරුණු :————
18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරාගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මගේ අංකය :
ඔබේ අංකය : සාප/5/90

අධ්‍යා. සං./ලේ.,

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය.* මොහු තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.*

ඉල්ලුම් පත්‍රයේ සඳහන්...........අංකිත ඡෙදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

..........................................
..........................................

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය :————.

දිනය :————.

*අදාල නැති කොටස් කපා හරින්න.

8–868/3—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

සාප/5/115.

### අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

**ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික තනතුර**

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික තනතුර සඳහා අයදුම් පත් කැඳවමින් 1969 ජනවාරි මස 16 වැනිද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

ස්ථිර ලේකම්,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

1969 අගෝස්තු මස 8 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
අධ්‍යාපනාය පරිපාලන ගබඩාවේදී.

8–868/4—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

### රාජකීය ලංකා ගුවන් හමුදාව

**වින් නඹු තනතුරක්**

කටුනායක ගුවන් හමුදා රෝහලේ එක් තනතුරක් සඳහා තෝරා පත් කිරීම පිණිස අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම් පත් මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයෙහි ලියා 1969.8.31 වෙනිදාට පෙර සිවිල් පාලක නිලධාරී, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානය, තැ. පෙ. 594, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. අයදුම් පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වින් නඹු තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—තනතුරට අයත් වැටුප අවුරුද්දකට රු: 696—30×11—12×1—රු: 1,038. පඩිය අවුරුද්දකට රු: 906 සහ රු: 996 වන විට කාර්යක්ෂමතා බාධකයන්ට මුහුණ දිය යුතු වෙයි.

3. **වයස් සීමාව.**—අයදුම්කාරියන් 1969.8.31 වන දිනට වයස අවුරුදු 20 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 35 ට වැඩි නොවිය යුතුයි.

4. **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—සෑම අයදුම්කාරියකටම මෙහි පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) (i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ
(ii) දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුලුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ
(iii) ඊට සමාන වෙනත් විභාගයකින් සමත්ව සිටීම
(ආ) වෛද්‍ය ආඥා පණතේ (105 වැනි අධිකාරය) 7 වැනි කොටස යටතේ ලියා පදිංචි වූ වින් නඹු සේවිකාවක් විය යුතුය.
(ඇ) මනා චරිතයකින් ද සෞඛ්‍යයෙන් ද යුක්ත වී සිටීම

(ඇ) රජයේ හෝ පෞද්ගලික රෝහලක වින්නඹු මාතාවක් ලෙස අඩු වශයෙන් අවුරුදු දෙකක් වත් පළපුරුද්දක් තිබීම.

5. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර තාවකාලික සහ විශ්‍රාම වැටුප් රහිත්‍ය. තෝරා ගනු ලබන අයදුම්කාරියට සේවයේ යෙදී සිටින අවස්ථාවලදී ඇඳීමට අවශ්‍ය නිල ඇඳුම් සපයනු ලැබේ.

6. **සේවා කොන්දේසි.**—මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් පිළිබඳව පොදු කොන්දේසි බලනු මැනවි.

7. අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත් වලට මෙහි පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් නොව පිටපත් අමුණා එවිය යුතුයි.

(1) උප්පැන්න සහතිකය.

(2) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය.

(3) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍රය.

(4) අයදුම්කාරියගේ චරිතය හා හැකියාවන් පිළිබඳ ළඟදී ලබාගත් චරිත සහතික තුනක්.

සැ. යු—(1) දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කාරියන් විසින් චරිතය සහ හැක්යාවන් පිළිබඳ මෙම චරිත සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැති නමුත් මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් සහතිකයක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

(ii) එම සහතික පත්‍රවල සහ චරිත සහතික පත්‍රවල පිටපත් ආපසු එවන්නේ නැත.

8. අයදුම් පත් මට හෝ මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසිම නිලධාරියෙකුට පුද්ගලිකව නොඑවිය යුතුයි. පුද්ගලිකව එවනු ලබන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. සෑම අතින්ම මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඒ. සී. අරසරත්නම්,
සිවිල් පාලක නිලධාරී හා ගණකාධිකාරී,
ගුවන් හමුදා අණදෙන නිලධාරී වෙනුවට.

මූලස්ථානය, රා. ලං. ගු. හ.,
තැ. පෙ. 594, කොළඹ,
1969 අගෝස්තු මස 6 වැනි දින.

**වින්නඹු තනතුර සඳහා අයදුම් පත්‍රය**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————

(2) ලියුම් ලැබෙන පිළිවෙල :————

(3) උපන් දිනය හා 1969.8.31 වෙනිදාට වයස :————.

(4) ජාතිය (උත්පත්තියෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියෙක්ද කියා සඳහන් කරන්න. ලියා පදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියෙක් නම් ලියා පදිංචි වූ අංකය සඳහන් කරන්න.) :————.

(5) සිවිල් තත්ත්වය :————.

(6) අධ්‍යාපනික සුදුසුකම් :————.

(7) වෘත්තීය සුදුසුකම් :————.

(8) පාසැලෙන් අස්වූ කාලයේ සිට කළ රැකියා පිළිබඳ විස්තර :————.

(කාල ක්‍රමානුගත පිළිවෙලට) :————.

සේවා යෝජකයාගේ නම සහ ලිපිනය :————.

සේවා කාලය :————, සිට————, දක්වා————.

දරණ තනතුර :————.

(9) ඔබ කෙදිනක හෝ උසාවියකින් දඬුවම් ලබා හෝ ඇප බැඳනු ලැබ සිටිද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

(10) ඉදිරිපත් කර ඇති චරිත සහතික පත්‍ර ලබාගත් අයගේ නම්, ලිපිනය සහ තනතුර :————.

————,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

8–746—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස අමාත්‍යාංශය

### II වැනි ශ්‍රේණියේ සැලසුම්-ලිපිකරු තනතුර

මෙම අමාත්‍යාංශයේ II වැනි ශ්‍රේණියෙහි සැලසුම්-ලිපිකරු තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත සඳහන් කර ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගනු ලැබූ ඉල්ලුම් පත්‍ර 1969 සැප්තැම්බර් මස 8 වැනි දින හෝ එදිනට පළමුව මා වෙත ලැබිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරේ වාර්ෂික වැටුප රු. 1,260 න් පටන් ගෙන රු. 120 වාර්ෂික වැඩිවීම් 21 කින් යුක්තව රු. 3,780 තෙක් නඟී. රු. 2,820 පළමුව කාර්යක්ෂමතා කඩඉමකි.

3. **සේවා කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලැබූ අයදුම්කරු පත් කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත්වය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම තමාට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ලංකාවේ රටවැසියකු බවට,

(ආ) 1969 සැප්තැම්බර් 8 දින දී වයස අවුරුදු 21කට නො අඩු හා 35කට නො වැඩි අයකු බවට (දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත වූවන් කෙරෙහි උපරිම වයස් සීමාව අදාල නොවේ.),

(ඇ) විශිෂ්ය චරිතයකින් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බවට,

(ඈ) (1) මූමූලික ගණිතය විෂයක් වශයෙන් ගෙන ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය සමර්ථ කොට ඇති බවට හෝ

(2) දෙකකට නොවැඩි වාර ගණනකදී භාෂාව හා මූලික ගණිතය ඇතුළුව විෂයයන් 6කින් පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය) සමර්ථ කොට ඇති බවට, සහ

(3) ඊට සම හෝ උසස් විභාගයක් සමර්ථ කොට ඇති බවට සහ

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ (සැලසුම්කරු පාඨමාලාව) අවුරුද්දක පූර්ණ කාලීන පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම සහ අවුරුද්දක ආධුනිකත්ය ඇති බවට, හෝ

(ආ) අවුරුද්දක ආධුනිකත්වයක් සහිතව ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකවරුන් පිළිබඳ අධ්‍යයන මාලාව හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් පිළිබඳ අධ්‍යයන මාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයකු බවට, හෝ

(ඇ) ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ වරලත් ඉංජිනේරුවන් හෝ වරලත් ගෘහ නිර්මාණ ශිල්පීන් යටතේ අවුරුදු 4 ක නිත්‍ය ආධුනිකයකු වශයෙන් සේවය කර තිබීම සහ අවුරුදු 3 ක කාලයක් ලංකා කාර්මික විද්‍යාලයේ විවිධ ශ්‍රේණීන්හි පස්වරු පන්ති වලට පැමිණි අයකු බවට (සැලසුම්කරුවන් පිළිබඳ උපදෙස් දීම සඳහා පිහිටුවන ලද අන්තර් දෙපාර්තමේන්තු මණ්ඩලයේ හා භාණ්ඩාගාරයේ අනුමැතියට යටත් ව. මෙම සුදුසුකම් ඇති අපේක්ෂකයෙකු වැටුප් ක්‍රමයෙහි වර්ෂයකට රු. 1,620 ක වැටුපකට නොවැඩි පියවරකට පත් කිරීම සඳහා සලකා බලනු ඇත.), හෝ

(ඈ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි තැනීම පිළිබඳ දෙවැනි පෙළ පරීක්ෂණය 1947 ට පෙර සමත්ව, ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ සැලසුම්කරුවකු වශයෙන් ඇවුරුද්දකට වැඩි කාලයක් සේවයෙහි යෙදී සිටි බවට, හෝ

(ඉ) ප්‍රසිද්ධ ඉංජිනේරු ව්‍යාපාර ආයතනය හෝ වරලත් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතේ හෝ සැලසුම්කරුවකු වශයෙන් අවුරුදු 5 ක් සේවය කොට ඇති බවට.

**සටහන.**—ජී. සී. ඊ. (සාමාන්‍ය පෙළ) හෝ ඒ හා සමාන පරීක්ෂණයකදී රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව යන විෂයයන් ගෙන් සම්මාන සාමාර්ථ ලබා ඇති නියමිත සුදුසුකම් ඇති අපේක්ෂකයනට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. අපේක්ෂකයන් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඇමිණිය යුතුය :—

(1) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථාවන්හි සඳහන් කටයුතු සඳහා නිකුත් කර ඇති සහතික භාරගනු නොලැබේ),

(2) ලබා ඇති උසස්තම සුදුසුකම් පිළිබඳ සහතික.

(3) ලබා ඇති වෘත්තීය හා කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික, හා

(4) ඉල්ලුම්කරුගේ සුදුසුකම්, චරිතය, හැකියාව සහ තනතුරට ඇති සුදුසුකම් පිළිබඳව මෑතදී ලබාගත් සහතික තුනක් (දැනට රජයේ සේවයේ නියුක්ත අපේක්ෂකයන්, ඉහත සඳහන් අනුච්ඡේදය යටතේ චරිත සහතික ඉදිරිපත් කළ යුතු නොවේ).

සැ. යු.—මේ සහතිකවල පිටපත් ආපසු එවනු නොලැබේ. ඉල්ලුම් කරු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවහොත් ද කැඳවනු ලැබූ විටද පමණක් මේ සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

6. රාජ්‍ය සේවයෙහි නියුක්ත, සුදුසුකම් ඇති අපේක්ෂකයන් තම ඉල්ලුම් පත්‍ර තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එබඳු ඉල්ලුම් පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා තම දෙපාර්තමේන්තු ප්‍රධානයා වෙත නියමිත දිනට පළමුව භාරදී තිබී ප්‍රමාදය ගැන පිළිගත හැකි හේතූන් සඳහන් කරමින් ඒ ඉල්ලුම් පත්‍ර පිළිගැනීම අදාල දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් නිර්දේශ කළහොත් පමණි.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් කර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල වන සාමාන්‍ය කොන්දේසි බලන්න.

8. ඉල්ලුම් පත්‍ර හෝ තනතුර හා සම්බන්ධ වෙනත් ලියකියවිලි මෙම අමාත්‍යාංශයේ කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව නොව, කොළඹ 7, විජේරාම මාවතේ, අංක 123 හි, විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, යන ලිපිනයට එවිය යුතුය.

ඩබ්ලිව්. ඩී. වී. මහනත්තිල,
ස්ථිර ලේකම්,
විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස අමාත්‍යාංශය.

1969 අගෝස්තු 2 දින,
කොළඹ 7, විජේරාම මාවතේ, අංක 123 හි,
විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස අමාත්‍යාංශයේ දීය.

## විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස අමාත්‍යාංශය

### II වැනි ශ්‍රේණියේ සැලසුම්-ලිපිකරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. නම :—
   - (අ) පෙළපත් නම :————.
   - (ආ) අනික් නම් :————.
2. ලිපිනය :—
   - (අ) පදිංචි ස්ථානය :————.
   - (ආ) රාජකාරි කරන ස්ථානයේ :————.
3. උපන් දිනය :————.
4. 69. 9. 8 ට වයස : අවුරුදු :——, මාස :——, දින :——.
5. විවාහකද, අවිවාහකද යන වග :————.
6. ජාතිකත්වය :—
   - (අ) පරම්පරාගත හෝ ලියාපදිංචි වූ ලංකා රටවැසියකුද යන වග :————.
   - (ආ) පරම්පරා ගත ලංකා රටවැසියකු නම්, පහත සඳහන් අය උපන් ස්ථානය සඳහන් කරන්න :—
     1. ඉල්ලුම්කරු :————.
     2. ඉල්ලුම්කරුගේ පියා :————.
     3. ඉල්ලුම්කරුගේ පිය පාශ්ර්වයේ මුත්තා :————.
     4. ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තා : ————.

7. අධ්‍යයන සහ වෙනත් සුදුසුකම්.—
   - (අ) (i) ශාස්ත්‍රීය සුදුසුකම් (සාමාර්ථ ලත් ඉහළම පරීක්ෂණයත් පරීක්ෂණය පැවැත්වූ දිනයත් පරීක්ෂණයේදී සාමාර්ථය ලත් විෂයයනුත් සඳහන් කරන්න.) : ————.
     - (ii) ඔබ ජී.සී.ඊ. (සාමාන්‍ය පෙළ) පරීක්ෂණයේදී හෝ ඒ හා සමාන හෝ ඊට උසස් පරීක්ෂණයකදී මූලික ගණිතයෙන් සාමාර්ථය ලබා තිබේද ? :————.
     - (iii) ඔබ ජී.සී.ඊ. (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ ඒ හා සමාන හෝ ඊට උසස් පරීක්ෂකයකදී පහත සඳහන් විෂයවලට සම්මාන සාමාර්ථය ලබා තිබේද ? :————.
   - (ආ) රසායන විද්‍යාව :————.
   - (ඇ) භෞතික විද්‍යාව :————.
   - (ඇ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් :————.
     - (i) සාමාර්ථය ලත් ඉහළම විභාගය (දිනයත් කාර්මික විද්‍යාලය හෝ විශ්ව විද්‍යාලයත් සඳහන් කරන්න.) :————.
     - (ii) ප්‍රායෝගික පුහුණුව (ආධුනිකත්වය) :—

| සිට තෙක් | ව්‍යාපාර ආයතනයේ හෝ ආයතනයේ නම |
|---|---|
| ........................ | ........................ |
| ........................ | ........................ |

8. ආධුනිකත්වය සම්පූර්ණ කළ දින සිට රක්ෂාව : (දිනය, සේවා යෝජකයාගේ නම සහ දැරූ තනතුර ඇතිව කෙටියෙන් විස්තර දක්වන්න) :————.

9. කිසියම් දිනක රජය යටතේ රක්ෂාවක් කළේද යනවග සඳහන් කරන්න. එසේ කළේ නම්, අස්වූ දිනයත්, අස්වීමට හේතූත් ඇතිව එසේ වැඩ කළ දෙපාර්තමේන්තුව/හෝ දෙපාර්තමේන්තු සඳහන් කරන්න :————.

10. විශේෂ සුදුසුකම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

11. චරිත සහතික දුන් අයගේ නම් සහ පදවි නාම :————.
    - (i) ————.
    - (ii) ————.
    - (iii) ————.

12. සපරාධි වරදක් ගැන අධිකරණයකින් වරදකරු කරනු ලැබුවේද යන වග සඳහන් කරන්න. එසේ නම්, වරදේ හා දඬුවමේ විස්තර සඳහන් කරන්න :————.

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු සැබෑ නිවැරදි ඒවා බවත්, මෙහි සඳහන් කිසියම් තොරතුරුක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා පත් කර ගැනීමට පළමුව අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බවත් තෝරා පත් කර ගැනීමෙන් පසුව ඒ බව දැන ගැනීමට ලැබුනහොත් කිසිම වන්දියක් නොමැතිව මා තනතුරෙන් පහ කරනු ලැබීමට ඉඩ ඇති බවත් මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8–675—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ඉංජිනේරු හා කාර්මික අධ්‍යාපනය සඳහා බ්‍රිතාන්‍යයේ විශ්ව විද්‍යාලයකට හෝ වෙනත් කාර්මික අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වී පෞද්ගලික වියදමින් ඉගෙනීමට අපේක්ෂා කරන ලාංකික ශිෂ්‍යයන්ගේ අයදුම්පත් (1970 සැප්තැම්බර්-ඔක්තෝම්බර් අධ්‍යයන වර්ෂය)

ඉංජිනේරු හා කාර්මික අධ්‍යාපනය සඳහා බ්‍රිතාන්‍යයේ විශ්ව විද්‍යාලවලට හා වෙනත් කාර්මික අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වී පෞද්ගලික වියදමින් ඉගෙනීමට බලාපොරොත්තු වන සිසුන්ගේ අයදුම්පත් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ විදේශ ආයතන ශාඛාවෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පුරවා පිටපත් 3 කින් යුතුව එවිය යුතුය.

2. අධ්‍යාපනික සුදුසුකම්.—

(අ) විශ්ව විද්‍යාලයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු වේ :—

අ. පො. ස. (සා. පෙ. විභාගයේ විෂයයන් හයක් එක්වරකදී සමත් වී සිටිය යුතුය. එම විෂයයන්ගෙන් දෙකක් භාෂාවන් විය යුතු අතර, එයින් එක භාෂාවක් ඉංග්‍රීසි විය යුතුය. ඉංග්‍රීසි පිළිබඳ සම්මාන සාමාර්ථය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. අනික් විෂයයන් හතරින් තුනක් ගණිතය ඇතුළු විද්‍යා විෂයයන් විය යුතුය. ඊට අමතරව අ. පො. ස. (උ. පෙ.) විභාගයේදී, තමන් හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාව අදාල විද්‍යා විෂයයන් තුනක් ද සමත් වී තිබිය යුතු වේ.

(ආ) වෙනත් කාර්මික ආයතනයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයන්ට පහත සඳහන් අඩුම සුදුසුකම් තිබිය යුතු වේ :—

අ. පො. ස. (සා.පෙ.) විභාගයේ විෂයයන් හයක් එක්වරකදී සමත් විය යුතුව ඇත. එම විෂයයන්ගෙන් දෙකක් භාෂාවන් විය යුතු අතර, එයින් එකක් ඉංග්‍රීසි භාෂාව විය යුතුය. එහි ද සම්මාන සාමාර්ථය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. අනික් විෂයයන් හතරින් තුනක් ගණිතය ඇතුළු විද්‍යා විෂයයන් විය යුතුය. (උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා අ. පො. ස. (උ. පෙ.) විභාගයේ සහතිකයක් ද සමහර අධ්‍යාපනික ආයතන වලට අවශ්‍ය බව සැලකිය යුතුයි.)

3. සියළුම ඉල්ලුම් පත් සමග පහත සඳහන් ලියවිලි ද අමුණා එවිය යුතුයි :—

(i) සාමාර්ථය ලබා ඇති විභාගවල මුල් සහතිකවල ඡායා පිටපත් හෝ විභාග කොමසාරිස් විසින් නිකුත් කර ඇති සහතික ලිපියක් (මුල් සහතික පත්‍ර නිකුත් කර ඇත්තේ සිංහලෙන් හෝ දෙමළෙන් නම් ඒවායේ සහතික කළ ඉංග්‍රීසි පරිවර්තනයක් ද ඇතුළත් කළ යුතු වේ.)

(ii) පාස් පෝට් ප්‍රමාණයේ ඡායා රූප පිටපත් තුනක් ;

(iii) බ්‍රිතාන්‍යයේ පාඨමාලාවක් හැදෑරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් සිටින බවට වෛද්‍ය සහතිකයක් ;

(iv) "එක්ස්රේ" පරීක්ෂණය පිළිබඳ වාර්තාවක් ;

(v) චරිත සහතික දෙකක් (මුල් පිටපත්) එයින් එකක් තමන් අන්තිමට ඉගෙනීම ලැබූ පාසලේ හෝ විද්‍යාලයේ ප්‍රධානියාගෙන් විය යුතුයි.

(vi) තමන් හැදෑරීමට අදහස් කරන පාඨමාලාව සඳහා අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම් ප්‍රමාණවත් බවට හා ඇතුළත් වීමට බලාපොරොත්තු වන ආයතනයේ ඉඩකඩ ඇති බවටත් එම ආයතනයෙන් නිකුත් කර ඇති ලිපියක්.

(vii) තමන් හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාලාව සඳහා විදේශ විනිමය මුදා හරින බවට විනිමය පාලක විසින් නිකුත් කර ඇති ලිපියක්.

(viii) තමන්ගේ ආයතන ගාස්තු හා වෙනත් වියදම් නොකඩවා ගෙවන බවට පොරොන්දු වී සිටින ඔහුගේ පියා, මව හෝ භාරකරුට අඩු තරමින් රු. 30,000 ක වටිනා දේපළ තිබෙන බවට එම අය පදිංචි පළාතේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැන විසින් නිකුත් කර ඇති සහතිකයක්. (එම සහතිකය සඳහා ප්‍රා. ආ. නි. තැනට ගාස්තුවක් ගෙවීම අවශ්‍ය නොවේ.)

4. ඉල්ලුම්පත මෙම අමාත්‍යාංශයෙන් අනුමත කිරීමෙන් පසුව ඒ සඳහා රු. 150 ක මුදලක් අය කරනු ලැබේ. නමුත් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කෙරෙන විශ්ව විද්‍යාලයෙන් හෝ අධ්‍යාපනික ආයතනයෙන් හෝ එය පිළිගන්නා බවට පොරොන්දුවක් මෙම කාර්යාලයෙන් දෙනු නො ලැබේ.

5. ඉල්ලුම්පත පිළිගනු ලැබීමෙන් පසුව, පාඨමාලාව අවසන් වූ වහාම ආපසු ලංකාවට පැමිණීමටත්, අවුරුදු 5 ක් ලංකාවේ සේවය කිරීමටත් එහි අවුරුදු පහක් සේවය කිරීමටත් පොරොන්දුවන ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් කළ යුතුය.

6. (අ) විශ්ව විද්‍යාල සඳහා එවන ඉල්ලුම්පත් 1969 ඔක්තෝබර් 15 වෙනි දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබිය යුතුයි.

(ආ) වෙනත් අධ්‍යාපනික ආයතනයක් සඳහා එවන ඉල්ලුම් පත් 1970 ජූලි මස 1 වෙනි දින තෙක් භාර ගනු ලැබේ.

7. විශ්ව විද්‍යාලයන්ට ඇතුළත් වීමේ (යූ. සී. සී. ඒ.) ඉල්ලුම් පත් හා විස්තර අඩංගු අත්පොත රු. 6.50 ක් ගෙවා මේ අමාත්‍යාංශයේ විදේශ ආයතන ශාඛාවෙන් ලබා ගත හැකිය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 7 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

8–797—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/4/76.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1970 එක්සත් රාජධානි පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

1970 ඔක්තෝබර් මස ආරම්භ වන අධ්‍යයන වර්ෂයේ සිට එක්සත් රාජධානියේ උසස් අධ්‍යාපන ආයතනයන්හි ඉගෙනීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

ලාංකික සිසුන්ට එක්සත් රාජධානියේ උසස් පාඨමාලා අනුගමනය කිරීමට හෝ පර්යේෂණ කටයුතුවල යෙදීමට හෝ අවස්ථාවක් ලබා දීම ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ අදහසයි. ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබන්නේ විශ්ව විද්‍යාලයන්හි හෝ ශිල්පායතනයන්හි හෝ පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහාය. අධ්‍යාපන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සීමාවක් නැත (ප්‍රථම උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් භාරගනු නොලැබේ.)

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂ්‍යය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂ්‍යය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු යි. එවැනි අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම්පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂ්‍යය 3.**—එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම්පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් වර්ෂ දෙකක් වේ. එහෙත් එක් අධ්‍යයන වර්ෂයක් සඳහා පමණක් ශිෂ්‍යත්වයක් පිරිනැමීමට ද ඉඩ තිබේ.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ එක්සත් රාජධානි බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවක දී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) 1970.10.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩු විය යුතුයි.

(iii) යටත් පිරිසෙයින් හැදෑරීමට අදහස් කරන පාඨමාලාවට උචිත (පිළිගත් විශ්ව විද්‍යාලයයක) මදවැනි පෙළ (ඉහළ ශ්‍රේණියේ) උපාධියක් තිබිය යුතුය. එහෙත්, වෛද්‍ය උපාධි සම්බන්ධයෙන් පමණක් තිබිය යුතු අවම සුදුසුකම පිළිගත් විශ්ව විද්‍යාලයයක දෙවැනි පෙළ උපාධියකි. (ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම්පත් භාර ගනු නොලැබේ.)

(iv) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

**සංලක්ෂ්‍යය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970.10.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්වය සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2.**—එසේම, තාවකාලික තනතුරු දරණ හෝ ස්ථිර තනතුරු දරණ නමුත් තනතුරේ ස්ථිර කරනු නො ලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) බ්‍රිතාන්‍ය බලා යාමේ සහ ශිෂ්‍යත්වය අවසානයේ ආපසු පැමිණීම සඳහා ගමන් වියදම් (ප්‍රදානයන් ලැබීමට කලින් ආරම්භ කරන ලද ගමන් සම්බන්ධයෙන් වියදම් ආපසු ගෙවනු නොලැබේ.)

(ආ) අනුමත කළ ඉගැන්වීමේ ගාස්තු, රසායනාගාර ගාස්තු හා විභාග ගාස්තු.

(ඉ) මසකට පවුම් 68 බැගින් පෞද්ගලික යැපීම් දීමනාවක්.

(ඊ) පොත් හා උපකරණ සඳහා වර්ෂයකට පවුම් 30 ක දීමනාවක් හා යෝග්‍ය වන අවස්ථාවන්හිදී, ප්‍රබන්ධය ටයිප් කිරීම හා බැඳීම සඳහා පවුම් 25 දක්වා දීමනාවක්.

(උ) බ්‍රිතාන්‍ය ඇතුළත අනුමත කළ ගමන් වියදම් සඳහා වර්ෂයකට පවුම් 25 දක්වා දීමනාවක්.

(ඌ) උණුසුම් ඇඳුම් සඳහා නිර්දේශ කරනු ලබන සර්ම කලාපීය රටවලින් පැමිණෙන ශිෂ්‍යත්වධාරීන් සඳහා පවුම් 50 ක මූලික දීමනාවක්.

(ඔ) භායඹාවන් කැටුව එන පිරිමි ශිෂ්‍යත්වධාරීන් සඳහා මසකට පවුම් 27 ක විවාහ දීමනාවක් හා තමා සමග බ්‍රිතාන්‍යයේ සිටින වයස අවුරුදු 16 ට අඩු පළමුවැනි, දෙවැනි හා තුන් වැනි දරුවන් සඳහා පිළිවෙළින් මසකට පවුම් 6, පවුම් 4 හා පවුම් 3 සිලිම් 10 ක දීමනා. භායඹාව පඩි ලබන රැකියාවක යෙදී සිටි නම් හෝ ශිෂ්‍යත්වයක් ලබා සිටී නම් මේ දීමනා ගෙවනු නොලැබේ (මේ දීමනා එක්සත් රාජධානි ආදායම් බද්දෙන් නිදහස් ය.)

**සංලක්ෂ්‍යය.**—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5\. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6\. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් එක්සත් රාජධානිය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියළුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම් ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7\. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් එක්සත් රාජධානියේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුයි.

8\. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරණ තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9\. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10\. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාම යෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළ හොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11\. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12\. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13\. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14\. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම්පත්, 1969.8.29 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

15\. සෑම අයදුම්පතක් සම්බන්ධයෙන් ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නො ලැබේ.

16\. රජයේ සේවකයින් විසින් එවන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්වවිද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතා සපුරාලිය යුතුය.

17\. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාර ගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුලත අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම්දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 අගෝස්තු මස 8 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී ය.

8–866—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### ධීවර සහකාර (කාර්මික) තනතුර

ධීවර දෙපාර්තමේන්තුවේ ධීවර සහකාර (කාර්මික) තනතුර සඳහා පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 1969 අගෝස්තු මස 29 වැනි දින හෝ ඊට පෙර භාරගනු ලැබේ.

2\. **වැටුප.**—වර්ෂයකට රුපියල් 3,360 න් පටන්ගෙන රුපියල් 360 ක වාර්ෂික වැඩිවීමක් ඇතිව රුපියල් 8,400 න් අවසන් වන වැටුප් ක්‍රමයක් මේ තනතුරට හිමිය.

3\. **සේවා කොන්දේසි.**—තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. පත්වීම පිළිබඳ ආධුනික කාලය තුන් වර්ෂයක් වේ. ස්ථිර නිලධාරියකු තෝරා ගතහොත් පටන් ගැන්මේදී නියමිත කාල පරිච්ඡේදයකට වැඩ බැලීමට පත් කරනු ලැබේ.

4\. නිලධාරියා පත් කිරීමේ දිනයේ සිට අවුරුදු හතරක් ඇතුලත කදී පොදු සේවා කොමිසමේ නීති රීති මූල්‍ය ව්‍යවස්ථා, කාර්ය සංවිධාන ව්‍යවස්ථා, ධීවර ආඥාපනත සහ රෙගුලාසි පිළිබඳව පරීක්ෂණයකින් සමර්ථ විය යුතුයි. අවුරුදු හතර තුළදී එම නිලධාරියාට මේ පරීක්ෂණයෙන් සමර්ථවන්නට නොහැකි වුවහොත් ඔහුගේ වාර්ෂික වැටුප් වැඩිවීම හිග හිටවනු ලැබේ. ඊට පසුව පරීක්ෂණයෙන් සමත්වනතුරු වැටුප් වැඩිවීම ප්‍රමාද කරනු ලැබේ.

5\. **මුවමනා සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි:—

(i) 1969 අගෝස්තු මස 29 වැනිදාට වයස අවුරුදු 22 ට නොඅඩු බවට හා අවුරුදු 35 ට වැඩි නොවන බවට, (රජයේ සේවයේ දැනට සිටින නිලධාරීන්ට මේ වයස් සීමා අදාල නොවේ).

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යා උපාධිය (යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පයේ දැනුම හා පළපුරුද්ද ලබා ඇති අයට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ).

හෝ

(iii) (1) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන්

හෝ

(ඇ) ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්වී සිටිය යුතුමය.

සහ

(ii) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා උපාධි යේ පළමුවැනි කොටස සමග අවුරුදු 8 ක ප්‍රායෝගික පළපුරුද්දක්,

හෝ

(ආ) ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ/හාඩි කාර්මික අභ්‍යාස ආයතනයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ විදුලි හා යාන්ත්‍රික සහතිකය සමග අවුරුදු 10 ක ප්‍රායෝගික පළපුරුද්දක්,

හෝ

(ඇ) ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ/කණිෂ්ඨ කාර්මික පාඨශාලාවන්හි යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සන්ධ්‍යා සහතිකය සමග අවුරුදු 12 ක ප්‍රායෝගික පළපුරුද්දක්,

හෝ

(ඈ) යාන්ත්‍රික බෝට්ටු තැනීම පිළිබඳ අවුරුදු 15 ක පළ පුරුද්දක් තිබීම. මෙයින් යටත් පිරිසෙයින් අවුරුදු 10 ක් පරිපාලන තත්ත්වයකින් විය යුතුයි.

හෝ

(ඉ) සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබිය යුතුය.

6. අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍රවලට පහත සඳහන් සහතික පිටපත් (මුල් සහතික නොවේ) ඇමිණිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාසැල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයන් සඳහා නිකුත් කරණ ලද සහතික පත් භාරගනු නොලැබේ.)

(ආ) උපාධිය හෝ අධ්‍යාපනික උසස්ම සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්, එයින් එකක් ඉගෙනීම පිළිබඳ අධ්‍යක්ෂ විද්‍යාලයේ ආචාර්ය හෝ මහාචාර්යවරයාගෙන් ලබා ගත්තක් විය යුතුයි.

(ඈ) වෘත්තීය සහතික පත්‍ර සහ/හෝ ශිල්පීය සුදුසුකම්.

(ඉ) සිංහල සහ/හෝ දෙමළ භාෂාවෙන් සමර්ථ වී ඇති උසස්ම විභාගයේ සහතික පත්‍රය.

7. ඉල්ලුම් පත්‍ර හෝ ඒවාට සම්බන්ධ වෙන ඕනෑම ලියවිල්ලක් එවිය යුත්තේ ධීවර අධ්‍යක්ෂ යන පදවි ලිපිනයට විනා, දෙපාර්ත මේන්තුවේ වෙන කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොවේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළවී ඇති රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම පිළිබඳ පොදු කොන්දේසි කියවා බලන්න.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
වැඩ බලන ධීවර අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 6 වැනිදා,
කොළඹ, ගාළුමුවදොර,
තැ. පෙ. 531,
ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

### අයදුම්පත් ආකෘති පත්‍රය

#### ධීවර දෙපාර්තමේන්තුව—ධීවර සහකාර (කාර්මික තනතුර)

1. සම්පූර්ණ නම :—
   (අ) පෙළපත් නාමය :————.
   (ආ) අනික් නම් :————.
2. ලිපිනය :————.
3. (අ) 1969 අගෝස්තු මස 29 දිනට නිවැරදි වයස :————.
   අවුරුදු :————. මාස :————. දින :————.
   (ආ) උපන් දිනය (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
4. (අ) අයදුම්කරුගේ උපන් ස්ථානය :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ උපන් ස්ථානය :————.
   (ඇ) පියාගේ පියා උපන් ස්ථානය :————.
   (ඈ) පියාගේ ආත්තාගේ උපන් ස්ථානය :————.
5. ලාංකික ද, ලාංකික බව ලබාගත් පිළිවෙළ :————.
6. අයදුම්කරු විවාහකද, අවිවාහකද භාර්යාව මළ පුරුෂයෙක් ද ? :————.
7. අධ්‍යාපනික ජීවිතය, පාඨශාලා හෝ විද්‍යාලයයන්ට ඇතුළු වූ සහ අස්වූ දිනයන්, සමත්වූ ප්‍රසිද්ධ විභාගයන්, අන්තිමට සමත්වූ ප්‍රසිද්ධ විභාගයන්හිදී ගත් විෂයයන් :————.
8. අධ්‍යාපනය අවසන් කළ පසු කරන ලද රක්ෂාවල් :————. (දින සහ විස්තර දෙන්න)
9. ශිල්පීය සහ වෘත්තීය සුදුසුකම්, දින, විභාග හෝ පුහුණුව පිළිබඳ දක්ෂතාවය :————.
10. ක්‍රීඩා පිළිබඳ තොරතුරු :————.
11. ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම හා පරිකථනය පිළිබඳ දක්ෂතාවය :————.
12. දැනට කරන රක්ෂාව හා වේතනය :————.
13. අයදුම්කරු පුද්ගලික වශයෙන් දන්නා තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා පදවි (මොවුන්ගෙන් චරිත සහතික පත්‍ර ලබා නොගෙන තිබිය යුතුය) :————.
14. විශේෂ හිමිකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර, එනම්, මේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන තනතුරේ කටයුතු හා සමාන සේවයක් පිළිබඳ පළපුරුද්ද :————.
15. යුද්ධ සේවය කර ඇතොත් එය :————.
16. වෙනත් කරුණු :————.

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් දී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි යම් කිසි තොරතුරක් අසත්‍යයැයි හෝ වැරදි යැයි මා පත් කිරීමෙන් පළමු සොයාගත හොත් මා තන තුරට නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු එය සොයා ගත හොත් මා රාජකාරියෙන් පහ කිරීමට එය හේතුවක් වෙන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–787—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### II වැනි ශ්‍රේණියේ සංස්කාරක තනතුරු

1969 ජූලි 25 වන දා නිකුත් වුණු අංක 14,864 දරණ ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි හා දෙමළ පරිවර්තනවල I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළවුණු දැන්වීමේ 4 වන ඡේදයේ ගණිතය (සිංහල) සහ සත්ව විද්‍යාව (සිංහල සහ දෙමළ) යන කොටස පහත සඳහන් අයුරු වෙනස් විය යුතු ය :—

**ගණිතය (සිංහල).**—ගණිතය පිළිබඳ විශේෂ උපාධියක් හෝ; ශුද්ධ ගණිතයත්, ව්‍යවහාරික ගණිතයත් සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතු ය.

**සත්ව විද්‍යාව (සිංහල සහ දෙමළ).**—සත්ව විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ; සත්ව විද්‍යාව සමග රසායන විද්‍යාව හෝ උද්භිද විද්‍යාව සහිත සාමාන්‍ය උපාධියක් හෝ තිබිය යුතු ය.

මේ වරද නිසා මුලින් අයදුම් පත් එවන්නට නොහැකිවුවන්ගේ අයදුම් පත් 1969.8.29 වන දා තෙක් බාරගනු ලැබේ.

සෙනරත් වණිගතුංග,
වැ. බ. කොමසාරිස්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

8–760—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### දෙවන පන්තියේ යන්ත්‍ර ශිල්පියා තනතුරු—යාන්ත්‍රික ඉංජිනේරු (ආයුධ මඩුව) අංශය

කොළඹ වරාය කොමිෂන් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරු (ආයුධ මඩුව) අංශයේ පුරප්පාඩු වී තිබෙන ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් "වරාය කොමසාරිස්, ඉංජිනේරු අංශය" යනුවෙන් ආමන්ත්‍රනාය කර, 1969.8.31 වැනි දින පස්වරු 4.30 ට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2. වැටුප් ක්‍රමය.—පළමු සය මස තුළ දිනකට රු. 2.30 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 750—42—රු. 1,296 දරණ වාර්ෂික වැටුප් ක්‍රමය හිමිවේ. රජයේ නීති රීති අනුව ජීවනාධාර දීමනා සහ විශේෂ ජීවනාධාර සහ ගෙවල් කුලී දීමනා ගෙවනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය.

3. තෝරාගනු ලබන අපේක්ෂකයින් සයමසක (6) දෛනික වැටුප් සේවා කාලයකින් පසු මාසික වැටුප් ක්‍රමයට මාරු කරනු ලැබේ. එවිට රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකත්වය හිමිවේ. පත්වීම තෙවසරක ප්‍රවාසන කාලයකට යටත් වනවා ඇත.

4. සුදුසුකම්.—

(i) වයස අවුරුදු 21 ට වැඩිවිය යුතුයි.

(ii) පිළිගත් ආයතනයක පුහුණු II වැනි ශ්‍රේණියේ (දෙවෙනි පෙළ) යන්ත්‍ර ශිල්පියා වශයෙන් අවුරුදු පහකට නොඅඩු කාලයක් සේවය කළ බවට සහතික ඉදිරිපත් කල යුතුයි.

(iii) කියවීමට හා ලිවීමට පිළිවන් විය යුතුයි.

(iv) සූක්ෂමමාන කියවීමට හා සකස් කිරීමට පිළිවන් විය යුතුයි.

(v) වෘත්තියට අදාලවන සියලුම ආයුධවල හා අනෙකුත් උප කරණවල නම් හා ඒවායේ සාමාන්‍ය නඩත්තුව පිළිබඳව දැනීමක් තිබිය යුතුයි. ඒවා කාර්‍යක්ෂම ලෙස භාවිත කිරීමට පිළිවන් විය යුතුයි.

(vi) ඔහුගේ වැඩවලට අදාලවන සියලුම සැලසුම් කියවීමට පිළිවන් විය යුතුයි.

(vii) ඔහු නියුක්ත විය යුතුවන යන්ත්‍රය දක්ෂ ලෙස ක්‍රියාකර වීමට පිළිවන් විය යුතුයි.

5. සෑම අයදුම්කරුවෙක්ම ඔහුගේ ඉල්ලුම්පත්‍රයට පහත දැක්වෙන සහතිකවල පිටපත් ඇමිනිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලඟදී ලබාගත් චරිත සහතිකයක්.

(ඇ) 4 වන ඡේදයේ (ii) සිට (vii) දක්වා විස්තර කරන ලද පළපුරුදුකම් පිළිබඳ සහතික.

6. අවශ්‍යවුවහොත් කෙටි දැන්වීමකින් පිට පළාත්වල වැඩට යාමට, සාමාන්‍යයෙන් වැඩ කරන කාලයෙන් පිටස්තර වැඩ කිරීමට සහ මුරෙන් මුර වැඩ කිරීමට සූදානම්ව සිටිය යුතුයි.

7. ඉල්ලුම්පත්‍ර හෝ මෙම තනතුරු සම්බන්ධයෙන් එවන සෑම ලිපියක්ම කරන සෑම විමසීමක්ම ඉදිරිපත් කළ යුත්තේ, " වරාය කොමසාරිස්, ඉංජිනේරු අංශය " කියා මිස, මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවන බව සැලකිය යුතුයි.

8. මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරුවන්ට ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීම් කිසිවක් නොගෙවන අතර, ඉල්ලුම්පත් ලැබුණු බව ද දන්වනු නොලැබේ.

9. මෙම අවශ්‍යතාවයනට අදාල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. රජයේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වැනි ඡේදයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි ඉල්ලුම්කරුවන්ගේ සැළකිල්ලට යොමුවිය යුතුයි.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1969.8.4 දින

### ආකෘති පත්‍රය

**දෙවන පන්තියේ යන්ත්‍ර ශිල්පියා තනතුරු—යාන්ත්‍රික ඉංජිනේරු— (ආයුධ මඩුව) අංශය**

1. සම්පූර්ණ නම :————

2 පෞද්ගලික ලිපිනය :————.

3. වයස සහ උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).

4. පළපුරුදුකම් පිළිබඳ විස්තර :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)

5. වෙනත් සුදුසුකම් පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6 —69.8.15 දින අංක 14,867 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ තිත්තවැලි ගන්දහේ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ තිත්තවැලි ගන්දහේ කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට අයදුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1969.9.15 වන දිනට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ එවිය යුතුයි :—

" දිසාපති, කච්චේරිය, කුරුණෑගල. "

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩි වීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කෝරළය තුළ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත් වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් සහ සේවකයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුවේ.

තී. බ. දිසානායක,
කුරුණෑගල දිසාපති.

969.8.7 දා,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දී ය.

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ තිත්තවැලි ගන්දහේ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිළි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද ? එසේ නම් එය පිළිබඳ විස්තර : ————.

9. තමන් සතු දේපොලවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිවී සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර: ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී උසාවියකින් දඬුවම් ලබා තිබේද ?

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8–818—69.8.15 දින අංක 14,867 දරණ ගැසට් පත්‍රය

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ගණකාධිකාරි තනතුරු

**සුදුසුකම් හා පළපුරුද්ද.**—අවුරුදු 5ක පළපුරුද්ද ඇති වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ සංස්ථා බල ලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ පිරිවැය හා වැඩ පිළිබඳ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු හෝ මෙම ආයතනවල (මධ්‍ය විභාගය හෝ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා (අවසාන) ලංකා විභාග සහතිකය ලබාගත්) රජයේ හෝ අර්ධ රජයේ හෝ පිළිගත් වෙළඳ ආයතනයක සහකාර ගණකාධිකාරි ලෙස අවුරුදු 7ක පළපුරුද්ද ඇති අයෙක් විය යුතුය. පිරිවැය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ. අතිරේක උසස් අධ්‍යාපනික සුදුසුකම් තිබීම සුදුසු වැටුපක් මත පිහිටුවීම සඳහා සලකා බලනු ලැබේ.

**වයස.**—අවුරුදු 30 සිට 45

**වැටුප් පරිමාණය.**—රු. $\frac{1,400—1,600}{4\times50}$ මාසික (සියලු දීමනා අඩංගු)

රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ දෙපාර්තමේන්තු හා රජයේ සංස්ථාවන්හි අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වන අතර, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා විධිවිධාන පනත යටතේ, රජයේ භාෂා ප්‍රතිපත්තියට අනුව දැනට පනවා ඇති හෝ මතු පනවන ලබන හෝ නියෝගයක් අනුව කටයුතු කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වාලච්චෙනෙහි හෝ දිවයිනේ පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කළ යුතුවනු ඇත.

පත්කිරීම සඳහා තෝරාගනු ලබන්නන් ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් පරිමාණයෙහි සුදුසු පියවරක තබනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල අයදුම්කරුවන්ගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් 1969.8.31 දිනට හෝ ඊට පෙර සභාපති තුමාට ලැබෙන සේ පහත ඇති ලිපිනයට එවිය යුතුය.

අයදුම් පත් තැපෑලෙන් ඉල්ලුම් කරන විට තමන්ගේ ලිපිනය සහිත මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුය.

මේ සඳහා ඉල්ලුම් කළ යුත්තේ අවශ්‍ය සුදුසුකම් ඇති අය පමණකි.

කේ. සී. තංගරාජා,
සභාපති,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367,
135, යුනියන් පෙදෙස,
කොළඹ 2, 1969.7.31.

8–827/1—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### III ශ්‍රේණියේ ආරක්ෂක සහකාර තනතුරු

**සුදුසුකම් හා පළපුරුද්ද.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අධ්‍යයන පොදු සහතිකය සහිතව, පොලිස් සේවාවේ හෝ සන්නද්ධ සේවාවක අවුරුදු තුනක පළපුරුද්ද. ගිනි නිවීමේ හා ගිනි වළක්වාලීමේ කටයුතු ගැන පළපුරුද්දක් හා ක්‍රීඩාමාධාරයන් ගැන දැනීමත් අමතර සුදුසුකමක් වනු ඇත.

**වයස.**—අවුරුදු 30—40 දක්වා

**වැටුප.**—රු. $\frac{280—350}{7\times10}$ මාසික (සියලු දීමනා අඩංගු)

රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ දෙපාර්තමේන්තු හා රජයේ සංස්ථාවන්හි සේවකයින් ඔවුන්ගේ අයදුම් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ පරිවාස/පරීක්ෂණ කාලය අවුරුදු තුනක්වනු ඇත. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනුවස්, දැනටමත් පනවා ඇති ව්‍යවස්ථා හෝ මෙයින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවන්ට හෝ අනුකූලව කටයුතු කළ යුතු වන අතරම, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතෙහි විධානයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නේ ය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වාලච්චෙනෙහි හෝ දිවයිනේ පිහිටි සංයුක්ත මණ්ඩලයේ වෙනත් ඕනෑම ආයතනයක හෝ නේවාසිකව කටයුතු කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත, වැටුප් පරිමාණයේ සුදුසු හිණක පිහිටුවනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්වල අයදුම්කරුවන්ගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් 1969.8.31 දිනට හෝ ඊට පෙර, මෙහි පහතින් දක්වා ඇති ලිපිනයට අනුව සාමාන්‍යාධිකාරී වෙතට ලැබිය යුතුය.

අයදුම් ආකෘති පත් තැපෑලෙන් ඉල්ලුම් කරන විට, තමන්ගේ ලිපිනය සහිත මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතු වේ.

අයදුම් කළ යුත්තේ අවශ්‍ය සුදුසුකම් ඇති අය පමණකි.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367,
135, යුනියන් පෙදෙස,
කොළඹ 2,
1969.7.29.

8–827/2—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ප්‍රමිති කාර්යාංශය

### සැලසුම්කරු තනතුර

ලංකා ප්‍රමිති, කාර්යාංශයේ ඉහත සඳහන් තනතුරට පත් කිරීම පිණිස නියමිත සුදුසුකම් ඇති ලාංකිකයින්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

**වයස :** අවුරුදු 35ට නොවැඩි නම් මැනවි.

**සුදුසුකම් :**

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙවතාවකට වැඩි නොවන වාර ගණනක දී විෂයයන් 6 කින් සාමාර්ථය ලත් අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය)

සහ

(ii) ලංකා කාර්මික විද්‍යාලයේ සැලසුම්කරු සහතිකය සහ සැලසුම්කරුවකු වශයෙන් අවුරුදු 2ක පළපුරුද්ද,

හෝ

ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ (කටුබැද්ද) හෝ හාඩි කාර්මික අභ්‍යාස ආයතනයේ (අම්පාරේ) හෝ සැලසුම්කරු සහතිකය සහ අවුරුදු 2 ක පළපුරුද්දක් තිබිය යුතුය,

සහ

(iii) සිංහලෙන් වැඩ කිරීමට හැකියාව.

චිත්‍ර ශිල්පය පිළිබඳ හැකියාව අමතර සුදුසුකමක් වනු ඇත.

**වැටුප් ක්‍රමය.**—රු. 380—රු. 20×6—රු. 500 (සියල්ල අඩංගු මාසික).

අවශ්‍ය අඩුම සුදුසුකම්වලට වඩා වැඩි සුදුසුකම් ඇති අයට යටකි වැටුප් ක්‍රමයේ පියවරක තැබීමේ සුදුසුකම් ඇත.

**අර්ථසාධක අරමුදලට දායක වීම්.**—සියයට 4ක් නිලධාරියාගෙන් හා සියයට 6ක් ලංකා ප්‍රමිති කාර්යාංශයෙන්.

තෝරා ගන්නා අය අවුරුදු 3ක ආධුනික කාලයකට යටත් වෙති.

පහත සඳහන් ආදර්ශ අයදුම් පත්‍රය අනුව තම අත් අකුරින් සකස් කළ ඉල්ලුම් පත්‍ර 1969 සැප්තැම්බර් 2 දින හෝ ඊට පෙර, අධ්‍යක්ෂ, ලංකා ප්‍රමිති කාර්යාංශය, 53, ධර්මපාල මාවත, කොළඹ 3 වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතු වේ.

**සැළකිය යුතුයි.**—ඉල්ලුම්පත් එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "සැලසුම්කරු තනතුර" යන්න සඳහන් කළ යුතු යි.

රජයේ සේවයේ හෝ සංස්ථාවල හෝ සිටින අය තම ඉල්ලුම් පත්‍ර එම දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවල හෝ ප්‍රධානීන් ගේ මාර්ගයෙන් එවිය යුතු අතර ඔවුන් තෝරා ගැනුණ හොත් නිදහස් කිරීමට එකඟ ඇයි දැන්විය යුතු ය.

තෝරා ගන්නා අය 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලු ම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පැනවෙන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කිරීමට එකඟ විය යුත්තා හ.

ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් ලිපි නොව) අමුණා එවිය යුතු ය: —

1. උප්පැන්න සහතිකය.

2. සුදුසුකම් පිළිබඳ සහතික.
3. ලඟදී ලබාගත් චරිත සහතික 2ක්.

ඉල්ලුම් පත්‍රය ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

අධ්‍යක්ෂ,
ලංකා ප්‍රමිති කාර්යාංශය,

7.8.69.

ආදර්ශ අයදුම් පත්‍රය

ලංකා ප්‍රමිති කාර්යාංශය

පුරප්පාඩු—ඉල්ලුම් පත්‍රය

1. ඉල්ලුම් කරන තිලය :————.
2. ඉල්ලුම්කරු ගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
3 ලිපිනය :————.
4. (අ) උපන් දිනය :————.
(ආ) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :————.
5. ජාතිය :————.
6. සුදුසුකම් :—.
(1) අධ්‍යාපනික (විෂයයන් සමඟ) :————.
(2) සැළසුම්කරු :————.
7. සැළසුම්කරුවකු වශයෙන් පළපුරුද්ද (සම්පූර්ණ විස්තර දිය යුතුයි) :————.
8. විශේෂ සුදුසුකම් (චිත්‍රශිල්පය පිළිබඳ හැකියාව වැනි) :————.
9. සිංහල ප්‍රවීණතාව :————.

ම විසින් ඉහත සඳහන් කරන ලද සියලු විස්තර සම්පූර්ණ සත්‍ය බව මෙයින් සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

8–731—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රජයේ උකස් බැංකුව

මෙම බැංකු සේවයේ පහත සඳහන් තනතුරු සඳහා පත් කිරීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ :—

**නීති සහායක**

(අ) **වයස.**—1969 අගෝස්තු 31 දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ආ) **සුදුසුකම්.**—යටත් පිරිසෙයින් අවුරුදු තුනක් ඔප්පු තිරප්පු ආදිය ලිවීම පිළිබඳ පළපුරුද්දක් ඇති පෙරකදෝරු සහ නොතාරිස්වරු විය යුතුය. පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකපත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතිකපත්‍ර පෙළේදී හෝ සිංහල සඳහා සාමාර්ථයක් නොලැබූ අයදුම්කරුවන් හට සිංහලෙන් රාජකාරි කටයුතු කිරීමට ප්‍රවීණතාවයක් තිබිය යුතුය.

(ඇ) **වැටුප් තලය.**—රු. 460—940 / 8×30—6×40 මසකට

**II වෙනි ශ්‍රේණියේ ගණන් තබන්නා**

(අ) **වයස.**—1969 අගෝස්තු 31 දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 20 ට නො අඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ආ) **සුදුසුකම්.**—ඉංග්‍රීසි සඳහා සම්මාන සාමාර්ථයක් සහ මූලික ගණිතය හෝ අංක ගණිතය හෝ වානිජ අංක ගණිතය හෝ සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සාමාර්ථයක්, සහ

ගණක විද්‍යාව හෝ පොත් තැබීම පිළිබඳව හෝ ඉන් දෙවගයෙන්ම හෝ පිළිගත් සුදුසුකම් සතුවීම. වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරිවරයකුගෙන් ලබා ගත් සහතිකයක් මඟින් අයදුම්කරුගේ හැකියාව තහවුරු කෙරේනම් වඩාත් මැනවි.

පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර පෙළේදී හෝ සිංහල සඳහා සාමාර්ථයක් නොලැබූ අයදුම්කරුවන් හට සිංහලෙන් රාජකාරි කටයුතු කිරීමට ප්‍රවීණතාවයක් තිබිය යුතුය.

පහත දැක්වෙන සුදුසුකම් ඇත්තේ නම්, දැනටමත් ලිපිකරුවන් වශයෙන් මෙම බැංකුවේ සේවයේ නියුතු නිලධාරීන් හට ඉහතින් නියමිත සුදුසුකම් නොසලකා අයදුම් කළ හැක :—

යටත් පිරිසෙයින් බැංකුවේ ගිණුම් අංශයේ අවුරුදු 10 ක සේවය, හෝ

යටත් පිරිසෙයින් බැංකුවේ ගිණුම් අංශයේ අවුරුදු 5 ක සේවය හා ගණක විද්‍යාව හෝ පොත් තැබීම පිළිබඳ හෝ ඉන් දෙවගයෙන්ම හෝ පිළිගත් සුදුසුකම් සතුවීම.

(ඇ) **වැටුප් තලය.**— රු. 192—450 / 6 × 10—4 × 12—10 × 15 මසකට.

**පොදු කොන්දේසි :**

බැංකුවේ රෙගුලාසි අනුව ජීවනාධාරය, විශේෂ ජීවනාධාරය සහ ගෙවල් කුලී දීමනාව ගෙවනු ඇත. තනතුරු විශ්‍රාම වැටුප් රහිත වන මුත් තනතුරු දරන්නන් බැංකුවේ අර්ථ සාධක අරමුදලේ දායකයින් වනු ඇත.

වයස අවුරුදු 60 දී බැංකුවේ සේවයෙන් විශ්‍රාම ගැන්ම අනිවාර්යය වන අතර, 55 ත් 60 ත් අතරදී වෛකල්පික වනු ඇත.

අයදුම්කරුවන් ලාංකික පුරවැසියන් විය යුතු අතර, තම උපන් දිනය හා තම සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳව දීර්ඝ විස්තර සඳහන් කළ යුතුය.

මූලාරම්භයේදී පත්වීම් වර්ෂයක පරිවාස කාලයකට යටත් වනු ඇත.

අනෙකුත් නියමිත සේවා කොන්දේසි පත්වීම් ලිපියේ සඳහන් කරනු ඇත.

සමත් වූ විභාගයන්හි සහතික හා මෑතදී ලබා ගත් චරිත සහතික දෙකක පිටපත් අයදුම් පත්‍රය සමඟ ඇවුරුම් කළ යුතුය. මුල් පිටපත් නොඑවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංස්ථාවල සේවයේ යෙදී සිටින අය තම අයදුම් පත්‍ර එම දෙපාර්තමේන්තු හෝ සංස්ථාවල ප්‍රධානීන් ගේ මාර්ගයෙන් එවිය යුතුය.

අයදුම් පත් පහත අත්සන් කරන අයහට ලැබෙන සේ 1969 අගෝස්තු 31 වෙනි දිනට හෝ ඊට පෙර එවිය යුතුය.

අයදුම් පත්‍රය බහාලන කවරයේ වම් පැත්තේ උඩින් තමන් අයදුම් කරන තනතුර අනුව "නීති සහායක/ගණන් තබන්නා තනතුර සඳහා වූ අයදුම් පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

කරනු ලබන මොන අන්දමේ පෙළඹවීමක් අයදුම්කරු නුසුදුස්සෙකු කිරීමට හේතුවනු ඇත.

එච්. බී. කපුවත්තේ,
සාමාන්‍යාධිකාරී.

කොළඹ 7,
හෝටන් පෙදෙසේ,
නම්වර 91 දරණ ස්ථානයේ පිහිටි
ලංකා රජයේ උකස් බැංකුවේ දීය.

8–733—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## මහජන බැංකුව

**සහකාර නීති නිලධාරි තනතුරු**

මහජන බැංකුවේ සහකාර නීති නිලධාරි තනතුරු සඳහා 1969 සැප්තැම්බර් 15 දිනට වයස අවුරුදු 45 ට නොවැඩි නීතිඥයින්ගෙන් අයදුම්පත් කැඳවේ.

අයදුම්කරුවනට උසාවියෙහි වැඩ කටයුතු පිළිබඳව අඩුම වශයෙන් අවුරුදු තුනක පළපුරුද්දක් ද ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් නොතාරිස් කටයුතු කිරීමට අවසර පත්‍රයද තිබිය යුතුය.

මහජන බැංකු සේවයේ III ශ්‍රේණියේ තනතුරක් වන මෙම තනතුර හා අදාල වැටුප රු. 485— රු. 965 / 8×30 6×40 කා. ක. රු. 805.

අමතර සුදුසුකම් නොහොත් වැඩි පළපුරුද්ද ඇති අයදුම්කරුවන් මෙම පරිමාවෙහි සුදුසු පියවරක තබනු ලැබිය හැක.

ගෙවනු ලබන දීමනා බැංකු පරිමාවන් අනුව වනු ඇත. තෝරා ගැනෙන නිලධාරීන් හට විශ්‍රාම වැටුප්, අර්ථසාධක අරමුදල් වරප්‍රසාද සහ අනෙකුත් ප්‍රතිලාභයන් ලැබෙනු ඇත.

තෝරා ගැනෙන අයදුම්කරුවන් විසින්—

(අ) රු. 1,500 ක මුදලක් ඇප තැබීමටද,

(ආ) පත්වීම ලැබීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීමටද අවශ්‍යවනු ඇත.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර දක්වෙන අයදුම්පත්, අඩු වශයෙන් මෑතකදී ලබාගත් චරිත සහතික තුනක පිටපත් සමග 1969 සැප්තැම්බර් 15 දින හෝ ඊට පෙර කොළඹ 2, යුනියන් පෙදෙස, මහජන බැංකුවේ සේවක කළමනාකාර තැන වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

සේවක කළමනාකාර තැන.

මහජන බැංකුව,
167 1/1, මාටිනස් සී. පෙරේරා ගොඩනැගිල්ල,
යුනියන් පෙදෙස,
කොළඹ 2.
1969 අගෝස්තු 2 දින.

8–826—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

**මාණ්ඩලික අභ්‍යාසලාභී—පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය**

1969 ජූලි මස 25 දින අංක 14,864 දරණ ගැසට් පත්‍රයේ පළවූ, ඉහත සඳහන් තනතුරු පිළිබඳ දැන්වීම හා සබඳේ.

අයදුම්පත් භාර ගැනීම අවසන් වන දිනය, 1969 අගෝස්තු 23 දින දක්වා දීර්ඝ කර ඇත.

අයදුම් පත්, එදින පස්වරු 4.30 ට පෙර, පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලයේ සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුය.

සභාපති,
පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය.

21, අබ්දුල් කපූර් මාවත,
කොළඹ 3.

8-762—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය—

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## 1970 ජනවාරි මාසයේ දී ද්විතීයික විද්‍යාලවල 8, 9, 10 ශ්‍රේණිවලට සිසුන් ඇතුලත් කිරීම

1970 ජනවාරි මාසයේ දී ද්විතීයික විද්‍යාලවල 8, 9, 10 ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කරවා ගැනීම අපේක්ෂාවෙන් සිටින දෙමව්පියන් හෝ භාරකරුවන් හෝ විසින් ඒ සඳහා ඉල්ලුම් පත්‍ර සිසුන් ඇතුළත් කරවා ගැනීම අපේක්ෂා කෙරෙන විද්‍යාලයේ විදුහල්පති වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආදර්ශයේ පරිදි සකස් කර ගත යුතුය. විදුහල්පතිවරුන් විසින් ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1969 සැප්තැම්බර් මස 8 වැනි දින වේ.

මෙම දැන්වීමේ පරිදි ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ හැක්කේ රජයේ හෝ රජය විසින් අනුමත කර ඇති විදුහල්වල හෝ ඉගෙනීම ලබන පහත දැක්වෙන ශ්‍රේණිවල සිටින සිසුන් වෙනුවෙන් පමණකි.

දැනට 7 වැනි ශ්‍රේණියේ ඉගෙනීම ලබන සිසුන්
(8 වැනි ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා)

දැනට 8 වැනි ශ්‍රේණියේ ඉගෙනීම ලබන සිසුන්
(9 වැනි ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා)

දැනට 9 වැනි ශ්‍රේණියේ ඉගෙනීම ලබන සිසුන්
(10 වැනි ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා).

සමහර විටෙක 8 වැනි ශ්‍රේණියට ඇතුළත්වීමට බලාපොරොත්තු වන සිසුන්ට තරඟ විභාගයකට පෙනී සිටීමට ද සිදුවනු ඇත. මෙම තරඟ විභාගය පැවැත්වීම ඒ ඒ ප්‍රදේශයේ/දිස්ත්‍රික්කයේ පිහිටි සියළුම විදුහල්වලට පොදු වූ පරිද්දෙන් එම ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හෝ දිස්ත්‍රික්ක භාර ප්‍රධාන අධ්‍යාපන නිලධාරි විසින් හෝ සංවිධානය කෙරෙනු ඇත. තේරීම පිළිබඳ ක්‍රමය හා තරඟ විභාග ප්‍රතිඵල අනුව කිසියම් ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට හෝ ඉල්ලුම් පත්‍රයේ දැක්වෙන විදුහලේ පුරප්පාඩුවක් ලබාගත නොහැකි වුවහොත්, එම ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව හෝ ඇතුළත් කිරීම සඳහා සුදුසු විද්‍යාලයක් සොයා දීම ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරි විසින් කෙරෙනු ඇත.

සී. ජේ. සේරසිංහ,
වැඩ බලන ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1969 ජූලි මස 25 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

විදුහල්පති,
....................................විද්‍යාලය,
....................................

*

———— වැනි ශ්‍රේණියට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් පත්‍රය

(අ) ශිෂ්‍යයා පිළිබඳ තොරතුරු—

| | |
|---|---|
| 1. නම | |
| 2. ස්ත්‍රී පුරුෂ භාවය | |
| 3. උපන් දිනය | |
| 4. 1970.1.1 දිනට වයස | |
| 5. ආගම | |
| 6. ජාතිය | |
| 7. දැනට ඉගෙනීම ලබන විදුහල | |
| 8. ඉගෙනීම ලබන මාධ්‍යය | |
| 9. ඉගෙනීම ලබන ශ්‍රේණිය | |

(ආ) පියාගේ/මවගේ/භාරකරුගේ තොරතුරු—

| | |
|---|---|
| 1. නම | |
| 2. පදිංචි ස්ථානයේ ලිපිනය | |

(ඇ) ශිෂ්‍යයා/ශිෂ්‍යාව ඇතුළත් කිරීමට බලාපොරොත්තුවන විද්‍යාලය පිළිබඳ තොරතුරු—

| | |
|---|---|
| 1. විදුහලේ නම | |
| 2. එහි පුරප්පාඩුක් සඳහා ශිෂ්‍යයා/ශිෂ්‍යාවට සුදුසුකම් ලබාගත නො හැකිවුවහොත් ශිෂ්‍යයා/ශිෂ්‍යාව යැවීමට බලාපොරොත්තු වන වෙනත් විදුහල් 4 ක නම් කැමැත්තේ අනුපිළිවෙලට සඳහන් කරන්න. විදුහල් 4 න් එකක් ශිෂ්‍යයා / ශිෂ්‍යාව දැනට ඉගෙනීම ලබන කණිෂ්ඨ විදුහලට තුදුරින්ම පිහිටි ද්විතීයික විද්‍යාලය විය යුතුය. ඉතිරි ඒවායින් දෙකක් ප්‍රදේශයේ පිහිටි ද්විතීයික විද්‍යාල විය යුතුය. ඉතිරි ද්විතීයික විද්‍යාලය ප්‍රදේශයෙන් පිට පිහිටි එකක් විය හැක. | 1.<br>2.<br>3.<br>4. |

*ඇතුළත් වීමට බලාපොරොත්තුව 9/10 ශ්‍රේණියට නම්, හැදෑරීමට බලාපොරොත්තු වන පාඨමාර්ගය කලා / විද්‍යා / වාණිජ බව සඳහන් කරන්න.

————,
පියාගේ/මවගේ/භාරකරුගේ අත්සන.

දිනය :————.

(ඈ) දැනට ශිෂ්‍යයා/ශිෂ්‍යාව ඉගෙනීම ලබන විදුහලේ විදුහල්පතිගේ සහතිකය—

ඉහත නම් සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යාව දැනට මෙම විදුහලේ———— වැනි ශ්‍රේණියේ ඉගෙනීම ලබන බවත්, ගැසට් නිවේදනයේ පරිදි 1970 වර්ෂයේ දී ———— වැනි ශ්‍රේණියේ ඉගෙනීම සඳහා ඔහුට/ඇයට සුදුසුකම් තිබෙන බවත්, මෙයින් සහතික කරමි. දැනට මෙම විදුහලේ ———— වැනි ශ්‍රේණියේ සිට ———— වැනි ශ්‍රේණිය දක්වා ඉගැන්වීම කරන බවත්, 9, 10 ශ්‍රේණිවල කලා/විද්‍යා/වාණිජ විෂයයන් උගන්වනු ලබන බවත් දන්වමි.

තවද, මේ ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේදී තැබූ බවද මෙයින් සහතික කරමි.

————,
ශිෂ්‍යයාගේ, ශිෂ්‍යාවගේ අත්සන.

දිනය :————.

විදුහලේ නම :————.

————,
විදුහල්පතිගේ අත්සන හා දිනය.

(අනවශ්‍ය වචන කපාහරින්න.)

8-734—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## නිවැරදි කිරීම

1969.7.18 දින අංක 14,863 දරණ ගැසට් පත්‍රයේ පල වූ නම් අතුරින් විභාග අංක ඇම්. 187 හා ඇම්. 190 යටතේ වූ නම් දෙක සිංහල ගැසට් පීටපතේ වැරදි ලෙස පල වී තිබේ. එය පහත සඳහන් පිළිවෙලට නිවැරදි විය යුතුය :

| විභාග අංකය | නම | ලිපිනය |
|---|---|---|
| ඇම්. 187 ... | ජී. වී. විමලලතා ... | සෝමා ජේෂකර්ම පාසැල, කපුගම—දෙවිනුවර |
| ඇම්. 190 ... | දයාවතී උබෙවර්ණ ... | එම |

පී. එච්. පී. ද සිල්වා
ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

ගා. ස. හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
කොළඹ 7,
69.8.7 දින.

8–750 —69.8.15 දින අංක 14,867 දරන ගැසම් පත්‍රය.

## ග්‍රාම සංවර්ධන හා කුඩාකර්මාන්ත දෙපාර්තමේන්තුව

**1968 අගෝස්තු මස මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද අවසාන ජේශකර්ම විභාගයේ ප්‍රථිඵල ලේඛනය**

1969 ජූලි මස 18 වැනි දින අංක 14,863 දරණ ගැසට් පත්‍රයේ පළව තුබුණු ලේඛනයට පහත සඳහන් නමද ඇතුලත් වේ.—

| විභාග අංකය | නම | ලිපිනය |
|---|---|---|
| ජී. 91 ... | ඇම්. ඇම්. සෝමාවතී ... | ශ්‍රී ඥානාධාර ජේෂකර්ම පාසැල, 23ජ්, මරික්කාර් වීදිය, ධර්ගානගරය |

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාමසංවර්ධන හා කුඩාකර්මාන්ත අධ්‍යක්ෂ.

ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
කොළඹ 7,
1969 අගෝස්තු මස 7 දින.

8–749—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**සත්ව පාලන විද්‍යාලය—පොලොන්නරුව.**

පොලොන්නරුවේ සත්ව පාලන විද්‍යාලයේ හය මාසික පාඨමාලාවට ශිෂ්‍යයන් බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන්නන් මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙළ කරගත් ඉල්ලුම් පත් 1969 අගෝස්තු 31 වැනි දිනට ප්‍රථම ලැබෙන සේ කොළඹ 1, තැ.පෙ. 1284, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ සත්ව පාලන නිළධාරී වෙත එවිය යුතුයි.

ඉල්ලුම් පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ ''සත්ව පාලන විද්‍යාලය'' යැයි ලියා ඊට යටින් තමා පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුයි.

අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුයි

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1969 අගෝස්තු 31 වැනි දිනට වයස අවුරුදු 17 ටත් 25 ටත් අතර විය යුතුයි.

(iii) ඔවුන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් සිංහල භාෂාව, අංක ගණිතය/ගණිතය සහ අඩු වශයෙන් වෙනත් විෂයයන් හතරකින් සමත් වී සිටිය යුතුයි.

(iv) ප්‍රායෝගික කෘෂිකර්ම අභ්‍යාස විද්‍යාල සහතිකය ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

ප්‍රායෝගික සත්ව පාලන කර්මයෙහි අත්‍යාවශ්‍ය අංග පිළිබඳ පුහුණුවක් දීම සඳහා මෙම පාඨමාලාව සකස් වී ඇති අතර පොළොන්නරුවේ මධ්‍යම පශු පර්යේෂණ මධ්‍යස්ථානයේදී සිංහල මාධ්‍යයෙන් පැවැත්වේ.

රජයේ සේවකයන් නොවන ශිෂ්‍යයන්ට පුහුණුවීමේ කාලය තුළ, දිනකට රු. 1.50 බැගින් ජීවනාධාර මුදලක් ගෙවනු ලැබේ. පුහුණුව ලබන කාලය තුළ පුහුණුව ලබන්නන්ට විද්‍යාලයේ නේවාසිකාගාරයේ නැවතී සිටීමට අනිවාර්යයෙන්ම සිදුවන අතර, නේවාසිකාගාරයේ මුළුතැන් ගෙයි සිය ආහාර පාන පිළියෙල කර ගැනීමට අවශ්‍ය විධිවිධාන යොදා ගැනීමට ඔවුන්ට පහසුකම් සලසනු ලැබේ.

පුහුණුව සමාප්ත කළපසු රැකියා සැපයීමට ලංකාණ්ඩුව බැඳී නොමැති බව මෙම පාඨමාලාවට ඇතුළත් වන අපේක්ෂකයින් විසින් මැනවින් තේරුම් ගත යුතුය.

පී. ටී. ජිනේන්ද්‍රදස,
නියෝජ්‍ය අධ්‍යක්ෂක (කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපලවල්).

1969 අගෝස්තු මස 7 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

### ඉල්ලුම් පත්‍ර පෝර්මය

1. ඉල්ලුම් කරුගේ අගට යෙදෙන නම (පැදිලි අකුරෙනි) :————.

2. වෙනත් නම් :————.

3. ලිපිනය :————.

4. දිස්ත්‍රික්කය :————.

5. උපන් දිනය :————.

6. 1969 අගෝස්තු 31 වැනි දිනට වයස :— අවු :————, මාස :————.

7. ඉල්ලුම්කරු අවසාන වරට පෙනී සිටි විභාගය :—
විභාගයේ නම :————.
දිනය :————.

8. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සාමාර්ථය ලත් විෂයයන් :—

| විෂය | සාමාර්ථයේ ස්වභාවය | විෂය | සාමාර්ථයේ ස්වභාවය |
|---|---|---|---|
| (i)........... | ...................... | (vi).............. | ...................... |
| (ii)........... | ...................... | (vii).............. | ...................... |
| (iii)........... | ...................... | (viii).............. | ...................... |
| (iv)........... | ...................... | (iv).............. | ...................... |
| (v)........... | ...................... | (x).............. | ...................... |

9. ඉංග්‍රීසි කී වැන්න සමත් දැයි යන බව :————.

10. ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලාවක ඉගෙනීම ලබා ඇතොත් :—
ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලාවේ නම :————.
වර්ෂය :————.
ලබාගත් සාමාර්ථයේ ස්වභාවය :————.

11. තරුණ ගොවි සමිතියක සාමාජිකයෙක් නම් :—
ත.ගො. සමිතියේ නම :————.
දිස්ත්‍රික්කය :————.
(සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රක්ෂෙප සටහන් ඉදිරිපත් කළ යුතුය.)

12. අවසාන වරට අධ්‍යාපනය ලැබූ පාසැල :————.
පාසැලෙන් අස් වූ දිනය :————.

13. සත්ව පාලනය පිළිබඳව දැනටම ලබා ඇති පළපුරුද්ද :————.

14. පියාගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.

15. පියාගේ හෝ භාරකරුගේ රැකියාව :————.

16. පුහුණුව අවසානයේ සමත්ව පාලන කටයුතු වලට බැසීමට බලාපොරොත්තු වන්නේ නම් දැනටමත් ඒ සඳහා ඇති පහසුකම් හා ඉඩකඩ මොනවාද :————.

17. පුහුණුව අවසානයේ වැටුප් ලබන රැකියාවක් බලාපොරොත්තු වන්නේ කොහේද ? එසේ ලබා ගැනීමට පහසුකම් තිබේද ? යන බව :————.

18. සත්ව පාලන පාඨමාලාවක් හැදෑරීමට අපේක්ෂකයාගේ සුදුසු බව සහතික කිරීමට හැකි දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් :—
(1) ..............................................................
(2) ..............................................................

**සටහන.**—අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබුවහොත් යථෝක්ත දෙදෙනාගෙන් හා අවසන් වරට අධ්‍යාපනය ලැබූ පාසැලේ විදුහල් පතිගේ සහතිකවල මුල් පිටපතක් ඉදිරිපත් කිරීමට හැකි විය යුතුය.

ඉහතින් දක්වන ලද විස්තර මගේ දැනීමේ හැටියට සත්‍ය වූද, නිවැරදිවූද, තොරතුරු බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–792—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### කාබන් කඩදාසි සැපයීම

ලංකාණ්ඩුවේ අංක 14,863 හා 1969.7.18 දින ගැසට් පත්‍රයේ පළවූ ගැසට් නිවේදනයේ සැපයීම් අංක 4 "මෙරට සෑදූ" යන වචන කපා හැරියාසේ, ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙ'න්ඩර් කරුවන් සලකත්න. තවද, දැන් මෙම සැපයීම කියවිය යුත්තේ ඉහත සඳහන් කර තිබෙන අන්දමටයි.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 අගෝස්තු 15 දින,
කොළඹ දීය.

8–861—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය—තැ. පෙ. 418 කොළඹ 1) 1969.9.1 සිට 1970.3.31 තෙක් සපුගස්කන්දේ පිහිටි ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවේ සිට කැළණිය හා හුණුපිටිය දුම්රිය ස්ථානවලට සහ "කැප්ටන් ගාර්ඩන්" දුම්රිය අංගනය දක්වා පීප්පවල පුරවන ලද බිටුමන් ප්‍රවාහනය කිරීම සඳහා 1969 සැප්තැම්බර් මස 2 වෙනි අඟහරුවාදා පෙ. ව. 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

මෙම සේවය සඳහා ලාංකිකයින්ට සහ ලාංකික සමාගම්වලට පමණක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ.

කොළඹ, සර් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ, අධිකාරී තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 100 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1969.9.1 වෙනි සඳුදා, දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකරී.

1969.8.15 දින,
කොළඹ දී ය.

8–862—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 418, කොළඹ 1.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1969.10.1 සිට 1970.9.30 තෙක් ගුදිරි හා හා බ්‍රිස්ටල් කොහු කෙඳි සැපයීම ... | 1969.9.9. |
| 2. මෙරට සෑදූ රබර් වෙලින්ටන් ගම්බූට් සැපයීම ... | 1969.9.9. |
| 3. මෙරට සෑදූ කපු ක්‍රීඩා ජර්සි සැපයීම ... | 1969.9.9. |
| 4. මෙරට සෑදූ ශුද්ධ කිරීමට ගන්නා කුඩු වර්ග සැපයීම ... | 1969.9.9. |
| 5. 1969.10.1 සිට 1970.9.30 තෙක් හිස් බීර බෝතල් ආදිය සැපයීම ... | 1969.9.16. |

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ.
ගබඩා අධිකාරී.

1969.8.15 දින,
කොළඹදීය.

8–867—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## 1969–70 මුදල් වර්ෂය තුළ මහනුවර බෝගම්බර බන්ධනාගාරීය කර්මාන්ත අංශයට අමු ද්‍රව්‍ය සැපයීම

පහත අත්සන් කරනු ලබන ම විසින් මහනුවර බෝගම්බර බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1969–70 මුදල් වර්ෂය තුළදී පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර් 1969 අගෝස්තු 31 වැනි ද පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණකි.

3. ටෙන්ඩර් සහ ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ විය යුතුයැයි තීරණය කොට ඇත :—

| සැපයුම් | | ටෙන්ඩර් තැන්පත් මුදල් රු. | ශ. | | ඇප තැන්පත් මුදල් රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) මාදම්පා වේවැල් සැපයීම | ... | 50 | 0 | ... | 1,000 | 0 |
| (ආ) පිරපු කොහු සැපයීම ... | ... | 10 | 0 | ... | 300 | 0 |
| (ඇ) ගුදිරි කොහු සැපයීම ... | ... | 10 | 0 | ... | 300 | 0 |
| (ඈ) පොල්කටු අඟුරු සැපයීම | ... | 10 | 0 | ... | 100 | 0 |
| (ඉ) ශුද්ධකළ ඉරටු සැපයීම | ... | 10 | 0 | ... | 100 | 0 |
| (ඊ) ගල්ලැහැපත් සැපයීම | ... | 10 | 0 | ... | 100 | 0 |
| (උ) ඉදල් සහ මුස්නු සෑදීමට සුදුසු කැලෑමිටි සැපයීම ... | ... | 10 | 0 | ... | 200 | 0 |
| (ඌ) පැලලි සෑදීමට යෝග්‍ය බටලී සැපයීම... | | 10 | 0 | ... | 300 | 0 |
| (ඍ) මහනුවර දුම්රිය ගබඩාවේ සිට බෝගම්බර බන්ධනාගාරය තුළට දව කොටන් ප්‍රවාහණය කිරීම ... | ... | 10 | 0 | ... | 250 | 0 |

4. විශෙෂ විස්තර.—මහනුවර බෝගම්බර බන්ධනාගාරයට ගෙනැවිත් භාරදිය යුතුයි.

(අ) මාදම්පා වේවැල් කුඩා සෑදීමට සහ වෙනත් වේවැල් වැඩ සඳහා සුදුසු හොඳට මෝරණ ලද අඩුම දිග අඩි 7 ක් විය යුතුයි. අවශ්‍යතාවය අනුව වේවැල් සෑම තැනම අඩුම වට ප්‍රමාණය අඟල් ½ ක් විය යුතුයි ;

(ආ) හොඳට වේලන ලද, කොහු බත් නොමැති, මිටියක බර රා. 28 ක් පමණ විය යුතුයි. අඟල් 12 කට අඩු නොවන දිගැති පිරණ ලද පොල්කොහු විය යුතුයි. සියයට 5 ක් වෙළීම් බර සඳහා අඩු කරනු ලැබේ. තෙතමනය හෝ විකෘති පාටින් යුත් පොල් කොහු භාරගනු නොලැබේ ;

(ඇ) ගුදිරි සෑදීමට යෝග්‍ය වූ, හොඳට වේලන ලද, පිරිසුදු, කොහුබත් නොමැති, මිටියක් බර රා. 14 ක් පමණ වන පොල්කොහු විය යුතුයි. සියයට 7½ ක් වෙළීම් බර සඳහා අඩු කරනු ලැබේ. තෙතමනය හෝ විකෘති පාටින් යුත් පොල්කොහු භාරගනු නොලැබේ ;

(ඈ) ඉස්ත්‍රික්ක කිරීමට යෝග්‍ය වූ, මධ්‍යම ප්‍රමාණයට පිළිස්සී ඇති පොල්කටු අඟුරු විය යුතුයි. ප්‍රමාණය ඉක්මවා පිළිස්සී ඇති පොල්කටු අඟුරු සහ සතරැස් අඟල් භාගයකට (1/2) අඩු කැලි භාරගනු නොලැබේ. දූවිල්ල සඳහා සියයට 5% සිට 7½ දක්වා වූ බර ප්‍රමාණයක් අඩු කරනු ලැබේ ;

(ඉ) හොඳට මෝරණ ලද, හොඳට වේලී ඇති, ඉතා හොඳින් පිරිසුදු කරන ලද දිගින් අඩි හතරකට නොඅඩු වූ අඟලින් අටෙන් එකකට (1/8) නොඅඩු ඝණකම ඇති ඉරටු විය යුතුයි. සියයට 2% ක් වෙළීම සඳහා අඩුකරනු ලැබේ ;

(ඊ) පැදුරු විවීමට යෝග්‍ය වූ, මෝරණ ලද, හොඳට වේලන ලද, අඩි හතරක් දිගැති වූ අඟල් 3/16ක් පමණ ඝණකම ඇති ගල්ලැහැපත් විය යුතුයි ;

(උ) ඉරටු ඉදල් සහ කොහු මුස්නු සෑදීමට යෝග්‍ය වූ, මහතින් අඟල් තුන වත් හතරටත් අතර පරිධිය ඇත්තා වූ දිගින් අඩි හතරයි හතරෙන් තුනකට ($4\frac{3}{4}$) අඩු නොවන ඇද නැති වූ දවට, කැබෙල්ල, මල්කැර, බොකුටු, පේර, පෙනලියා, කුරුඳු, ඇටවේරියා හෝ වෙනත් ශක්ති සම්පන්න ඇති කැලෑ කෝටු විය යුතුයි ;

(ඌ) බට පැලලි සෑදීමට යෝග්‍ය වූ, අඩි 8 ක් දිගැති වූ අඩු වශයෙන් අඟල් $1\frac{1}{2}$ ක් පරිධිය ඇත්තාවූ ද මෝරණ ලද, ඇද කුද නැති අළුත කපන ලද බටලී විය යුතුයි.

5. ඉහත තුන්වැනි ඡේදයෙහි දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර් කරුවන් සතුය.

6. ඉහත නම්කර ඇති ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරන විට ඒවායේ නම සහ තම ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ඇත.

7. පහත සඳහන් ආයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ:

(අ) සමූපකාර තොග වෙළඳ ආයතන ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ;

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

8. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ, ඒ සඳහා නියමිත පෝර්මයන් මගින් පමණකි. ඒ ලබාගත හැක්කේ 1969 අගෝස්තු මස 30 වැනි දින ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත් කර ලබාගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කාර්යාල යේදීත්, මෙම කාර්යාලයේදී හෝ ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළ හැකි බවත් සලකවනු ලැබේ.

9. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හී බහා එහි වම් කෙළවරේ " ........... සැපයීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක.

10. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හී අකුරෙන් හා ඉලක්කම් වලින් දක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම් වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ අමුතු එක් කිරීමක් කළහොත් ඒ බව ටෙන්ඩර් කරුවන් විසින්ම අත්සන් යොදා සැබෑ බවට සහතික කළ යුතුයි.

11. වර්ෂ 1969 අගෝස්තු මස 31 වැනි දින පෙරවරු 10.30 ට පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

12. නියමිත කාලසීමාව තුළ අවශ්‍ය සැපයීම් කිරීමට නොහැකි වුවහොත් එම කාලසීමාව ඉක්මවා සැපයීම් ප්‍රමාද වන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට සිදුවේ. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුට සැපයිය නොහැකි වන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරුගේ වියද මෙන් වෙනත් මාර්ගවලින් ලබාගැනීමේ අයිතිය මහනුවර බෝගම්බර බන්ධනාගාරයේ අධිකාරි සතුවේ.

13. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද කාර්යය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළු ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික් ෂෙප කිරීම හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය මහනුවර බන්ධනාගාර අධිකාරි වෙත පැවරී ඇත.

15. කොන්ත්‍රාත්තුව ලබාගැනීමට හැකි කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10 ක් ඇතුළත දී මහනුවර බන්ධනාගාර අධිකාරි සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාලසීමාව තුළ කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු අපොහොසත් වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම හා ලිපිනය වගකීම් පැහැර හැරගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුළත් කරනු ඇත.

16. තවත් වැඩි විස්තර දැනගැනීමට ඇවසි නම්, පහත අත්සන් කරන අයගෙන් එය ලබාගත හැක.

බී. ජේ. ඇස්. ද ඉසඩ්. ආධිහෙට්ටි,
බන්ධනාගාර අධිකාරි.

1969 ජූනි මස 30 වැනි දින,
මහනුවර, බෝගම්බර බන්ධනාගාරයේ දී ය.

8–701—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

රාජකීය ලංකා ගුවන් හමුදාවට පහත සඳහන් නයිලෝන් මේස් කුට්ටම් සැපයීම සඳහා කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969 අගෝස්තු මස 31 වැනි දින පෙරවරු 10.00 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

(අ) නයිලෝන් මේස් කලු ලොකු ප්‍රමාණය—කුට්ටම් 1,500 යි.

(ආ) නයිලෝන් මේස් කලු මධ්‍යම ප්‍රමාණය—කුට්ටම් 500 යි.

(ඇ) නයිලෝන් මේස් සුදු ලොකු ප්‍රමාණය—කුට්ටම් 100 යි.

2. ටෙන්ඩර් ආකෘති පත් ලබා ගැනීම පිණිස කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත, ඉහත සඳහන් සැපයීම සඳහා නැවත ලබා ගත හැකි රු. 75 ක මුදලක් තැන්පත් කර, රිසිට් පතක් ලබා ගත යුතුයි. 1969 අගෝස්තු මස 30 වැනි දින දහවල් 12.00 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කෙරේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැකිය.

ඊ. ආර්. අමරසේකර,
එයාර් වයිස් මාෂල්,
ගුවන් හමුදාධිපති.

8–857—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## යුද්ධහමුදා මූලස්ථානය

### සන්නද්ධ සේවාවන්හි රථවාහනවල ටයර් නැවත පිරවීම—1969-70

ඉහත සඳහන් සේවාව සඳහා ටෙන්ඩර් පත්, කොළඹ 2, බාල දක්ෂ මාවතේ, යුද්ධහමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් 1969 සැප්තැම්බර් මස 5 දින පූර්වභාග 10 තෙක් භාරගනු ලැබේ.

පනාගොඩ යුද්ධහමුදා විජිතයේ යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩල යෙන් මෙම ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 4 දින පූර්වභාග 12 වන තෙක් නිකුත් කරනු ඇත. කොළඹ බාලදක්ෂ මාවතේ යුද්ධහමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී කාර්යාලයේ සිවිල් පාලක හා ගණකාධිකාරීතැන වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් මෙම ටෙන්ඩර්පත් ලබාගත හැකිය.

මෙම ටෙන්ඩර් පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාවන්හිදී පනාගොඩ යුද්ධහමුදා විජිතයේ යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩල යෙන් ලබාගත හැකිය.

එම්. එල්. ඩී. ඒ. පෙරේරා,
කර්නල්,
යුද්ධහමුදා ආඥාපති වෙනුවට.

යුද්ධෝපකරණ අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධහමුදා විජිතය,
පනාගොඩ, හෝමාගම,
1969 ජූලි මස 27 දින.

8–663—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## 1969–70 මුදල් වර්ෂය තුල මහර බන්ධනාගාරීය කර්මාන්ත අංශයට අමු ද්‍රව්‍ය සැපයීම

පහත අත්සන් කරනු ලබන මවිසින් මහර බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1969–70 මුදල් වර්ෂය තුලදී පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර් 1969 අගෝස්තු 31 ද පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණකි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ විය යුතුයැයි තීරණය කොට ඇත :—

| සැපයුම් | | ටෙන්ඩර් තැන්පත් මුදල් රු. ශ. | | ඇප තැන්පත් මුදල් රු. ශ. |
|---|---|---|---|---|
| (අ) පීරාපු කොහු ... | ... | 10 0 | ... | 300 0 |
| (ආ) ගුදිරි කොහු ... | ... | 10 0 | ... | 300 0 |
| (ඇ) ඉදල් මිටි ... | ... | 10 0 | ... | 100 0 |
| (ඈ) පොල් ඉරටු ... | ... | 10 0 | ... | 100 0 |
| (ඉ) බට ලී ... | ... | 10 0 | ... | 100 0 |
| (ඊ) අමු පොල් ලෙලි ... | ... | 10 0 | ... | 50 0 |
| (උ) දිග මුස්න මිටි ... | ... | 10 0 | ... | 50 0 |
| (ඌ) මාදම්පේ වේවැල් ... | ... | 10 0 | ... | 100 0 |
| (එ) පොල්කටු අඟුරු ... | ... | 10 0 | ... | 100 0 |

4. **විශේෂ විස්තර.**—රාගම, මහර බන්ධනාගාරයට ගෙනැවිත් භාර දිය යුතුයි.

(අ) ඉස්තරම් වර්ගයේ වියලි දූවිලි රහිත කොහු බැඳීමට යෝග්‍ය වර්නවත් පීරාපු කොහු විය යුතුයි ;

(ආ) ඉස්තරම් වර්ගයේ වියලි දූවිලි රහිත ගුදිරි සෑදීමට යෝග්‍ය කොහු විය යුතුයි.

(ඇ) කොහු සහ ඉදල් බැඳීමට යෝග්‍ය මිටි, දිග අඩි 5 කට අඩු නොවිය යුතුයි. මුල වට ප්‍රමාණය අඟල් 3½ යි. අග වට ප්‍රමාණය අඟල් 2½ යි. දවට, කැබැල්ල සහ ඇට්ටේරිය හෝ මහර බන්ධනාගාර අධිකාරි තුමාගේ අදහස අනුව යෝග්‍යයයි පිළිගත් වෙනත් ශක්තිමත් ලී වර්ගයක් විය යුතුයි ;

(ඈ) හොඳට මෝරාපු වියලි, පිරිසිදු, සම්පූර්ණ දිග හා මහතින් යුත් ඉදල් බැඳීමට යෝග්‍ය ඉරටු විය යුතුයි ;

(ඉ) දිග අඩි 8 කටද, වට ප්‍රමාණය අඟල් 1½ කටද නොඅඩු ඇද නැති පැලලි සෑදීමට යෝග්‍ය අමු මෝරාපු බට විය යුතුයි ;

(ඊ) තැලීමට යෝග්‍ය මධ්‍යම ප්‍රමාණයේ අමු පොල්ලෙලි විය යුතුයි ;

(උ) සිලින් පිස දමන දිග මුස්න බැඳීමට යෝග්‍ය දිග අඩි 15 ක්ද, මුල වට ප්‍රමාණය අඟල් 5 ක්ද, අග වට ප්‍රමාණය අඟල් 3½ ක්ද ඇති දවට, ඇට්ටේරියා ආදී ශක්තිමත් ඇද නැති ලී විය යුතුයි ;

(ඌ) මාදම්පේ වේවැල් කූඩා සෑදීමට සහ වෙනත් වේවැල් වැඩ සඳහා සුදුසු හොඳට මෝරන ලද අඩුම දිග අඩි 7 විය යුතුයි. අවශ්‍යතාවය අනුව වේවැල් සෑමතැනම අඩුම වට ප්‍රමාණය අඟල් ½ ක් විය යුතුයි ;

(එ) පොල්කටු අඟුරු හොඳින් පුලුස්සා තිබිය යුතුයි. ප්‍රමාණයෙන් අඟුරු හතරැස් අඟල් ½ අඩු කැලි බාරගනු නොලැබේ. දූවිල්ල සඳහා සියයට පහේ සිට වූ බර ප්‍රමාණයක් අඩු කරනු ලැබේ. මහර බන්ධනාගාරයට ගෙනැවිත් බාර දිය යුතුයි.

5. ඉහත 3 වැනි ඡේදයෙහි දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර් කරුවන් සතුය.

6. ඉහත නම් කර ඇති ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරන විට ඒවායේ නම් සහ තම ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කාර්‍යාලයේ තැන්පත් කළ යුතුයි. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ඇත.

7. පහත සඳහන් ආයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතන ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ;

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

8. ටෙන්ඩර් පත් ඉදිරිපත් කල යුත්තේ, ඒ සඳහා නියමිත පෝර්මය මගින් පමණකි. ඒ ලබා ගත හැක්කේ 1968 අගෝස්තු 30 වෙනි දින ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත් කර ලබා ගත් රිසිට් පත් සහ කොන්ත්‍රාත්තුව සතුටුදායක අන්දමින් කරගෙන යාමට හැකිවන පරිදි මුදල් තත්වය ඇති බවට ප්‍රාදේශීය ආදායම් පාලක නිළධාරි තැනගෙන් ලබාගත් රපෝර්තුවක්ද ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල් මහර බන්ධනාගාර අධිකාරි තැනගේ කාර්‍යාලයේදීත් රාගමින් පිටතදී ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කල හැකි බවත් සලකනු ලැබේ.

9. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හී බහා එහි වම් පස කෙළවරේ " ............ සැපයීම සඳහා " යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කල තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන ලද අයගේ කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක.

10. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම් වලින් දැක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම් වලින් සඳහන් නොකල ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ අමුතු එක් කිරීමක් කළහොත් ඒ බව ටෙන්ඩර් කරුවන් විසින්ම අත්සන් යොදා සැබෑ බවට සහතික කළ යුතුය.

11. වර්ෂ 1969 අගෝස්තු 31 වෙනි දින පෙරවරු 10.30 ට පහත අත්සන් කරන අයගේ කාර්‍යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහි දී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

12. නියමිත කාලසීමාව තුල අවශ්‍ය සැපයීම් කිරීමට නොහැකි වුවහොත් එම කාලසීමාව ඉක්මවා සැපයීම් ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත් කරුවන්ට සිදුවේ. එවැනි අවස්ථාවක දී කොන්ත්‍රාත් කරුට සැපයිය නොහැකිවන සැපයීම්, කොන්ත්‍රාත් කරුගේ වියදමෙන් වෙනත් මාර්ගවලින් ලබා ගැනීමේ අයිතිය මහර බන්ධනාගාර අධිකාරි සතු වේ.

13. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද කාර්යය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළු ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂෙප කිරීම හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය මහර බන්ධනාගාර අධිකාරි වෙත පැවරී ඇත.

15. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකි කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10 ක් ඇතුලත දී මහර බන්ධනාගාර අධිකාරි සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාල සීමාව තුල කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම හා ලිපිනය වගකීම් පැහැර හැර ගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුලත් කරනු ඇත.

16. තවත් වැඩි විස්තර දැනගැනීමට අවැසි නම්, පහත අත්සන් කරන අයගෙන් එය ලබා ගත හැක.

ජේ. පී. දෙල්ගොඩ,
මහර බන්ධනාගාර අධිකාරී.

1969 අගෝස්තු මස 21 වෙනි දින,
රාගම, මහර බන්ධනාගාරයේ දී ය.

8–700—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## 1969–70 මුදල් වර්ෂය තුළ යාපනය බන්ධනාගාර කර්මාන්ත අංශයට අමුද්‍රව්‍ය සැපයීම

පහත අත්සන් කරනු ලබන මවිසින් යාපනය බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1969–70 මුදල් වර්ෂය තුළදී පහත සඳහන් ද්‍රව්‍යයක් සැපයීම සඳහා ටෙන්ඩර් 1969 අගෝස්තු මස 31 දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණකි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ වියයුතු යයි තීරණය කොට ඇත.

| සැපයුම් | | ටෙන්ඩර් තැන්පත් මුදල් රු. ශ. | | ඇප තැන්පත් මුදල් රු ශ. |
|---|---|---|---|---|
| (අ) මාදපම්පා වේවැල් ... | ... | 20 0 | ... | 250 0 |
| (ආ) පීරපු කොහු ... | ... | 10 0 | ... | 25 0 |
| (ඇ) පොල්කටු අඟුරු ... | ... | 10 0 | ... | 25 0 |
| (ඈ) ගොම පොහොර ... | ... | 10 00 | ... | 25 0 |

4. **විශේෂ විස්තර**—යාපනය බන්ධනාගාරයට ගෙනවිත් භාරදිය යුතුයි.

(අ) මාදම්පේ වේවැල් කූඩා සෑදීමට සහ වෙනත් වේවැල් වැඩ සඳහා සුදුසු හොඳට මෝරන ලද අඩුම දිග අඩි 7 ක් විය යුතුයි. අවශ්‍යතාවය අනුව වේවැල් සෑම තැනම අඩුම වට ප්‍රමාණය අඟල් ½ ක් විය යුතුය.

(ආ) පීරපු කොහු හොඳට වියලී තිබිය යුතු අතර දූවිල්ලෙන් තොර විය යුතුය. තෙත්වූ හෝ වර්ණ වෙනස්වූ කොහු භාරගනු නොලැබේ. කොහුවල දිග අඟල් 12 ක් විය යුතුය. වියලීම සඳහා සියයට 3 නේ සිට බර ප්‍රමාණයක් අඩුකරනු ලැබේ.

(ඇ) පොල්කටු අඟුරු හොඳින් පුළුස්සා තිබිය යුතු අතර දූවිල්ලෙන් තොර විය යුතුයි. ප්‍රමාණයෙන් අඟුරු හතරැස් අඟල් ½ ට අඩු කැලි භාරගනු නොලැබේ. දූවිල්ල සඳහා සියයට පහේ සිට වූ බර ප්‍රමාණයක් අඩුකරනු ලැබේ.

(ඈ) වත්නි ගොම පොහොර, ගල් වැලි හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයන් ගෙන් තොරව තිබිය යුතුයි. ලොකු තල්කොල කූඩා 150 කට නොඅඩු ප්‍රමාණයෙන් යුත් ගොම ලොරියක් සඳහා මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය. කෝපායි එළිමහන් සිර කඳවුරට ගෙනැවින් භාරදිය යුතුය.

5. ඉහත 3 වැනි ඡෙදයේ දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර් කරුවන් සතුය.

6. ඉහත නම්කර ඇති ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත්කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරන විට ඒවායේ නම සහ ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කායර්‍යාලයේ තැන්පත් කළ යුතුය. ආදර්ශක නොමැතිව ඉදිරිපත්කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ඇත.

7. පහත සඳහන් ආයතන සඳහා නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේ දී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ.

(අ) සමුපකාර තොග වෙළඳ ආයතන,

(ආ) වෙනත් ආණ්ඩුවට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති,

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

8. ටෙන්ඩර්පත් ඉදිරිපත්කළ යුත්තේ නියමිත පෝර්මයක් මඟින් පමණකි. ඒවා ලබාගත හැක්කේ 1969 අගෝස්තු 30 වැනි දින ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත්කර ලබාගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත් මේ ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කායර්‍යාලයේදීත්, මෙම කායර්‍යාලයේ දී හෝ ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළ හැකි බවට සලකන්න.

9. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම් පස කෙළවරේ "මාදම්පේ වේවැල්/පීරපු කොහු/පොල්කටු අඟුරු/ගොම පෝර සැපයීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන්කොට ලියාපදිංචි කල තැපෑලෙන් එවීම හෝ පහත අත්සන්කරන අයගේ කායර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක.

10. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයෙහි අකුරෙන් හා ඉලක්කම්වලින් දක්විය යුතුය. එසේ අකුරෙන් සහ ඉලක්කම්වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ අමුතු එක්කිරීමක් කළහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින්ම අත්සන් යොදු සැබෑ බවට සහතික කළ යුතුයි.

11. වර්ෂ 1969 අගෝස්තු මස 31 වෙනි දින පෙරවරු 10.30 ට පහත අත්සන් කරන අයගේ කායර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

12. නියමිත කාලසීමාව තුල අවශ්‍ය සැපයීම් කිරීමට නොහැකිවූවහොත් එම කාලසීමාව ඉක්මවා සැපයීම් ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට සිදුවේ. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුට සැපයිය නොහැකිවන සැපයීම් කොන්ත්‍රාත්කරුගේ වියදමින් වෙනත් මාර්ගවලින් ලබා ගැනීමේ අයිතිය යාපනය බන්ධනාගාර අධිකාරි සතුවේ.

13. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද කායර්‍ය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂෙප කිරීම හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය යාපනය බන්ධනාගාර අධිකාරි වෙත පැවරී ඇත.

15. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකි කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා දින 10 ක් ඇතුළදී යාපනය බන්ධනාගාර අධිකාරි සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාලසීමාව තුල කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම හා ලිපිනය වගකීම් පැහැර හැරගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුලත් කරනු ඇත.

16. තවත් වැඩි විස්තර දැනගැනීමට අවැසි නම් පහත අත්සන් කරන අයගෙන් එය ලබාගත හැක.

සී. ටී. ජෑන්ස්,
යාපනය බන්ධනාගාර අධිකාරී.

1969 ජූනි මස 21 වැනි දින,
යාපනය බන්ධනාගාරයේ දීය.

8–699—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1969–70 මුදල් වර්ෂය තුළ පල්ලෙකැලේ, එළිමහන් සිර කඳවුරට අමු ද්‍රව්‍යය සැපයීම

පහත අත්සන් කරනු ලබන මවිසින් පල්ලේකැලේ එළිමහන් සිර කඳවුරේ බන්ධනාගාර කර්මාන්ත අංශයට 1969–70 මුදල් වර්ෂය තුළදී මෙහි පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටැන්ඩර් 1969 අගෝස්තු මස 31 වෙනි දින පෙ.ව. 10.30 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයින්ගෙන් පමණි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පත් මුදල් මෙසේ විය යුතු යයි තීරණය කොට ඇත :—

| සැපයීම | | ටෙන්ඩර් තැන්පත් මුදල | | ඇප තැන්පත් මුදල |
|---|---|---|---|---|
| | | රු. | | රු. |
| වියළි ගොම පොහොර | ... | 10 | ... | 50 |

4. **විස්තර—වියලි ගොම පොහොර :—** ගල් වැලි හෝ අනිකුත් බාහිර ද්‍රව්‍යයන්ගෙන් තොර වියළි පොහොර විය යුතුයි. තෙතමනය ඇතොත් ඒ සඳහා 10% ප්‍රමාණයක් තෙත ගති ප්‍රමාණය සඳහා අඩු කරනු ලැබේ. හොණ්ඩරයක මිළ ඉදිරිපත් කළ යුතුයි. කුණ්ඩසාලේ එළිමහන් සිර කඳවුරට ගෙනැවිත් භාර දිය යුතුය.

5. ඉහත නම්කර ඇති ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් සැම්පල් ඉදිරිපත් කළ යුතු අතර, එවායේ නාම සහ ලිපිනය ලියා පහත අත්සන් කරනු ලබන අයගේ කායර්‍යාලයට ගෙනැවිත් භාර දිය යුතුය. සැම්පල් නොමැතිව ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ඇත.

6. පහත සඳහන් ආයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල අනවශ්‍යය :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතන.

(ආ) ආණ්ඩුවට අයත් වෙනත් රජයේ ව්‍යාපාර සංවිධාන.

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති.

(ඈ) සමුපකාර සමිති පිළිබඳව රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

7. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහා නියමිත පෝර්මයක් මඟින් පිටපත් දෙකකින් යුතුවය. එය ලබාගත හැක්කේ 1969 අගෝස්තු මස 30 වෙනි දින ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා මුදල් තැන්පත්කර ලබාගත් රිසිට්පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත් ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ 9, බන්ධනාගාර මූලස්ථාන කායර්‍යාලයේදීත් කොළඹින් පිටතදී ඕනෑම කච්චේරියකදීත්, හෝ එළිමහන් සිර කඳවුරේ අධිකාරි කායර්‍යාලයේද තැන්පත් කළ හැකි බව සැලකිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර සීල් තැබූ කවරයන්හි බහා එහි වම්පස උඩ කෙළවරේ " වියළි ගොම පොහොර සඳහා ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කායර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

9. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයෙහි අකුරෙන් හා ඉලක්කම්වලින් දක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම්වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසිම වෙනස් කිරීමක් හෝ අමුතු එක් කිරීමක් කළහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින්ම ඔවුන්ගේ අත්සන් යොද සත්‍ය බවට සහතික කළ යුතුය.

10. වර්ෂ 1969 අගෝස්තු 31 වෙනි දින පෙ.ව. 10.35 ට පහත අත්සන් කරන අයගේ කායර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුලුවන.

11. නියමිත කාලසීමාව තුළ අවශ්‍ය සැපයීම් කිරීමට නොහැකි වූවහොත් එම කාලසීමාව ඉක්මවා සැපයීම ප්‍රමාද වන සෑම දිනයක්. වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට සිදු වනු ඇත. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුට සැපයිය නොහැකිවන ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරුගේ වියදමින් වෙනත් මාර්ගවලින් ලබාගැනීමේ අයිතිය පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුරේ බන්ධනාගාර අධිකාරී සතු වේ.

12. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් කරන ලද කායර්‍ය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

13. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂෙප කිරීම හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවකදී නවතාලීම සම්පූර්ණ අයිතිය පල්ලෙකැලේ. එළිමහන් සිර කඳවුරේ බන්ධනාගාර අධිකාරී වෙත පැවරී ඇත.

14. කොන්ත්‍රාත්තුව ලබාගැනීමට හැක්කේ කොන්ත්‍රාත්තුකරුට ඒ බව දන්වා දින 10ක් ඇතුළතදී පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුරේ බන්ධනාගාර අධිකාරී සමඟ ගිවිසුමකට අත්සන් තැබීමෙන් පසුවය. එම කාලසීමාව තුළ ඇප මුදල් තැන්පත්කර කොන්ත්‍රාත් ගිවිසුමට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැර ගිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ඇත

තවත් වැඩ විස්තර දැනගැනීමට අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ලබාගත හැක.

ෂෙ. ව. අබේනායක,
බන්ධනාගාර අධිකාරී.

1969 ජූනි 13 වැනි දින,
පල්ලෙකැලේ එළිමහන් සිර කඳවුරේ දීය.

8–698—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1969–70 මුදල් වර්ෂය තුළ මීගමු බන්ධනාගාරීය කර්මාන්ත අංශයට අමු ද්‍රව්‍ය සැපයීම

පහත අත්සන් කරනු ලබන මවිසින් මීගමු බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1969–70 මුදල් වර්ෂය තුළදී පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර් 1969 අගෝස්තු මස 31 වැනිද පෙරවරු 10.30 දක්වා භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණකි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ විය යුතුයයි තීරණය කොට ඇත :—

| සැපයුම් | | ටෙන්ඩර් තැන්පත් මුදල් රු. ශ, | | ඇප තැන්පත් මුදල් රු. ශ. |
|---|---|---|---|---|
| (අ) මුස්න හා ඉදල් තැනීමට යෝග්‍ය මිටි | ... | 25 0 | ... | 300 0 |
| (ආ) නො 1 පීරාපු පොල් කොහු | ... | 25 0 | ... | 200 0 |
| (ඉ) වියලි පොල් ඉරටු ... | ... | 25 0 | ... | 200 0 |
| (ඊ) මාදම්පා වේවැල් ... | ... | 25 0 | ... | 200 0 |

4. **විශේෂ විස්තර.**—මීගමු බන්ධනාගාරයට ගෙනැවිත් භාරදිය යුතුය.

(අ) මුස්න හා ඉදල් තැනීමට යෝග්‍ය මිටි දූවට, කැබැල්ල, ඇටවේරිය, සහ වෙනත් සවි ඇති ලී වර්ගයේ ඇද නැති අවශ්‍යතාවය අනුව දිග අඩි 5 ක් සහ අඩුම වටප්‍රමාණය අඟල් 3 ක් සහ වැඩිම වට ප්‍රමාණය අඟල් 4 ක් විය යුතුය.

(ආ) අංක 1 පීරාපු පොල් කොහු කොහුබත්වලින් සහ තෙතමනෙන් තොර මුස්න සෑදීමට යෝග්‍ය වියලි පොල් කොහු විය යුතුයි.

(ඉ) වියලි පොල් ඉරටු සම්පූර්ණ දිග ඇති හොඳාකාර සුද්ද කරන ලද මහත වියලි පොල් ඉරටු විය යුතුයි.

(ඊ) මාදම්පා වේවැල් කුඩා සෑදීමට සහ වෙනත් වේවැල් වැඩ සඳහා සුදුසු හොඳට මෝරන ලද අඩුම දිග අඩි 7 විය යුතුයි. අවශ්‍යතාවය අනුව වේවැල් සෑම තැනම අඩුම වටප්‍රමාණය අඟල් $\frac{1}{2}$ ක් විය යුතුයි.

5. ඉහත 3 වැනි ඡෙදයෙහි දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර් කරුවන් සතුය.

6. ඉහත නම්කර ඇති ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරන විට ඒවායේ නම සහ තම ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කාර්‍යාලයේ තැන්පත් කල යුතුයි. ආදර්ශක නොමැතිව ඉදිරිපත්කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ඇත.

7. පහත සඳහන් අයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතන,

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති,

(ඇ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

8. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහා නියමිත පෝර්මයක් මගින් පමණකි. එය ලබාගත හැක්කේ 1969 අගෝස්තු මස 30 වැනි දින ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත් කර ලබාගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත්, මේ ටෙන්ඩර තැන්පත් මුදල් කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කාර්‍යාල යේදීත් කොළඹින් පිටතදී ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළ හැකි බවත් සලකනු ලැබේ.

9. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම්පස කෙලවරේ ''......................සැපයීම සඳහා ටෙන්ඩරය'' යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන ලද අයගේ කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක.

10. නිසම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම්වලින් දැක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම්වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ අමුතු එක් කිරීමක් කළහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින් අත්සන් යොදා සැබෑ බවට සහතික කළ යුතුය.

11. වර්ෂ 1969 අගෝස්තු 31 වැනි දින පෙරවරු 10.30 ට පහත අත්සන් කරන අයගේ කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

12. නියමිත කාලසීමාව තුල අවශ්‍ය සැපයීම් කිරීමට නොහැකි වූවහොත් එම කාලසීමාව ඉක්මවා සැපයීම් ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට සිදුවේ. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුට සැපයිය නොහැකිවන සැපයීම් කොන්ත්‍රාත්කරුගේ වියදමෙන් වෙනත් මාර්ගවලින් ලබා ගැනීමේ අයිතිය මීගමු බන්ධනාගාර අධිකාරි සතුවේ.

13. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් කරන ලද කාර්යය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළු ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීම හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය මීගමු බන්ධනගාර අධිකාරි වෙත පැවරී ඇත.

15. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකි කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10 ක් ඇතුලතදී මීගමු බන්ධනාගාර අධිකාරි සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාලසීමාව තුළ කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම හා ලිපිනය වගකීම් පැහැර හැර ගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුලත් කරනු ඇත.

16. තවත් වැඩි විස්තර දැන ගැනීමට ඇවැසිනම්, පහත අත්සන් කරන අයගෙන් එය ලබා ගත හැක.

ආර්. ජේ. ඇන්. ජෝඩන්,
බන්ධනාගාර අධිකාරී.

1969 ජූනි මස 8 වැනි දින,
මීගමු බන්ධනාගාරයේදීය.

8–696—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### අනුරාධපුර නව බන්ධනාගාර ගොඩනැගිලි භූමි ප්‍රදේශය වෙත ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම

අනුරාධපුර නව බන්ධනාගාර ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය මෙහි පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා මෙහි පහත අත්සන් කරන නිලධාරියා විසින් 69.8.31 වෙනි දින පෙ.ව. 10 වන තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

| | | ඒකකය | | මුළු වර්ෂය සඳහා දල වශයෙන් අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|---|---|
| කළුගල් 6″–9″ | ... | කියුබ | ... | 20 |
| ගංගා වැලි ... | ... | කියුබ | ... | 30 |
| කඩාපු ගල් $\frac{3}{4}$″ | ... | කියුබ | ... | 30 |
| අළු හුනු ... | ... | බුසල් | ... | 100 |
| තම්බපු හුනු | ... | ටින් | ... | 30 |

2. ටෙන්ඩර් පත් පිටපතකින් සමන්විත විය යුතුය. එක් එක් විෂය සඳහා ටෙන්ඩර් කරනු ලබන මිළ ගණන් ඒ ඒ විෂයන්වලට ඉදිරියෙන් ඉලක්කමෙන් සහ වචනයෙන්ද දැක්විය යුතුය. මිළ ගණන් එක් එක් ඒකකය සඳහා විය යුතුය.

3. සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කොළඹ බන්ධනාගාර කොමසාරිස්තුමාගේ කාර්‍යාලයේ හෝ කොළඹ හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින්ම සකස් කරගත යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල සම්බන්ධයෙන් ලබාගත කුවිතාන්සිය ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. එසේ නොඑවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4. ඉහත සඳහන් ද්‍රව්‍ය අනුරාධපුර නව බන්ධනාගාර ගොඩනැගිලි ඉදි කරනු ලබන භූමි පෙදෙස වෙත සපයා ක්‍රමානුකූලව ගොඩ ගැසිය යුතුය.

5. සියලුම ටෙන්ඩර් පත්‍ර කවරයක දමා එය සීල් තබා කවරය වම්පස උඩ කෙලවරේ '' ගොඩනැගිලි සඳහා ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර් '' යන්න සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් අනුරාධපුර බන්ධනාගාරයේ අධිකාරි, අනුරාධපුරය වෙත එවිය යුතුය. නොඑසේ නම් අනුරාධපුර බන්ධනාගාර යේ අධිකාරිතුමාගේ කාර්‍යාලයේ මේ සඳහා තබා ඇති පෙට්ටියේ 1969.8.31 වැනි දින පෙ.ව. 10 ට පෙර බහා ලිය යුතුය.

6. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් කලින් කලට ඔහු වෙත නිකුත් කෙරෙන ඇණවුම්වල සඳහන් ද්‍රව්‍ය නියම කරන ලද කාලසීමාව ඇතුළත සපයන බවට පහත අත්සන් තබා ඇති නිලධාරියා සමග ගිවිසුමකට බැඳිය යුතුය. යම් හෙයකින් කොන්ත්‍රාත්තුවේ සඳහන් කොන්දේසිවලට අනු කූලව යම් අයෙක් සැපයීම් කිරීමට අපොහොසත් වුවහොත් හෝ සැපයීම්

පැහැර හැරියොත්, ඔහුගේ නම කොන්ත්‍රාත්තු පැහැර හැර ගිය අයවලුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට හා ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදලද රාජසන්තක කිරීමට ඉඩ තිබේ.

7. තෝරාගත් ටෙන්ඩර්කරු වෙත අවශ්‍ය බඩු සපයන ලෙස දනුම් දී දින 14ක් ඇතුළත ටෙන්ඩරයෙහි සඳහන් ද්‍රව්‍යවලින් 1/5 සැපයිය යුතු අතර ඉතිරි කොටස ඇණවුම් තැබූ ඒ ඒ අවස්ථාවල කොන්ත්‍රාත්තුවට අනුකූලව සැපයිය යුතුය.

8. ටෙන්ඩර්කරුවන් විසින් සැපයීමට බලාපොරොත්තු වන කඩාපු කළුගල්, ගඟේ වැලි ආදියෙහි (සැම්පල්) ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතුය. සැපයීමට බලාපොරොත්තු වන කඩාපු ගල් සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඇති හෙයින් ඒවා ඉස්තරම් වර්ගය විය යුතුය. එසේ නොතිබුණ හොත් එම ද්‍රව්‍ය ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

9. අනුරාධපුර බන්ධනාගාරයේ අධිකාරිතුමා විසින් 1969.8.31 වෙනි දින දහවල් 10.05 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීම හෝ ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ බලය සහ අයිතිය රජය සතු වේ.

11. අවශ්‍ය නම් මෙහි පහත අත්සන් තබා ඇති නිලධාරියාගෙන් වැඩි විස්තර ලබාගත හැක.

ඊ. සී. ප්‍රේමතිලක,
බන්ධනාගාර අධිකාරි.

අනුරාධපුර බන්ධනාගාරයේදීය.
1969 ජූලි මස 8 වැනි දින.

8–694—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1969-70 මුදල් වර්ෂය තුළ වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අංශයට අමු ද්‍රව්‍ය සැපයීම

පහත අත්සන් කරනු ලබන මවිසින් වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1969–70 මුදල් වර්ෂය තුළදී පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර් 1969.8.31 වැනි දින පෙරවරු 10.30 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ විය යුතු යයි තීරණය කර ඇත :—

| සැපයුම් | ටෙන්ඩර් තැන්පත් මුදල | | ආරක්ෂක තැන්පත් මුදල | |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. |
| (අ) මී හරක් හම් ... ... | 20 | 0 | 200 | 0 |
| (ආ) එළ හරක් හම් ... ... | 20 | 0 | 300 | 0 |
| (ඇ) ඔප කළ රතු හම් ... ... | 20 | 0 | 200 | 0 |
| (ඈ) ඔප කළ කළු හම් ... ... | 20 | 0 | 300 | 0 |
| (ඉ) එළු හම් ... ... | 20 | 0 | 300 | 0 |
| (ඊ) රබර් පතුල් සහ රබර් විලුම් ... | 20 | 0 | 300 | 0 |
| (උ) ගව වල්ගා ලොම් ... ... | 20 | 0 | 200 | 0 |
| (ඌ) මුස්න මිටි ... ... | 20 | 0 | 200 | 0 |
| (එ) පිරිසිදු ඉරටු ... ... | 20 | 0 | 200 | 0 |
| (ඒ ගල්ලැහැ පන් ... ... | 20 | 0 | 300 | 0 |
| (ඔ) පීරපු කොහු ... ... | 20 | 0 | 200 | 0 |
| (ඕ) ගුදිරි කොහු ... ... | 20 | 0 | 200 | 0 |
| (ක) මාදම්පා වේවැල් ... ... | 20 | 0 | 300 | 0 |
| (ඛ) පොල් කටු අඟුරු ... ... | 20 | 0 | 200 | 0 |
| (ග) බේකරි මුහුන් ... ... | 20 | 0 | 200 | 0 |

4. විශේෂ විස්තර—මෙම ද්‍රව්‍යයන් වැලිකඩ බන්ධනාගාරයට ගෙනවිත් බාරදිය යුතුයි.

(අ) පාවහන් සෑදීම සඳහා හොඳින් කෙලින් පදම්කළ ඒවාවිය යුතුයි.

(ආ) හොඳට වියලුනු, පාවහන් සෑදීම සඳහා කෙලින් පදම්කළ ඒවා විය යුතුයි.

(ඇ) පාවහන් සෑදීම සඳහා 'ඒ' වර්ගයට අයත්, හිල් අඩියාලම් ලකුණු ආදියෙන් තොර ක්‍රෝම් වර්ගය විය යුතුයි.

(ඈ) පාවහන් සෑදීම සඳහා 'ඒ' වර්ගයට අයත් හිල්, අඩයාලම් ලකුණු වලින් තොර තුනී ක්‍රෝම් වර්ගය විය යුතුයි.

(ඉ) හම් දහයේ (10) මිටියක් සාමාන්‍යයෙන් රාත්තල් පහකට (5) වැඩි නොවිය යුතුයි.

(ඊ) රබර් පතුල්—දිග නොයෙක් ප්‍රමාණයන්ගෙන් විය යුතුයි. රබර් විලුම්—මීම් ප්‍රමාණයන් 2¾″ සිට 4″ දක්වා වූ ප්‍රමාණයන්.

(උ) පිරිසිදු කොට වේලා තිබිය යුතුයි.

(ඌ) දිගින් අඩි පහකට (5) නොඅඩු, මේරූ, සවිමත් කෙලින් ලී විය යුතුයි. දවට, ඇටවේරිය, කැබැල්ල සුදුසුයි. මීටක වට රවුම අඟල් තුනේ (3) සිට තුන හමාර (3½) දක්වා විය යුතුයි.

(එ) අඩි තුනක් (3) දිග මේරූ, වියලි පොල් කොල සූරා පිරිසිදු කරන ලද ඒවා විය යුතුයි.

(ඒ) දිගින් අඩි තුනහමාරකට (3½′) නොඅඩු පැදුරු විවීම සඳහා සුදුසු මහත ඒවා විය යුතුයි.

(ඔ) ඉතා හොඳට නෙලන ලද වියලි, මුස්න සහ බුරුසු සෑදීමට සුදුසු ඒවා විය යුතුය.

(ඕ) හීන් කෙදි සහිත, කොහු බත් නොමැති ගුදිර සෑදීමට සුදුසු නො. 1කේ ඒවා විය යුතුය.

(ක) වේවැල්, ඇඳ, පුටු විවීමට සහ කූඩා සෑදීමට මෝරාපු ඒවා විය යුතුයි. දිගින් අඩි හතකට (7) නොඅඩු විය යුතුයි. වට ප්‍රමාණය අඟල් බාගයේ (½″) සිට අඟල් 1⅛ ට වැඩි නොවිය යුතුයි.

(ඛ) මඳ පවනට දවුනු, දූවිලි වලින් තොර ඒවා විය යුතුයි. ප්‍රමාණය ඉක්මවා පිළිස්සී ඇති පොල් කටු අඟුරු සහ හතරෙන් අඟල් බාග යකට (½) අඩු කැලි බාරගනු නොලැබේ. දූවිල්ල සඳහා 5% සිට බර ප්‍රමාණයක් අඩු කරනු ලැබේ.

(ග) සීල්කොට ඇසුරූ ටින් විය යුතුයි.

5. ඉහත 3 වැනි ඡේදයේ දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර් කරුවන් සතුය.

6. ඉහත නම් කර ඇති ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරනවිට ඒවායේ නම සහ ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ඇත. රබර් පතුල් සහ විලුම් සැපයීමේදී ලංකා විද්‍යාත්මක හා පර්යේෂණ ආයතනය මගින් පනවා ඇති නියමිත ද්‍රව්‍ය ප්‍රමාණයන්ට අනුකූලව එම රබර් පතුල් සහ විලුම් සාද තිබිය යුතු බවට එම ආයතනයේ අධ්‍යක්ෂතැනගෙන් ලබාගත් සහතිකයක් සමඟ ආදර්ශක ඉදිරිපත් කළ යුතුයි. එම ආදර්ශකවල ලං. වි. හා. ප. ආයතනයේ මුද්‍රාවද වැදී තිබිය යුතුයි.

7. පහත සඳහන් ආයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල අවශ්‍ය නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන.

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ග්‍රාම සංවර්ධන සමිති.

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

8. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ, ඒ සඳහා නියමිත පෝරම මගින් පමණකි. එය ලබාගත හැක්කේ 1969 අගෝස්තු මස 30 වැනි දින ප.ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍යයන් සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත් කර ලබාගත් රිසිට්පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත් මේ ටෙන්ඩර් තැන්පත් මුදල් කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කාර්යාල යේදීත් කොළඹින් පිටතදී ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළ හැකි බවත් සළකනු ලැබේ.

9. ටෙන්ඩර් පත්‍රසත් සීල් තැබූ කවරයන්හී බහා එහි වම් පස කෙලවරේ "..................සැපයීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචිකළ තැපැලෙන් එවීම හෝ පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක.

10. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම්වලින් දක්විය යුතුයි. එසේ අකුරෙන් සහ ඉලක්කම්වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයක් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ අමුතු එක් කිරීමක් කලහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින්ම අත්සන් යොද සැබෑ බවට සහතික කළ යුතුයි.

11. වර්ෂ 1969 අගෝස්තු මස 31 වැනි දින පෙරවරු 10.30 ට පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

12. නියමිත කාලසීමාව තුළ අවශ්‍ය සැපයීම කිරීමට නොහැකි වුවහොත් එම කාලසීමාව ඉක්මවා සැපයීම ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට සිදුවේ. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුවනට සැපයීමට නොහැකිවන සැපයීම් කොන්ත්‍රාත් කරුවන්ගේ වියදමෙන් වෙනත් මාර්ගවලින් ලබා ගැනීමේ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරි සතුවේ.

13. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් කරන ලද කාර්ය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමට හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවකදී නවතාලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරී වෙත පැවරී ඇත.

15. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකි කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින දහයක් (10) ඇතුලතදී බන්ධනාගාර කර්මාන්ත අධිකාරී සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුයි. එම කාලසීමාව තුළදී කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම පැහැර හැරගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුලත් කරනු ඇත.

16. තවත් වැඩි විස්තර දැන ගැනීමට අවැසි නම්, පහත අත්සන් කරන අයගෙන් ලබා ගැනීමට පුළුවන.

ආර්. ඩබ්ලිව්. ජේ. ලෙනෝරා,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරි.

බන්ධනාගාර කර්මාන්ත අංශය,
වැලිකඩ බන්ධනාගාරය, කොළඹ 9,
1969 ජූලි මස 27 වැනි දින.

8–695/1—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**කොළඹ දුම්රිය දෙඹකරාංගනයේ හා කැළණිවැලි අංගනයේ සිට වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට දව (කඳන්) ප්‍රවාහනය කිරීම 1969–70**

1969–70 මුදල් වසර තුළ කොළඹ දුම්රිය දෙඹකරාංගනයේ හා කැළණිවැලි අංගනයේ සිට වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අංශයට දව (කඳන්) ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පහත අත්සන් කරනු ලබන මා විසින් 1969 අගෝස්තු මස 31 වැනි දින පෙ.ව. 10.30 දක්වා බාරගනු ලැබේ.

2. වැලිකඩ බන්ධනාගාරයේදී දව (කඳන්) ලොරිවලින් බෑම සඳහා කම්කරුවන් සපයනු ලැබේ. දව (කඳන්) පැටවීම සඳහා කම්කරුවන් යොදවාලීම ආදිය ගැන වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අධිකාරීන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව වැඩ පිළිවෙලක් සකස් කොට ගත යුත්තේ සාර්ථකවූ ටෙන්ඩර්කරු විසිනි. ටෙන්ඩර්කරු දිනපතා දුම්රිය අධිකාරීන් හමුවී බන්ධනාගාර දෙපාර්තමේන්තුවට නානා ස්ථානවලින් ලැබෙන දව (කඳන්) පිළිබඳ සොයා බලා ඒවා ඉවත්කර ගැනීම පිණිස අවශ්‍ය බලපත් ලබාගැනීම සඳහා නොපමාව ක්‍රියා කළ යුතුය. ඉනික්බිතිව ඒ සියල්ල වැලිකඩ බන්ධනාගාරයට ප්‍රවාහන කළ යුතුය. දව (කඳන්) පැටවීමේදී, ප්‍රවාහනයේදී හා දුම්රිය ස්ථානයේ දව (කඳන්) තිබෙන්නට හැරීමෙන් ගෙවන්නට සිදුවන ගාස්තු ආදී නිසා මෙම දෙපාර්තමේන්තුවට යම්කිසි අලාභහානියක් සිදු නොවන්නට කටයුතු කිරීම කොන්ත්‍රාත් කරුගේ වගකීමය. උක්ත හේතූන් නිසා යම්කිසි අලාභයක් විඳීමට මෙම දෙපාර්තමේන්තුවට සිදුවුනි නම් ඒ වියදම් සියල්ල කොන්ත්‍රාත්කරුගේ මුදල්වලින් අඩුකර ගන්නවා ඇත.

3. කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අංශයට බඩු බාරදිය හැක්කේ, සතියේ දිනයන්හි පෙ.ව. 7 සිට 10.30 දක්වා සහ ප.ව. 1 සිට 3.30 දක්වාද, පෙර පෝ දිනයන්හි පෙ.ව. 7 සිට 10.30 දක්වාද යන කාලයන් තුළ පමණකි.

4. මුදලින් රුපියල් පණහක් (රු. 50) කොළඹ බන්ධනාගාර කොමසාරිස් තුමාගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට නම්, ඕනෑම කච්චේරියක හෝ එකී මුදල තැන්පත් කළ බවට කුවිතාන්සියක් පහත අත්සන් කරන අයට ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා නිකුත් කරන ටෙන්ඩර් පෝර්ම වර්ෂ 1969 අගෝස්තු මස 30 වැනි දින ප.ව. 2.30 දක්වා ලබාගත හැක.

5. ටෙන්ඩර් පත්‍රයන් සිල් තැබූ කවරයන්හි බහා එහි වම්පස උඩ කෙළවරෙහි " දව (කඳන්) ප්‍රවාහනය සඳහා ටෙන්ඩරය " යනුවෙන් සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා වෙන්කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක.

6. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයෙහි අකුරෙන් හා ඉලක්කම්වලින් දැක්විය යුතුය. එසේ අකුරෙන් සහ ඉලක්කම්වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීම් හෝ අමුතු එක් කිරීම් ඇතුළත් කළ හොත් ඒ බව ටෙන්ඩර්කරු විසින් තම කෙටි අත්සන යොද සැබෑ බවට සහතික කළ යුතුයි.

7. වර්ෂ 1969 අගෝස්තු මස 31 වැනි දින පෙ.ව. 10.30 ට පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

8. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමේ හා කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරී වෙත පැවරී ඇත.

9. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් කරන ලද කාර්ය ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

10. කොන්ත්‍රාත්තුව ලබාගැනීමට හැකිවූ කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10ක් ඇතුළතදී බන්ධනාගාර කර්මාන්ත අධිකාරි සමඟ ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාලසීමාව තුළදී කොන්ත්‍රාත් ගිවිසුමට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුනි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම පැහැර හැර ගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුළත් කරනු ඇත.

11. තවත් වැඩි විස්තර දැනගැනීමට ඇවැසි නම් පහත අත්සන් කරන අයගෙන් ලබාගැනීමට පුළුවන.

12. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණකි.

ආර්. ඩබ්ලිව්. ජේ. ලෙනෝරා,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරි.

1969 ජූලි මස 27 වැනි දින,
බන්ධනාගාර කර්මාන්ත අංශය, වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9.

8–695/2—69.8.15 දින අංක 14,867දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : 327/258 ඒ.

## කුරුණෑගල කච්චේරිය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහත දැක්වෙන වැඩ සඳහා 1969 සැප්තැම්බර් මස 4 වෙනි දින සවස 1 වන තෙක් කුරුණෑගල දිසාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ හක්වටුනාඔය මහ ගොවි ජනපදයේ—

(1) පොල්පිතිගම-හක්වටුනාඔය පාරේ බෝක්කු තැනීම,

(2) නාම්බුව-හේනව පාරේ බෝක්කු තැනීම.

(3) මකුල්පොත-පාළුගම පාර තැනීම.

2. රුපියල් 15,000 කට හෝ ඊට වැඩි ගණනකට රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුව හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී සිටින අයට 1969 අගෝස්තු මස 31 වෙනි දින දවල් 12 වන තෙක් කුරුණෑගල දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවීමෙන් අනුමත කරන ලද සමිති සමාගම් නිදහස්ය.

3. ටෙන්ඩර් පත්‍ර අපේක්ෂකයින් විසින් කුරුණෑගල දිසාපති කාර්යාලයේ එක් එක් වැඩය සඳහා රුපියල් 25ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් කුරුණෑගල දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ඉන් පසු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නො ලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. සිල් තබන ලද ටෙන්ඩර් බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ ටෙන්ඩකරුගේ නම ද, වැඩෙහි නමද, සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ලියපදිංචි කළ තැපෑලෙන් "කුරුණෑගල දිසාපති, ඉඩම් අංශය, දිසාපති කාර්යාලය, කුරුණෑගල" කියා එවිය යුතුය. නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දින සවස 1 ට පෙර දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.

5. 1969 සැප්තැම්බර් මස 4 වෙනි දින සවස 2.30 ට දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර් මණ්ඩලය විසින් ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරුවන් විසින් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟවිය යුතුය.

7. තවත් අවශ්‍ය තොරතුරු කුරුණෑගල දිසාපති කාර්යාලයේ සංවර්ධන වැඩ අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩබ්ලිව්. ඒකනායක,
කුරුණෑගල දිසාපති වෙනුවට.

1969 අගෝස්තු මස 15 දින,
කුරුණෑගල දිසාපති කාර්යාලයේදීය.

–65C—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—නිකවැරටිය උප කොට්ඨාශය

නිකවැරටිය උප කොට්ඨාශයේ බඩු ප්‍රවාහනය 1969-70 වර්ෂය සඳහා ටෙන්ඩර් පත් 1969 අගෝස්තු 26 වෙනි අඟහරුවාදා පෙ. ව. 10 දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000 කට හෝ ඊට වැඩි ගණනකට පුහුණු වැඩ සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

3. 1968 අගෝස්තු මස 25 වෙනිදා අ. භා. 4.30 වනතෙක් නිකවැරටිය, කුරුණෑගල, පුත්තලම යන වාරිමාර්ග කාර්යාලවලින් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පත් සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන් සතුව ඇති ලොරිවල විස්තර, ඒවායේ ලියාපදිංචි අංක හා ප්‍රමාණය යනාදි විස්තර සැපයිය යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුළදී නිකවැරටිය උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

කේ. එස්. සිතම්පරපිල්ලෙයි,
වාරිමාර්ග ඉංජිනේරු,
නිකවැරටිය උප කොට්ඨාශය.

1969 ජූලි 31 වැනි දින,
නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයේදීය.

8–665—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මොණරාගල උප කොටස

මොණරාගල උප කොටසේ "දඹේවැව ව්‍යාපාරයේ පිවිසුම් පාරේ අවශ්‍ය අළුත්වැඩියා කිරීම්" සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 5 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 35,000 ට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. 1969 සැප්තැම්බර් මස 1 වෙනි දින දහවල් 12 දක්වා කාර්යාලීය වේලාවන් තුලදී මොණරාගල, බදුල්ල හා මහියංගණය යන වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ෆෝරම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝරම කොළ ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි වාර්තා පොත් හා දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම් දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද? නැද්ද? යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ෆෝරම නිකුත් කිරීමට පෙරාතුව මෙම වැඩය වෙනුවෙන් රුපියල් පනහක (50.00) ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

3. මෙම වැඩය ගැන සියලුම විස්තර කාර්යාලීය වේලාවන් තුලදී මොණරාගල උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකිසි.

ඒ. එෆ්. මහගමගේ;
වාරිමාර්ග ඉංජිනේරු, මොණරාගල උප කොටස.

1969 අගෝස්තු මස 2 වෙනි දින,
මොණරාගල වාරිමාර්ග කාර්යාලයේදීය.

8–676—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—හම්බන්තොට උප කොටස

හම්බන්තොට උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් 1969 සැප්තැම්බර් 9 වැනිදා පෙරවරු 10.00 දක්වා භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදුකෙරේ.

| වැඩ විස්තරය | ලියාපදිංචිය | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|
| | රු. | රු. |
| හම්බන්තොට උප කොටසේ මුරුතවෙල ව්‍යාපාර යෙහි වම් ඉවුරු සොරොව්වේ කරු හැඩයට නිර්මිතයක් තැනීම ... ... | 25,000 ... | 25 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයන්ට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

3. 29.8.69 සිට 5.9.69 දක්වා පමණක් කාර්යාල වේලාව තුළ හම්බන්තොට උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු මහතාගේ කාර්යාල යෙන් ලබාගත හැකි ෆෝරම්වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කරගත යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ෆෝරම නිකුත් කිරීමට ප්‍රථම ඉහළ දක්වෙන පිළිවෙලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියලුම වැඩ විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුළදී හම්බන්තොට උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

පී. සත්‍යවේල්,
වාරිමාර්ග ඉංජිනේරු, හම්බන්තොට.

හම්බන්තොට, වාරිමාර්ග කාර්යාලයේදීය.
1969 අගෝස්තු මස 1 වැනි දින.

8–678—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—යාපනය උප කොටස

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාපනය උප කොටසේ කනගරායන් ආරු ගං වතුර ආරක්ෂක බැම්ම අලුත් වැඩියා කිරීම සඳහා උතුරු කොට්ඨාශයේ වවුනියාව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 සැප්තැම්බර් මස 5 වැනි සිකුරාදා පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති රුපියල් 36,000 ටත් ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තු වේ ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන් සැප්තැම්බර් මස අවසානයේ සම්පූර්ණ කර භාර දීමට පුලුවන් කොන්ත්‍රාත් කරුවන් පමණක් ටෙන්ඩර් කිරීමට සුදුස්සන් වෙති.

3. අවශ්‍ය හිස් ටෙන්ඩර් ෆෝර්ම යාපනය/වවුනියාව/මන්නාරම්/මුල්ලතිව්/වවුනික්කුලම් යන වාරිමාර්ග කාර්යාලවලින් 1969 සැප්තැම්බර් මස 1 වැනි දින පස්වරු 3 තෙක් භාරගනු ලැබේ. තම තමන්ගේ ලියාපදිංචි පොත සහ දැනට කෙරෙන්ට තිබෙන වැඩ සඳහා සහතිකයක්ද ඉදිරිපත් කිරීම වාරිමාර්ග ඉංජිනේරු තැනට ප්‍රයෝජනවත් වේ.

4. ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට පෙර රුපියල් 50 ක මුදලක් ඕනෑම ඉහත සඳහන් කාර්යාලයක තැන්පත් කර හෝ කච්චේරියක හෝ තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කිරීම සෑහේ.

වැඩි විස්තර වාරිමාර්ග කාර්යාලය, කිලිනොච්චියෙන් ලබා ගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු,
යාපනය උප කොටස.

1969 අගෝස්තු මස 2 වැනි දින,
කිලිනොච්චිය.

8–682—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—බදුල්ල උප කොටස

බදුල්ල උප කොටස යටතේ බණ්ඩාරවෙල, කහත්තේවෙල තනිකඩ පොදු නිවස ප්‍රතිසංස්කරණය කිරීමේ ඉතිරි වැඩ සඳහා ටෙන්ඩර් පත් භාර ගැනීම 1969 සැප්තැම්බර් මස 5 වෙනි දින පෙරවරු 10 දක්වා බණ්ඩාරවෙල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කරනු ලබයි. ටෙන්ඩර් පත් විවෘත කිරීමද එකී අවසානවේදීම සිදු කෙරේ.

2. රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

3. 1969 සැප්තැම්බර් මස 1 වෙනි දින තෙක් කාර්යාල වේලාවන් තුළදී බදුල්ල, මහියංගන හා මොණරාගල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත් සඳහා ඉල්ලුම් කරන විට ටෙන්ඩර්කරුවන් විසින් තමාගේ ලියාපදිංචි පොත දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කරනු ලබන වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ටෙන්ඩරය ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් ලබා ගැනීමට ටෙන්ඩර් ඇප මුදල වන රු. 50 වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ පිළිබඳව වැඩි විස්තර බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකිය.

වී. නාගේන්ද්‍රන්,
වාරිමාර්ග ඉංජිනේරු,
බදුල්ල උප කොටස.

වාරිමාර්ග කාර්යාලය, බදුල්ල,
1969 අගෝස්තු මස 6 වෙනි දින.

8–689—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහියංගන උප කොටස

මහියංගන උප කොට්ඨාශයේ අළුයටවෙල පිහිටි කුඩාවැවේ වැව් බැම්ම සහ වාන ඉදිකිරීම සඳහා ටෙන්ඩර්, බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 අගෝස්තු මස 22 සිකුරාදා පෙ. ව. 10 වන තෙක් භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 35,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, ග්‍රාමසංවර්ධන සමිතිවලට සහ විවිධ සේවා සමුපකාර සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය.

3. මහියංගන, බදුල්ල හෝ මොණරාගල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් 1969 අගෝස්තු මස 19 වෙනිදා දක්වා ලබා ගත හැකි ආකෘති පත්‍රවල මෙම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමේදී රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් එම වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ තැන්පත් කොට ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය සම්බන්ධයෙන් ඕනෑම විස්තරයක් මහියංගන වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුළදී ලබා ගත හැකිය.

එස්. සිවලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු,
මහියංගන උප කොට්ඨාශය.

1969 අගෝස්තු මස 2 වෙනි දින,
මහියංගන වාරිමාර්ග කාර්යාලයේ දී ය.

8–688—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—යටි මිහිතල විමර්ශනය

යාපනයේ තොන්ඩමනාරේ බරාරජේ උස් පහත් කිරීමේ ගේට්ටු 5 සිට 18 දක්වා පරතර දියුණුව හා අලුත්වැඩියා කිරීම සඳහා උතුරු කොට්ඨාශයේ වවුනියාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 සැප්තැම්බර් මස 5 වැනි සිකුරාදා 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් රුපියල් 25,000 ටත් ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් පමණක් ටෙන්ඩර් කිරීමට සුදුස්සන් වෙති.

3. අවශ්‍ය හිස් ටෙන්ඩර් පෝර්ම යාපනය යටි මිහිතල විමර්ශන කාර්යාලය සහ කිලිනොච්චිය යාපනය උ. කො. භාර වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලින් 1969 සැප්තැම්බර් මස 1 වැනි දින පස්වරු 3 තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ස්වකීය ලියාපදිංචි පොත් සහ දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුව කරණ වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර, යථෝක්ත එක් එක් විෂයය යටතේ දැක්වෙන ටෙන්ඩර් තැන්පත් මුදල් යථෝක්ත ඕනෑම වාරිමාර්ග කාර්යාලයක තැන්පත් කිරීම හෝ එම මුදල් කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීම කළ යුතුය.

4. මෙම ටෙන්ඩර් සම්බන්ධව වැඩි විස්තර කාර්යාල වේලාවන් තුලදී, යාපනයේ යටි මිහිතල විමර්ශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

සෙ. සිවසිතම්පරම්,
වාරිමාර්ග ඉංජිනේරු,
යටි මිහිතල විමර්ශනය, යාපනය.

1969 අගෝස්තු මස 3 වැනි දින,
යාපනය.

8–687—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහනුවර උප කොටස

මහනුවර උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර කුණ්ඩසාලේ, මධ්‍යම කොට්ඨාශ භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969.9.5 වැනි දින පෙ.ව. 10.0 තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම සිදු කෙරේ.

| | වැඩ විස්තරය | ලියාපදිංචිය | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|
| | | රු. | රු. |
| 1. | උඩුනුවර කුරහන්දෙනිය වැව ඉදිකිරීම ... | 25,000 ... | 25 |
| 2. | උඩුනුවර දේවාල වැව ඉදිකිරීම ... | 27,000 ... | 50 |

ඉහත සඳහන් පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට මේ සඳහා ඉල්ලුම් කිරීමට ඉඩ දෙනු ලැබේ.

මහනුවර/මාතලේ/නුවරඑළිය/හසලක යන වාරිමාර්ග කායභාලයකින් දෙපිටපතකින් ලබාගත් අයදුම්පතක ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. මෙම ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ 1969.9.2 දින පෙ.ව. 11.00 දක්වා පමණකි. නියමිත තැන්පත් මුදල් ඕනෑම කච්චේරියක හෝ ඉහත සඳහන් වාරිමාර්ග කායභාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් එකී වාරිමාර්ග කායභාලයකින් ටැන්ඩර්පත් ලබාගත හැක. මෙසේ ටෙන්ඩර් පත් ලබාගැනීමට බලාපොරොත්තු වන ඉල්ලුම් කරුවන් තම තමන්ගේ ලියාපදිංචි පොත් ටෙන්ඩර් ලබාගන්නා කායභාලයට ඉදිරිපත් කළ යුතු වන්නේය.

වෙනත් අදළ විස්තර මහනුවර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් රාජකාරි වේලාවන් තුළ ලබාගත හැකි වන්නේය.

ඒ. ටී. ජේ. ද පින්ටෝ,
මහනුවර වාරිමාර්ග ඉංජිනේරු තැන,
මහනුවර උප කොටස.

1969 ජූලි මස 30 වැනි දිනදීය.

8–685—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—නුවරඑළිය උප කොට්ඨාශය

නුවරඑළිය උප කොට්ඨාශය යටතේ 1969 ඔක්තෝබර් 1 වෙනි දින සිට පටන් ගැනෙන 1969-70 සහ 1970-71 යන මුදල් වර්ෂ දෙක තුළ ගබඩා ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 8 වෙනි දින පෙරවරු 10 දක්වා කුණ්ඩසාලේ මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුහුණු හෝ නුපුහුණු වැඩ සඳහා රුපියල් 20,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන්, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති පමණක් ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට සුදුස්සන් වේ. අයදුම් කරුවන් යටත් පිරිසෙයින් ලොරි දෙකකවත් හිමිකරුවන් විය යුතු අතර, අවශ්‍ය වුවහොත් ලොරි ධාවනය කළ නොහැකි මාර්ගවල බඩු ප්‍රවාහණය කිරීම සඳහා ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් ලබාගත හැකි අය වලුත් විය යුතුයි

3. අයදුම්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට ප්‍රථම තමන් සතු ලොරි ලියාපදිංචි කිරීමේ කාඩ්පත් සහ 1969 වර්ෂයට ලබාගත් වාහණ බල පත්‍රයද ඉදිරිපත් කළ යුතුයි.

4. 1969 අගෝස්තු 16 වෙනි දින සිට 1969 සැප්තැම්බර් මස 5 වෙනි දින දක්වා කායභාල වේලාවන් තුළදී නුවරඑළිය, මහනුවර, මාතලේ, සහ හසලක වාරිමාර්ග ඉංජිනේරු කායභාලවලින් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම්කරුවන් ඔවුන් කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඒ සඳහා රුපියල් 25 ක මුදලක් තැන්පත් කළ යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායභාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත්කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි.

5. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය.

6. ටෙන්ඩර් සඳහා වැඩිමනත් විස්තර නුවරඑළියේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායභාලයෙන් කායභාල වේලාවන් හි දී ලබාගත හැක.

ජී. අම්බිකාසිපහාර්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
නුවරඑළිය උප කොට්ඨාශය.

වර්ෂ 1969 ජූලි මස 27 වෙනි දින,
නුවරඑළියේ වාරිමාර්ග කායභාලයේදීය.

8–684—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහනුවර උප කොට්ඨාශය

1969-70 සහ 1970-71 යන මුදල් වර්ෂයන්හි මහනුවර උප කොට්ඨාශයේ ගබඩා ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 සැප්තැම්බර් මස 5 වැනි දින පෙ. ව. 10 දක්වා කුණ්ඩසාලේ මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000 ට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කල හැකිය.

ගබඩා ද්‍රව්‍යයන් ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් පත් ඉල්ලීමේදී අඩු වශයෙන් ඔවුන් සතු ලොරි 2 ක් තිබිය යුතු අතර ඒවා ලියා පදිංචි වී ඇති බවට ඊට අදාල 1969 වර්ෂය සඳහා ලබාගත් ලියා පදිංචිකිරීමේ සහතිකය විශේෂයෙන් ඉදිරිපත් කල යුතුය.

1969 අගෝස්තු මස 15 දින සිට 1969 සැප්තැම්බර් 2 වැනි දින දක්වා (දෙදිනම ඇතුළුව) කාර්යාල වේලාවන් තුලදී කුණ්ඩසාලේ, මාතලේ, හසලක සහ නුවරඑළිය යන උප කොට්ඨාශ වාරිමාර්ග කාර්යාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල ටෙන්ඩර් පිටපත් 2 කින් යුක්තව ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචිය දැක්වෙන පොත් සහ දැනට තමා යටතේ ඇති දෙපාර්තමේන්තු වැඩ හා ප්‍රගතිය සඳහන් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතු අතර රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත්කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක්ද ඉදිරිපත් කල යුතුය.

මෙම වැඩ පිළිබඳ සියළු විස්තර කාර්යාල වේලාවන් තුලදී මහනුවර උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් දැනගත හැකිය.

ඒ. පී. ජේ. ද පින්ටො,
වාරිමාර්ග ඉංජිනේරු—මහනුවර උප කොට්ඨාශය.

1969. 7. 31 දින,
මහනුවර උ. කො. වාරිමාර්ග කාර්යාලයේදීය,
කුණ්ඩසාලේ.

8–683—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 සැප්තැම්බර් මස 8 වෙනි දින ප. ව. 2.30 දක්වා බිඳුණවැව රජයේ ගොවිපලට විදුලි බලයෙන් ක්‍රියා කරන වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

**විස්තර.**—විදුලි බලයෙන් ක්‍රියාකරන අශ්ව බල 5 කින් යුත්, මුළු ශීර්ෂය 150 කින් යුක්ත වතුර පොම්පයක් විය යුතුය.

2. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 1969 සැප්තැම්බර් මස 8 වෙනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මේ ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා එක් එක් ටෙන්ඩර් පෝරමයක් සඳහා රු. 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මේ තැන්පත් කිරීම පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්මේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා ගේ ගිණුමට හෝ කළ හැකිය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන විට රජයේ කාර්යාලවල භාවිතාකරන මුදල් භාරදෙන වව්චරය (පොදු ආකෘති පත්‍ර 118) සම්පූර්ණ කර බැංකුවට භාර දිය යුතුය. ටෙන්ඩර් පෝරම බණ්ඩාරවෙල, කෘෂිකර්ම නිළධාරීගෙන් ලබා ගත හැක.

3. ටෙන්ඩර් ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. එසේ නැතිනම් බණ්ඩාරවෙල කෘෂිකර්ම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට පුද්ගලිකව පැමිණ බහා ලිය හැක.

සියලුම ටෙන්ඩර් "විදුලි බලයෙන් ක්‍රියාකරන වතුර පොම්පයක් සැපයීම—බිඳුනවැව ගොවිපලට" යනුවෙන් ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කොට "ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති—කෘෂිකර්ම කාර්යාලය, බණ්ඩාරවෙල" යනුවෙන් අමතා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය ලිපි කවරයේ පහළ වම් කෙළවරේ සඳහන් කර එවිය යුතුය.

4. 1969 සැප්තැම්බර් මස 8 වෙනි දින ප. ව. 2.30 න් පසුව සියලුම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් කරුට එකී වේලාවට පැමිණ සිටිය හැක.

5. නියමිත පෝරමයේ හෝ එහි අඩංගු විස්තර වලට අනුකූලව හෝ නොවන කිසිම ටෙන්ඩරයක් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් කරන මිළ ගණන් සහ ප්‍රමාණයන් පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර, යම් වෙනස් කිරීමක් කළ හොත් එහි කෙටි අත්සන යොදා සත්‍ය බවට සහතික කළ යුතුය. ටෙන්ඩර් මිළ ගණන් වචනයෙන්ද ඉලක්කමෙන්ද සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර් කරුවන් තමන් සැපයීමට බලාපොරොත්තුවන වතුර පොම්පය පිළිබඳ විස්තර පත්‍රිකාවක් ඉදිරිපත් කළ යුතුය.

7. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ සිට සති හතරක කාලයක් තුල ටෙන්ඩර් කරුවන්ගේ පිළිගැනීම් විවෘතව තබා ගත යුතුය.

8. ටෙන්ඩර් භාර ගත් බව දන්වා සති දෙකක් තුල පිළිගත් ටෙන්ඩර් කරුවා සැපයීම නොකළහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමට ඉඩ ඇත.

9. තෝරාගත් ටෙන්ඩර් කරුවා විසින් තෝරාගත් ටෙන්ඩර් පතෙහි සඳහන් වතුර පොම්පයේ වටිනාකමින් සියයට 5 ක මුදලක් තැන්පත් වශයෙන් තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් ගිවිසුම් පත් අත්සන් කිරීමට මෙම කාර්යාලයට පැමිණිය යුතු අතර, ඒ සඳහා මුද්දර වල වටිනාකම ඔහු විසින් ගෙවිය යුතුය.

කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීමෙන් පසුව මෙම තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

10. යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනී.

11. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් ලිපිනයට තැපැලෙන් යැව්වහොත් ඔහුගේ අතට දුන්නා සේ සැලකිය යුතුය.

12. මේ පිළිබඳව තවත් තොරතුරු අවශ්‍ය වන්නේ නම් බණ්ඩාරවෙල කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිළධාරි තැනගෙන් ලබා ගත හැක.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘ.අ.හාගො.),
පේරාදෙනිය.

පේරාදෙනිය,
1969. 7. 22.

8–669—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රජයේ ගොවිපලවල හිස් ගෝනි, ටින්, කඩදාසි, පොලිතීන් මලු හා මිරිස් පොතු විකිණීම

පහත සඳහන් ගොවිපලවල තිබෙන පහත සඳහන් වර්ගවල ගෝනි, ටින්, කඩදාසි, පොලිතීන් මලු සහ මිරිස් පොතු ආදිය විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර, යාපනයේ කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගොවිපල පාලන හා නිෂ්පාදන) විසින් 1969.9.5 වැනි දින පෙ. ව. 10 දක්වා භාරගනු ලැබේ:—

(1) වී ගොවිපල, කන්තලේ

| | | |
|---|---|---|
| (අ) | හිස් පොලිතීන් මලු ... ... | 112 |
| (ආ) | හිස් පොහොර ගෝනි ... ... | 350 |
| (ඇ) | හිස් සිමෙන්ති මලු ... ... | 125 |
| (ඈ) | ගැලුම් 1 ප්‍රමාණයේ හිස් ටින් ... | 37 |
| (ඉ) | ගැලුම් 4 ප්‍රමාණයේ හිස් ටින් ... | 5 |
| (ඊ) | ගැලුම් 5 ප්‍රමාණයේ හිස් ටින් ... | 5 |
| (උ) | ගැලුම් 1 ප්‍රමාණයේ කෘමිනාශක හිස් ටින් ... | 86 |

(2) කෘෂිකර්ම ස්ථානය, වවුනියාව

| | | |
|---|---|---|
| (අ) | මිරිස් පොතු ... ... | 12 |
| (ආ) | බුසල් 2½ ප්‍රමාණයේ හිස් ගෝනි ... | 750 |
| (ඇ) | සත්වාහාර හිස් ගෝනි ... ... | 1,000 |
| (ඈ) | රා. 56 ප්‍රමාණයේ කුකුල් කෑම කඩදාසි මලු | 500 |

2. ගොවිපලෙහි වැඩ කරන කාලය තුළදී ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ප්‍රථම ටෙන්ඩර්කරුවන්ට ඒ ඒ ගොවිපල්වලට ගොස් ගොවි කළමනාකරු ඉදිරිපිටදී ඉහත සඳහන් ද්‍රව්‍යයන් පරීක්ෂා කිරීමට අවසර තිබේ. ඒ ඒ ද්‍රව්‍යයන්ට වෙන වෙනම මිල ගණන් සඳහන් කළ යුතුය. මිරිස්වලට පමණක් රාත්තලකට ගෙවිය හැකි මිළ සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩරයකට රු. 10 බැගින් මුදල් තැන්පත් කළ බවට රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට පෙර දින දවල් 12 වන තෙක් යාපනයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. මුදල් තැන්පත් කිරීම පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කළ හැකිය.

4. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචි කළ තැපැලෙන් යාපනයේ ගොවිපල පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි (ගො. පා. හා නි.) තැනට එවිය යුතු අතර එහි කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "රජයේ ගොවිපලවල හිස් ගෝනි, ටින්, කඩදාසි, පොලිතීන් මලු සහ මිරිස් පොතු විකිණීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුයි.

5. පිළිගත් ටෙන්ඩර්කරුට නියමකර ඇති කාල සීමාව ඇතුලතදී සියලුම කොටස් තොගය වෙනුවෙන් ගොවිපල කළමනාකරුට මුදල් ගෙවා එය ඉවත්කර ගැනීමට සිදු වේ. එසේ කිරීමට නොහැකි වුව හොත් එම තොගය වෙනත් විධියකින් විකිණීම සඳහා ක්‍රියා කරන අතර ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කර ඔහුගේ නමද වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයටද ඇතුලත් කිරීමට හේතු වේ. එහෙත් එයින් රජයට ඔහුගෙන් අයවිය යුතු වෙනත් මුදල් ඇතොත් එම අයකරගැනුම්වලට බාධාවක් ඇති නොවේ.

6. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කන්තලේ වී ගොවිපලේ කළමනාකරු හා වවුනියා ගොවිපලේ කළමනාකරු හමුවී හෝ ලිවීමෙන් හෝ දැනගත හැකිය.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපලවල්)

1969.7.30,
පේරාදෙනිය.

8–670—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 1969/70 වර්ෂය තුල බිඳුණුවැව රජයේ ගොවිපලේ තේ අක්කර දෙකක තේ දළු නෙලා ගැනීම

බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් බිඳුණුවැව රජයේ ගොවිපලෙහි ඇති තේ අක්කර දෙකක තේ දළු නෙලා ගැනීම සඳහා 1969 සැප්තැම්බර් මස 15 වෙනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරී තැනගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් පත්‍රවල ටෙන්ඩර් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීම සඳහා රු. 25 ක් තැන්පත් කරන ලද කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මේ මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ අංක 37 දරන කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාගේ ගිණුමට හෝ කළ හැකිය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන විට පොදු ආකෘති පත්‍ර 118 සම්පූර්ණ කර භාර දිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර, මිළ ගණන් ඉලක්කමෙන් ද, අකුරෙන් ද ලිවිය යුතුය. යම් වෙනසක් කළ හොත් එම ස්ථානයේ ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, කෘෂිකර්ම කාර්යාලය, බණ්ඩාරවෙල, යනුවෙන් අමතා ලේඛනගත තැපෑලෙන් එවිය යුතු අතර, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "අක්කර දෙකක තේ දළු නෙලා ගැනීම—බිඳුණුවැව ගොවිපල" කියාද පහළ වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ ලිපිනයද සඳහන් කළ යුතුය.

5. ටෙන්ඩර් කරුවන්ට හෝ ඔහුගේ නියෝජිතයින්ට ටෙන්ඩර් පත් බණ්ඩාරවෙල ගොවිපල් කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට හෝ ඔහුගෙන් බලය ලත් නිලධාරී වෙත පුද්ගලිකව පැමිණ භාර දිය හැකි අතර මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට පුද්ගලිකව පැමිණ බහා ලිය හැක.

6. ලේඛනගත තැපෑලෙන් එවන සියළුම ටෙන්ඩර් පත් ලැබුණු බව ටෙන්ඩර් විවෘත කරන දිනයේම ටෙන්ඩර්කරුවන් වෙත දන්වා එවනු ලැබේ. මෙවැනි දැනුම් දීමක් යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත් විවෘත කර දින 4 ක් ඇතුලත නොලැබුණහොත් ඒ ගැන බණ්ඩාරවෙල කෘෂිකර්ම කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් විමසා බැලිය යුතුය. එවැනි විමසීමකදී ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කළ ටෙන්ඩරය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ද ටෙන්ඩරය එවූ ලේඛන ගත අංකයද සඳහන් කළ යුතුය.

7. ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 15 වෙනි දින ප. ව. 1.00 දක්වා නිකුත් කරනු ලැබේ. නියමිත ටෙන්ඩර් පෝර්මයේ ලියා නැති හෝ නියමිත කොන්දේසිවලට පටහැනි සියළුම ටෙන්ඩර්, ටෙන්ඩර් පත් ලෙස සලකනු නොලැබේ.

8. තෝරාගත් ටෙන්ඩර්කරුවාට තමාගේ ටෙන්ඩරය පිළිගත් බව දන්වා සති දෙකක් ඇතුලත අවශ්‍ය ඇප තැන්පත් කර සේවාව භාර ගැනීම සඳහා ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එසේ කිරීමට නොහැකි වුවහොත් එම ටෙන්ඩර් කරුවාගේ නම වැඩ පැහැර හැරිය ටෙන්ඩර් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කරනු ලැබේ. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවා ටෙන්ඩරයේ වටිනාකමින් 5% ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. මේ තැන්පත් කිරීම ඉහත සඳහන් ස්ථානයන්හිදී කළ හැකිය.

9. යම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ වගකීම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

10. මෙම තේ දළු නෙලා ගැනීමේ වර්ෂය 1969 ඔක්තෝබර් මස 1 වෙනි දිනෙන් පටන් ගෙන 1970 සැප්තැම්බර් මස 30 වන දිනෙන් අවසන් වේ. මෙම කාලය ඇතුලත එම ඉඩමේ වගාවට කෙරෙන අතරතුර සාත්තු සියල්ලම ගොවිපළ මඟින් කෙරෙනවා ඇත. කොන්ත්‍රාත්කරු විසින් තේ දළු නෙලා ගැනීම පමණක් කළ යුතු අතර වෙනත් කිසිම වැඩක් නොකළ යුතුය. මේ සම්බන්ධයෙන් බිඳුණුවැව ගොවිපල කළමනාකාර තැන විසින් කොන්ත්‍රාත්කරුට දෙන සෑම නියෝගයක්ම, උපදෙසක්ම පිළිපැදිය යුතු අතර, මේ සම්බන්ධයෙන් ගොවිපල කළමනාකාර තැන විසින් කොන්ත්‍රාත් කරු පිළිබඳව යම් පැමිණිල්ලක් කළහොත් ඒ පිළිබඳව පරීක්ෂා කර බලා කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතු ඇතොත් ඒ එසේම කරනු ලැබේ.

11. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් කෙනෙකු සමග ඇතුලත්ව ඇති අය සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

12. පත් කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවන් එම සේවාව සඳහා "ලාංකික" කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකික" යනුවෙන් සඳහන් වනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අයයි.

13. ටෙන්ඩර්කරුවාට භාර දිය යුතු සියළුම දන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වහොත් එය ඔහුගේ අතට දුන්නා සේ සැලකිය යුතුයි.

14. මේ පිළිබඳ තවත් තොරතුරු අවශ්‍ය වන්නේ නම් බණ්ඩාර වෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරී තැනගෙන් හෝ බිඳුණුවැව ගොවිපලේ කළමනාකාර තැනගෙන් හෝ දැන ගත හැකිය.

15. මෙම තේ අක්කර දෙක පරීක්ෂා කිරීමට යම් අයෙකුට අවශ්‍ය වන්නේ නම් ගොවිපල කළමනාකාර තැන හමුව අවසර ගෙන පරීක්ෂා කළ හැක. මෙය කාර්යාල දිනයකදී කාර්යාල වේලාවන් තුලදී පමණක් කළ හැකිය.

පී. ටී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘ. ආ. හා ගො.)
පේරාදෙනිය.

1969. 7. 25,
පේරාදෙනිය.

8–671—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කොළඹ-නුවර පාරේ 37 වෙනි සැතපුම් කනුව අසල කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානයක් ඉදි කිරීම

ඉහත සඳහන් ගොඩනැගිල්ල තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.9.8 වැනි දින පස්වරු 2.30 වනතුරු ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457 දරණ ස්ථානයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැක.

3. ටෙන්ඩර්කරුවන් රුපියල් 35,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1969.8.25 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ :—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරන ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙනුවට.

1969 අගෝස්තු මස 3 වෙනි දින,
සිවිල් ඉංජිනේරු අංශය,
අංක 457, ගාලු පාර,
කොළඹ 3.

8–702—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**1969-70 මුදල් වර්ෂය තුළදී කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය සැපයීම**

1969-70 මුදල් වර්ෂය තුළදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට කෘෂිකාර්මික රසායන ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969. 9. 5 වැනි දින ප. ව. 2.30 දක්වා පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ. වැඩි විස්තර සඳහා මෙම ගැසට් පතේ පළ වී ඇති ඉංග්‍රීසි දැන්වීම බලන්න.

ජී. වී. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපළ)

69. 8. 2 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

8–672—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**දකුණු කළුතර දුම්රියාංගනයේ පිහිටි පූර්ව නිර්මිත ගබඩාව අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් දැන්වීම**

කළුතර දිස්ත්‍රික්කයේ දකුණු කළුතර පූර්ව නිර්මිත ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා 1969 අගෝස්තු මස 29 වෙනි සිකුරාදා ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් 250 ක් තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර, කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගණකාධිකාරීට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 අගෝස්තු මස 28 වෙනි දින දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින කොන්ත්‍රාත්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල් වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 අගෝස්තු මස 15 වෙනි දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

9–800—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

කොළඹ, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, පහත සඳහන් හාල් මෝල්හි, 1969.10.1 සිට 1970.9.30 කාලසීමාව තුල නිපදවන නිවුඩු අංක 2 හා අංක 3 මිලදී ගෙනයාම සඳහා කැඳවනු ලබන ටැන්ඩර් 1969 සැප්තැම්බර් 5 වෙනි සිකුරාදා පස්වරු 2.30 වනතෙක් බාරගනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (1) | හාල් පාහින ස්ථානය ... | නිකවැරටිය ... | හලර් නිවුඩු අංක 2 |
| (2) | එම ... | මාහෝ ... | එම |
| (3) | එම ... | කලාවැව ... | එම |
| (4) | එම ... | තනාතන් ... | එම |
| (5) | රජයේ හාල් මෝල ... | අනුරාධපුර ... | නිවුඩු අංක 2 |
| (6) | එම ... | අම්බලන්තොට ... | එම |
| (7) | එම ... | මඩකලපුව ... | එම |
| (8) | එම ... | චවලකඩෙ ... | කාර්ගෝ නිවුඩු අංක 3 |
| | එම ... | එම ... | නිවුඩු අංක 2 |

2. එක් එක් හාල් මෝලක නිවුඩු සඳහා දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝටන් පෙදෙස කාර්යාල යෙහි ගණකාධිකාරී තැනට රු. 50 බැගින් තැන්පත් මුදලක් ගෙවා ලබා ගන්නා ලද කුවිත්තාන්සියක් අංක 42 ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ ප්‍රධාන කාර්යාලයෙහි නි.මි.යෝ.ක්‍රා. හා වී.කෙ. අංශයට ඉදිරිපත් කර, 1969 සැප්තැම්බර් 5 වෙනි සිකුරාදා දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටැන්ඩර් පත් ලබාගෙන අනු පිටපතක්ද සහිතව පුරවා එවිය යුතුය.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ ඒ ඒ දිස්ත්‍රික්කයන්හි සහකාර ගොවිජන සේවා කොමසාරිස්වරුන්ගෙන් විමසා දැන ගත හැක.

වී. තී. නිවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 අගෝස්තු මස 15 වැනි දින,
තැ.පෙ. 537, කොළඹ 7.

8–793—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**තිරිකුණාමල දිස්ත්‍රික්කයේ පාන්කුලම්හි නි. මි. යෝ. ක්‍රා. ගබඩා තැනීම සඳහා ටෙන්ඩර්**

තිරිකුණාමලය දිස්ත්‍රික්කයේ පාන්කුලම්හි නි. මි. යෝ. ක්‍රා. ගබඩා තැනීම සඳහා 1969 සැප්තැම්බර් මස 5 වෙනි සිකුරාදා ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් 250 ක් තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර, කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60, දරණ ස්ථානයේ ගනකාධිකාරීට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ හැක.

3. රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවනට පමණක් "කොන්ත්‍රාත්කරුවන්ගේ සටහන් පොත" ඉදිරිපත් කිරීමෙන් 1969 සැප්තැම්බර් මස 4 වෙනි දින දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර්කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගත හැක.

වී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 සැප්තැම්බර් මස 15 දින,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

8–799/1—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**මහනුවර දිස්ත්‍රික්කයේ උඩවෙල නි. මි. යෝ. ක්‍රා. ගබඩාව තැනීම සඳහා ටෙන්ඩර්**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩවෙල නි. මි. යෝ. ක්‍රා. ගබඩා තැනීම සඳහා 1969 සැප්තැම්බර් මස 5 වෙනි සිකුරාදා ප. ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. රුපියල් 250 ක් තැන්පත් කර ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර, කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබා ගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60

8. කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කව රෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකා වල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. " ලාංකික " යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය. " ගොවිජන සේවා සහකාර කොමසාරිස් " යනුවෙන් හැඳින් වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුර දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 අගෝස්තු මස 31 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

පීටර් ද සිල්වා,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කළුතර දිස්ත්‍රික්කය.

කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා
සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1969 අගෝස්තු මස 6 වැනි දින දීය.

8–744—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම

පැයට ගැලුම් 1,500 ක ධාරිතාවයකින් යුත් විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 69. 9. 5 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් සැපයීම කළ යුත්තේ (ඒ) තිබෙන තොගයෙන්/ආනයනය කරන තොගයෙන් හෝ (බී) ආනයනයකර කිරුළපනේ මධ්‍යම ගබඩාවට භාරදීමටත් ය. ටෙන්ඩර්කරුවන් විසින් භාරදිය හැකි ඉතාම තුදුරු කාල සීමාව සඳහන් කළ යුතුය.

3. 69. 9. 4 වෙනි දින දාවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාතීමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරන ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ " විදුලියෙන් ක්‍රියා කරවන වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන්, පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වේනොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.9.5 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 69. 8. 8.
සීපී/2/378

8–795—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පැයට ගැලුම් 4,500 ක් පමණ ධාරිතාව ඇති සුවහනීය පොම්ප 20 ක් සැපයීම

පැයට ගැලුම් 4,500 ක් පමණ ධාරිතාව ඇති සුවහනීය පොම්ප 20 ක් සැපයීම සඳහා ටෙන්ඩර් 1969. 8. 29 දින පෙරවරු 11. 00 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් සැපයීම කළයුත්තේ (ඒ) තිබෙන තොගයක් හෝ (බී) ඇනවුම් කර ඇති තොගයකින් කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාර දීමටය. ටෙන්ඩර්කරුවන් විසින් භාරදිය හැකි ඉතාම තුදුරු කාල සිමාව සඳහන් කළ යුතුය.

3. 1969. 8. 28 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාතීමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරන ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 50 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ " වතුර පොම්ප 20ක් සැපයීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු වේදී 1969. 8. 29 වැනි දින පෙරවරු 11.00ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැන විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීඑ/1/446,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1969. 8. 6.

8–796—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### මාතලේ ඕවලවත්ත ජනපදයට නල මඟින් ජලය සැපයීම

වර්ෂ 1969 සැප්තැම්බර් මස 5 වෙනි දින පස්වරු 2.30 දක්වා මෙහි ඉහත සඳහන් වැඩය සඳහා කොළඹ 1, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. නැතහොත් ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ 3 වෙනි මාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති පෙට්ටියේ බහාලිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර මාතලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් 1969 අගෝස්තු මස 31 වෙනි දින පෙ. ව. 10.30 වන තෙක් ලබාගත හැක. මෙසේ ලබාගන්නා ටෙන්ඩර් පෝරම හැර වෙනත් ටෙන්ඩර් පෝරමවලින් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර හා ටෙන්ඩර් දැන්වීමේ සඳහන්ව ඇති කොන්දේසිවලට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරණු ලැබේ.

4. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ ඉඩම් කොමසාරිස් කාර්යාලයේ හෝ ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 100 ක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය. ටෙන්ඩර් පෝර්ම පිටපත් දෙකකින් යුක්තව එවිය යුතු අතර, එසේ එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මුද්‍රාතබන ලද කවරයක බහා එවිය යුතුයි. ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරයේ නම සඳහන් කළ යුතුයි.

5. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩර් පත්‍රයේ මුළු මුදලින් සියයට 5ක මුදලක් ඇප වශයෙන් තැබිය යුතුයි. එසේම ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බවට දැනුම් දීමෙන් දින හතක් ඇතුළත දී වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට සූදානම්ව සිටිය යුතුයි. ටෙන්ඩරය භාරගත් බව සඳහන් වන ලියවිල්ල ඔහුට පුද්ගලිකව භාර දීමෙන් හෝ ඔහු විසින් දී ඇති ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහුට ඒ බැව් දැන්වූ බව පිළිගන්නවා ඇත. මෙසේ දැනුම් දීමෙන් පසුව ගිවිසුම් පත්‍රය අත්සන් තැබීම අතපසු කළහොත් හෝ ප්‍රතික්ෂේප කළ හොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නොදක්වා සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ ටෙන්ඩර් මණ්ඩලය සතුය.

7. මාතලේ දිසාපති තැනගෙන් අවසරයක් නොලබා වැඩ ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ භාර දීමට හෝ පුළුවන් කමක් නැත. එසේම පත්කරණු ලබන ටෙන්ඩර්කරු වැඩය කරන ප්‍රදේශයේ අවශ්‍යතාවයේ හැටියට පුහුණු හෝ නුපුහුණු හෝ ලාංකික කම්කරුවන් සේවය සඳහා යෙදවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක්කේ ලියා පදිංචි කළ කොන්ත්‍රාත් කරුවන්ට ඔවුන්ගේ ලියා පදිංචි සහතිකය ඉදිරිපත් කිරීමෙන්ය. ලියාපදිංචි නොවූ අය තමාට රු. 50,000 වටිනා කොන්ත්‍රාත්තුවක් කිරීමට හැකියාවක් ඇති බවට ප්‍රදේශීය ආදායම් නිලධාරී තැනගෙන් සහතිකයක් ඇතිව පැමිණිය යුතුයි.

9. ලියා පදිංචි සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නැත. නමුත් සමිති ලියා පදිංචි කළ බවට හා වැඩය භාරගෙන කිරීමට හැකියාවක් ඇති බවට ද ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය නිලධාරීන් ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. තවද, වැඩය භාර ගෙන කිරීමට සතුටු බව ප්‍රකාශ කරණ සමිතියේ සම්මත කරගත් වාර්තාවක පිටපතක් ද ඉදිරිපත් කළ යුතුයි.

10. වැඩි විස්තර අවශ්‍යනම් මාතලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් ලබාගත හැක.

ජේ. එච්. එම්. අබේකෝන්,
මාතලේ දිසාපති වෙනුවට.

1969. 8. 3 වෙනි දින,
මාතලේ දිසාපති කාර්යාලයේදිය.

8–754—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

### කොළඹ වාප්පුවේ සිට ගබඩාවන් වෙත ආහාර ද්‍රව්‍ය නොයෙකුත් තොගයන් ලොරිවලින් ප්‍රවාහනය කිරීම (විශේෂ ප්‍රවාහණ කොන්ත්‍රාත්තුව) සඳහා ටෙන්ඩර් කැඳවීම—1969/70

1969. 10. 1 දින සිට 1970. 9. 30 දින දක්වා කාලය තුළදී සහල්, පිටි, සීනි හා වෙනත් ආහාර ද්‍රව්‍යයන් කොළඹ වාප්පුවේ සිට ගබඩාවන් වෙත ලොරිවලින් ප්‍රවාහණය කිරීම පිළිබඳ විශේෂ කොන්ත්‍රාත්තුව යටතේ ලොරි සැපයිය හැකි ප්‍රවාහකයින්ගෙන් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 සැප්තැම්බර් 12 දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම කොන්ත්‍රාත්තුව යටතේ කොළඹ වරායේ නැවක ඇති ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය කොළඹ පිහිටි ආහාර දෙපාර්තමේන්තුවේ ගබඩාවන් වෙත ලොරිවලින් ප්‍රවාහණය කිරීමේ වගකීම ප්‍රවාහණ කොන්ත්‍රාත්කරුට පැවරෙන අතර, මෙම නැවෙහි ආහාර ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීම සඳහා අවශ්‍ය සම්පූර්ණ ලොරි රථ සංඛ්‍යාව සැපයීම කොන්ත්‍රාත්කරුගේ වගකීම වන්නේ ය. තවද, මෙම කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරු විසින් කාලගුණය යහපත්ව පවතින අන්දම අනුව වරායේ වැඩ කරන පැය දාහතක දිනයකට අඩුම සාමාන්‍ය වශයෙන් ආහාර ද්‍රව්‍ය ටොන් 800 ක් වත් බැගින් ප්‍රවාහණය කළ යුතුය. දිනකට ප්‍රවාහණය කළ යුතු අඩුම සාමාන්‍ය වන ටොන් 800 බැගින් ප්‍රවාහණය කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වුවහොත් වරාය සංයුක්ත මණ්ඩලයට ගෙවිය යුතු වන කම්කරු කණ්ඩායම් ප්‍රමාද නාස්තු කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතුය. දිනකට ටොන් 1,200 ට වැඩියෙන් ප්‍රවාහණය කරන අවස්ථාවලදී එම ටොන් 1,200 ට වැඩියෙන් ප්‍රවාහණය කරනු ලබන සෑම ටොන් එකකටම ටොන් එකක් ප්‍රවාහණය කිරීමට එකඟවූ ගාස්තුවෙන් 25% ක අතිරේක ගෙවීමක් ද කරනු ලැබේ.

3. කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ පිහිටි ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1969. 9. 11 දින දහවල් 12.00 දක්වා රු. 300 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කිරීමෙන් ලබාගත හැකි පෝර්මවල දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

4. වැඩි විස්තර ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
ආහාර කොමසාරිස්.

1969 අගෝස්තු මස 7 දින,
කොළඹ 2,
330, යූනියන් පෙදෙසේ,
ආහාර කොමසාරිස් කාර්යාලයේදිය.

8–865/1—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

### කොළඹ වාප්පුවේ සිට ගබඩාවන් වෙත ලොරි වලින් ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම පිණිස ටෙන්ඩර් කැඳවීම

1969. 10. 1 දින සිට 1970. 9. 30 දින දක්වා කාලය තුළදී සහල්, සීනි පිටි හා වෙනත් ආහාර ද්‍රව්‍යයන් කොළඹ වාප්පුවේ සිට කොළඹ පිහිටි ගබඩාවන් වෙත ලොරි වලින් ප්‍රවාහනය කිරීම සඳහා 1969.9.5 දින ප. ව. 2.30 දක්වා කොළඹ 2, යුනියන් පෙදෙසේ, අංක 330 දරණ ස්ථානයේ, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ තමන් සන්තකව අඩු වශයෙන් ලොරි රථ දෙකක්වත් අයිති ප්‍රවාහකයින්ගෙන් පමණකි. තවද, ඔවුනට පැවරෙන ප්‍රවාහන කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන අතිරේක ලොරි රථ ප්‍රමාණය සැපයීමට ඔවුනට හැකියාව තිබිය යුතුය.

3. කොළඹ 2, යුනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයේන් 1969. 9. 4 දින දවල් 12.00 දක්වා රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ඉහත "2" වන ඡේදයේ සඳහන් කරුණු පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කොට ලබාගත හැකි ෆෝරම්වල දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. වැඩි විස්තර ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
ආහාර කොමසාරිස්.

1969 අගෝස්තු මස 7 දින,
කොළඹ 2,
330, යුනියන් පෙදෙසේ,
ආහාර කොමසාරිස් කාර්යාලයේ දිය.

8–865/2—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ගාළු රේගුවේ සිට ගබඩාවන් වෙත ආහාර ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම පිණිස ටෙන්ඩර් කැඳවීම

1969. 10. 1 දින සිට 1970. 9. 30 දින දක්වා කාලය තුළදී සහල්, සීනි, පිටි හා වෙනත් ආහාර ද්‍රව්‍යයන් ගාල්ල රේගුවේ සිට ගාළු දිස්ත්‍රික්කය තුළ පිහිටි ආහාර ගබඩාවන් වෙත ලොරිවලින් ප්‍රවාහනය කිරීම සඳහා 1969.9.4 දින ප. ව. 2.30 දක්වා කොළඹ 2, යුනියන් පෙදෙසේ, අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ තමන් සන්තකව අඩු වශයෙන් ලොරි රථ දෙකක්වත් අයිති ප්‍රවාහකයින්ගෙන් පමණකි. තවද, ඔවුනට පැවරෙන ප්‍රවාහන කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන අතිරේක ලොරි රථ ප්‍රමාණය සැපයීමට ඔවුනට හැකියාව තිබිය යුතුය.

3. කොළඹ 2, යුනියන් පෙදෙසේ, අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1969. 9. 2 දින දවල් 12.00 දක්වා රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ඉහත "2" වන ඡේදයේ සඳහන් කරුණු පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කොට ලබාගත හැකි ෆෝරම්වල දෙපිටපතකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. වැඩි විස්තර ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
ආහාර කොමසාරිස්.

1969 අගෝස්තු මස 7 දින,
කොළඹ 2,
330, යුනියන් පෙදෙස,
ආහාර කොමසාරිස් කාර්යාලයේ දීය.

8–865/3—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ගාල්ල උප කොටස

1969 සැප්තැම්බර් 6 වැනි සෙනසුරාදා පෙරවරු 10 දක්වා තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රු. 18,000කට ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි සමිතිද ඇතුළුව මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

(1) ගාලු දිස්ත්‍රික්කයේ මත්තක, බෙරවපොත අමුණ තැනීම.

3. 1969 සැප්තැම්බර් 4 වන දින දවල් 12 වන තෙක් කාර්යාල වේලාවන් තුළදී මාතර, ගාල්ල, තිස්ස සහ හම්බන්තොට වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් ඉදිරිපත් කළ යුතුයි. ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. මේ ටෙන්ඩර් ගැන වැඩිපුර විස්තර කාර්යාල වේලාවන් තුළදී ගාල්ල උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

ජේ. එම්. ඩී. එල්. සෙනෙවිරත්න,
වාරිමාර්ග ඉංජිනේරු,
ගාල්ල උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
ගාල්ල, 69. 8. 6.

8–741—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### මාතලේ උප කොට්ඨාශය

මාතලේ උප කොට්ඨාශය යටතේ 1969 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට පටන් ගැනෙන 1969-70 හා 1970-71 යන මුදල් වර්ෂ දෙක තුල ගබඩා ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් පත් 1969 සැප්තැම්බර් මස 5 වැනි දින පෙ. ව. 10 දක්වා නත්තරම්පොත, කුණ්ඩසාලේ මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රු. 20,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති පමණක් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුස්සන් වේ. අයදුම්කරුවන් යටත් පිරිසෙයින් ලොරි දෙකක්වත් හිමිකරුවන් විය යුතු අතර, අවශ්‍ය වුවහොත් ලොරි ධාවනය කල නොහැකි මාර්ගවල බඩු ප්‍රවාහනය කිරීම සඳහා ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් ලබාගත හැකි අයවලුන් විය යුතුයි.

3. අයදුම් කරුවන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට ප්‍රථම තමන් සතු ලොරි ලියා පදිංචි කිරීමේ කාඩ්පත් සහ 1969 වර්ෂයට ලබා ගත් වාහන බල පත්‍රද ඉදිරිපත් කළ යුතුයි.

4. 1969 අගෝස්තු මස 15 වෙනි දින සිට 1969 සැප්තැම්බර් මස 4 වැනි දින දක්වා කාර්යාල වේලාවන් තුලදී මාතලේ, මහනුවර, නුවරඑළිය සහ හසලක වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලින් ලබා ගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් සඳහා ඉදිරිපත් වන ඉල්ලුම්කරුවන් ඔවුන් කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනා කම් දැක්වෙන ප්‍රකාශනයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ෆෝරම නිකුත් කිරීමට ප්‍රථම ඒ සඳහා රු. 25 ක මුදලක් තැන්පත් කළ යුතුයි. තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ සඳහා ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

5. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් ෆෝරම් ලබාගැනීමට මුදල් තැන්පත් කිරීමට අනවශ්‍යයය.

6. ටෙන්ඩර් සඳහා වැඩිමනත් විස්තර මාතලේ ඉංජිනේරු තැන ගේ කාර්යාලයෙන් කාර්යාල වේලාවන්හිදී ලබා ගත හැක.

සී. කනගලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු, මාතලේ ද. කො.

1969 අගෝස්තු මස 6 වැනි දින,
මාතලේ වාරිමාර්ග කාර්යාලයේ දී ය.

8–791—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### අඳ-බිහිරි වැඩපොල—සීදූව

1969 ඔක්තෝබර් 1 වන දින සිට 1970 සැප්තැම්බර් 30 වන දින දක්වා ඉහත සඳහන් ආයතනයේ නේවාසිකාගාරයට පාන්, ආප්ප සහ රසකැවිලි සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පහත අත්සන් තබා ඇති අය විසින් 1969 සැප්තැම්බර් 7 වෙනි ඉරිදා පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ කොළඹ, සමාජ සේවා අධ්‍යක්ෂගේ කාර්යාලයේ රු. 25 ක මුදලක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය පහත අත්සන් තබා ඇති අය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවලය. මෙය පිළිබඳ වැඩිපුර විස්තර සීදූවේ අඳ-බිහිරි වැඩපොළේ අධිකාරීගෙන් ලබාගත හැකිය.

අ. ම. මූ. සහබ්දීන්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

1969. 8. 15,
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 577,
කොළඹ.

8–870/1—69.8.15 වැනි දින අංක 14,867 දරණ ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### අඳ-බිහිරි වැඩපොල—සීදූව

1969 ඔක්තෝබර් 1 වන දින සිට 1970 සැප්තැම්බර් 30 වන දින දක්වා ඉහත සඳහන් ආයතනයේ කිළිටි රෙදි පිරිසිදු කිරීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් පහත අත්සන් තබා ඇති අය විසින් 1969 සැප්තැම්බර් ,7 වෙනි ඉරිදා පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ කොළඹ, සමාජ සේවා අධ්‍යක්ෂගේ කාර්යාලයේ රු. 25 ක මුදලක් තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය පහත අත්සන් තබා ඇති අය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවලය. මෙය පිළිබඳ වැඩිපුර විස්තර සීදූවේ අඳ-බිහිරි වැඩපොළේ අධිකාරීගෙන් ලබාගත හැකිය.

අ. ම. මූ. සහබ්දීන්,
සමාජ සේවා අධ්‍යක්ෂ.

1969. 8. 15,
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 577,
කොළඹ.

8–870/2—69.8.15 වැනි දින අංක 14,867 දරණ ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### කොග්ගල, මීරිගම, අනුරාධපුර, කයිතඩි යන ස්ථානයන්හි පිහිටි රජයේ මහළු නිවාසවලට සේවාවන් හා ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්

මෙහි උපලේඛනයෙහි දෙවන තීරුවෙහි සඳහන් කොට ඇති සේවාවන් හා ද්‍රව්‍යයන්, 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වන දින දක්වා වූ කාලය තුළ සැපයීම සඳහා, මුද්‍රා තබා ඉදිරිපත් කැරෙන ටෙන්ඩර සමාජ සේවා අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලයෙන් හෝ කොග්ගල, මීරිගම, අනුරාධපුර සහ කයිතඩි යන මහලු නිවාසවලින් ඉල්ලීම් අනුව සපයනු ලබන ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවෙහි අවශ්‍ය නම් කොන්ත්‍රාත්තුව අදාල කොන්දේසි ටෙන්ඩර කරුවනට තේරුම් කර දෙනු ඇත. මෙහි උපලේඛනයෙහි දක්වා ඇති එක් සේවාවකට හෝ ඊට වැඩි ගණනකට ටෙන්ඩරකරුවනට ටෙන්ඩර පත් ඉදිරිපත් කළ හැකිය. එක් එක් මහලු නිවාසයට එක් එක් සේවාවක් හෝ සැපයීමක් සඳහා ටෙන්ඩර වෙන් වෙන් වශයෙන් ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය.

3. ටෙන්ඩර භාරගැනීම 1969 අගෝස්තු මස 29 වැනි දින දවල් 12ට අවසන් වන අතර, එදිනම පස්වරු 2.30ට ඒවා විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර විවෘත කරන වේලාවෙහිදී ටෙන්ඩරකරුවනට මෙම ස්ථානයට පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම හා ඔවුන් ඉදිරිපත්කොට ඇති ගාස්තු ප්‍රමාණයන්ද එසේ පැමිණ සිටින ටෙන්ඩරකරුවන් ඉදිරියෙහි කියවනු ලබනවා ඇත.

4. කිසිදු ටෙන්ඩර ආකෘති පත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම, මෙහි උපලේඛනයෙහි තුන්වන තීරුවෙහි නියමිත ඇප මුදල මෙම කාර්යාලයෙහි හෝ කොග්ගල, මීරිගම, අනුරාධපුරය, කයිතඩි යන ස්ථානයන්හි පිහිටි රජයේ මහලු නිවාසයක අධිකාරි වෙත හෝ තැන්පත් කොට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. මෙම ආකෘති පත්‍ර තැපැලෙන් ඉල්ලා සිටින අය එසේ ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර භාරගන්නා අවසන් දිනට කලින් තම ටෙන්ඩරය ඉදිරිපත් කිරීමට තරම් කල් ඇතිව එම නියමිත ප්‍රමාණයට මුදල් ඇණවුමක් සමාජ සේවා අධ්‍යක්ෂට ලැබෙන සේ මෙම කාර්යාලයට එවිය යුතුය.

ප්‍රතික්ෂේප කරනු ලැබූ ටෙන්ඩර්කරුවන්ගේ ඇප මුදල් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර්කරුවන්ට කැමැත්තේ නම් ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. එසේ නැතිනම් ඒවා ලියාපදිංචි කළ තැපැලෙන් ''සමාජ සේවා අධ්‍යක්ෂ, බාලදක්ෂ මාවත, කොළඹ 3'' යන ලිපිනයට එවිය හැකිය. ''1969–70 වර්ෂයට ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම සඳහා වූ ටෙන්ඩරය.........(මහළු නිවාසයේ නම ලියන්න) රජයේ මහළු නිවාසය'' යන පාඨය ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ ලිවිය යුතුය.

6. ටෙන්ඩර්කරුවන් විසින් නියමිත ටෙන්ඩර පත් සෑම අයුරින්ම සම්පූර්ණව පිළියෙල කිරීමට වග බලාගත යුතු වේ. නියමිත අන්දමට පිළියෙල කර නොමැති ටෙන්ඩර ප්‍රතික්ෂේප කිරීමට සමාජ සේවා අධ්‍යක්ෂට බලය තිබේ.

7. යම් ටෙන්ඩර්කරුවෙකුගේ ටෙන්ඩරය භාරගත් බවට ඔහුට දැනුම් දීමෙන් පසු ඔහු විසින් කොන්ත්‍රාත්තුවට බැඳීම ප්‍රතික්ෂේප කළහොත්, නැතහොත් එය පැහැර හැරියහොත්, එසේත් නැතිනම් අවශ්‍ය අවස්ථාවේදී ඇප මුදල තැන්පත් නොකළහොත්, ඔහුගේ ටෙන්ඩර ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

8. යම් ටෙන්ඩරයක් නොහොත් සියලුම ටෙන්ඩර කිසිදු විරුද්ධකමකට ඉඩ නොමැතිව ප්‍රතික්ෂේප කරන්නටත්, අවුරුද්දකට නොවැඩි ඕනෑම කාලසීමාවකට යම් ටෙන්ඩරයක් පිළිගන්නටත් ආණ්ඩුවට බලය තබා ගනු ලැබේ.

සී. නිත්කුණානන්දන්,
සමාජ සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
බාලදක්ෂ මාවත,
කොළඹ 3,
1969 අගෝස්තු මස 7 දින දිය.

## උපලේඛනය

| (1) ආයතනයේ නම | (2) සැපයෙන ද්‍රව්‍යය හෝ සේවය | (3) ටෙන්ඩර් ඇප මුදල රු. | (4) ඇපය |
|---|---|---|---|
| 1. මීරිගම රජයේ මහළු නිවාසය | දර ප්‍රවාහනය කිරීම | 10 | රු. 100 කොන්ත්‍රාත්තුව පටන් ගැනීම සඳහා ගිවිසුමකට බැඳීමකට ප්‍රථම ඇප මුදල සම්පූර්ණ කිරීමට තවත් රු. 90 ක් තැන්පත් කිරීමට පිළිගත් ටෙන්ඩරය හිමි ටෙන්ඩර්කරුට නියම කරනු ලබනවා ඇත. |
| 2. කයිතඩි රජයේ මහළු නිවාසය | එම | 10 | |
| 3. අනුරාධපුර රජයේ මහළු නිවාසය | එම | 10 | |
| 4. කොග්ගල රජයේ මහළු නිවාසය | මිනීපෙට්ටි සැපයීම | 10 | රු. 25 කොන්ත්‍රාත්තුව පටන් ගැනීම සඳහා ගිවිසුමකට බැඳීමට ප්‍රථම ඇපමුදල සම්පූර්ණ කිරීමට තවත් රු. 15 ක් තැන්පත් කිරීමට පිළිගත් ටෙන්ඩරය හිමි ටෙන්ඩරකරුට නියම කරනු ලබනවා ඇත. |
| 5. මීරිගම රජයේ මහළු නිවාසය | එම | 10 | |
| 6. අනුරාධපුර රජයේ මහළු නිවාසය | එම | 10 | |
| 7. කයිතඩි රජයේ මහළු නිවාසය | එම | 10 | |
| 8. කොග්ගල රජයේ මහළු නිවාසය | කිළිටි රෙදි පිරිසිදු කිරීම | 25 | රු. 100 කොන්ත්‍රාත්තුව පටන් ගැනීම සඳහා ගිවිසුමකට බැඳීමට ප්‍රථම ඇප මුදල සම්පූර්ණ කිරීමට තවත් රු. 75 ක් තැන්පත් කිරීමට පිළිගත් ටෙන්ඩරය හිමි ටෙන්ඩර් කරුට නියම කරනු ලබනවා ඇත. |
| 9. මීරිගම රජයේ මහළු නිවාසය | එම | 25 | |
| 10. අනුරාධපුර රජයේ මහළු නිවාසය | එම | 25 | |
| 11. කයිතඩි රජයේ මහළු නිවාසය | එම | 25 | |
| 12. කොග්ගල රජයේ මහළු නිවාසය | නිවාසයේ නේවාසිකයින්ගේ දළිරැවුල් හා කොණ්ඩා කැපීම සඳහා අර්ධකාල කරනැවැමියෙකුගේ සේවය | 10 | රු. 50 කොන්ත්‍රාත්තුව පටන් ගැනීම සඳහා ගිවිසුමකට බැඳීමට ප්‍රථම ඇප මුදල සම්පූර්ණ කිරීමට තවත් රු. 40 ක් තැන්පත් කිරීමට පිළිගත් ටෙන්ඩරය හිමි ටෙන්ඩරකරුට නියම කරනු ලබනවා ඇත. |
| 13. මීරිගම රජයේ මහළු නිවාසය | එම | 10 | |
| 14. අනුරාධපුර රජයේ මහළු නිවාසය | එම | 10 | |
| 15. කයිතඩි රජයේ මහළු නිවාසය | එම | 10 | |

8-801—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්සී 2/26/69.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ශල්‍ය අත්වැසුම් සැපයීම සඳහා ටෙන්ඩර්

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ශල්‍ය අත්වැසුම් සැපයිම සඳහා පහත සඳහන් උපලේඛණයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(I) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ ;

(II) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින් ;

(III) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින් ;

(IV) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගොස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ.පෙ. 584 හිමි කොළඹ, රැජින වීදියේ සෙලින්කෝ මන්දිරයේ පස්වෙනි මාලයේ/දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1969 ඔක්තෝබර් 14 වන දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ —

(I) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම් වලින් ;

(II) I වැනි ඡේදයේ (IV) වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයන්ට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඔස්ට්‍රෙලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිතයින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයින්ට පැමිණීමට ඉඩදෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

එන්. කේ. පී. විජයසිංගම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1969 අගෝස්තු මස 6 වැනි දින,
කොළඹ.

### අදල උපලේඛනය

### SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | | *Estimated Requirements* | *Packing Required* |
|---|---|---|---|---|
| 1 .. | Surgical Gloves—rough type Size 7½ | | 72,000.. Pairs | In any convenient packing. |
| 2 .. | do. | Size 7 .. | 64,000.. | do. |
| 3 .. | do. | Size 6½ .. | 40,000.. | do. |
| 4 .. | do. | Size 8 .. | 4,000.. | do. |
| 5 .. | do. | Size 6 .. | 6,000.. | do. |

8-743—69.8.15 දින අංක 14,867 දරණ ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1969 ඔක්තෝබර් මස පළමු වැනි දින සිට 1970 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබත ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(1) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළයුතුය.

(II) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව එවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, කොළඹ " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මා විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරනලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙණෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(I) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(II) **කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(III) **පළාත්පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත්පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(IV) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

වෛද්‍ය එච්. සී. ගෝමස්,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී.

1969.8.6.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කොළඹ.

### උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | මසකට රෙදි සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කෑලිගණන සාමාන්‍යයෙන් | ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|
| **1. අවිස්සාවේල්ල රෝහල** | | | | | |
| කොටස් අංක 1 | | | | | |
| සාමාන්‍ය වාට්ටු 11, කායසීාලය, මුළුතැන්ගෙය, හෙදි නිවාසය, දන්ත චිකිත්සාගාරය ... ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,873 | 1969.9.1 දින පෙ. ව. 10ට |
| කොටස් අංක 2 | | | | | |
| ළමා වාට්ටු, ගර්භනී මාතෘ වාට්ටු, ශල්‍යාගාරය ... ... | 100 ... | 200 ... | දිනපතා ... | 1,823 | |

8–703—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1969–70 ගබඩා බඩු ඇදීම

**සේවය සහ ටැන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්**.—මේ කාර්‍යාලයෙන් හෝ මෙහි මතු 2 වන ඡෙදයේ සඳහන් කාර්‍යාලවලින් හෝ ඉල්ලා ලබා ගත යුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි 1969.10.1 වනදා සිට 1970.9.30 වනදා දක්වා වකවානුව තුළ දුම්රිය පොළෙන්/පොළවලින්/පොළවලට/පොළට ආයතනවලින්/ආයතනවලට/කාර්‍යාලයට/කාර්‍යාලයෙහි ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකිකවූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතනවලිනුත්, සමූපකාර සමිතිවලිනුත් ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන ටැන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලීද ඇතුළත් විය යුතුයි.

2. ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘති පත්‍රය මතැයි. රු. 100ක මුදලක් ළඟැමැ ඇති කච්චේරියේ ගාල්ලේ සෞ. සේ. අධිකාරී නමට තැන්පත් කොට, එහි ලදුපත ලබාගෙන, ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා ටැන්ඩර්කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමග ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් පත්‍ර 1969.9.8 වනදා දහවල් 12 දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරී කාර්‍යාලවලින් ලබාගත හැකියැ :—

අනුරාධපුර, ගාල්ල, කෑගල්ල, පුත්තලම, මඩකලපුව, යාපනය, කුරුණෑගල, රත්නපුර, බදුල්ල, කළුතර, මාතලේ, වවුනියා, කොළඹ, මහනුවර සහ මාතර.

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැලකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටැන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ඉහත 2 වන ඡෙදයෙන් කියැවුනු කවර හෝ සෞ. සේ. අධිකාරී කාර්‍යාලයයෙකින් ලද හැකිවේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ටැන්ඩර් පත්‍ර " බඩු ඇදීම සඳහා ටැන්ඩරය " යනුවෙන් වම් පැත්තේ උඩු කෙළවරේ සලකුණක් තබා ගාල්ලේ සෞ. සේ. අධිකාරී වෙත පිට නම් ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර 1969.9.9 වනදා පෙරවරු 10ට පෙර ගාල්ලේ සෞ. සේ. අධිකාරී වෙත ලැබෙන සේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. නැතහොත් සෞ. සේ. අධිකාරී කාර්‍යාලයයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුය. ටැන්ඩර්කරුවන් කැමැති නම්, ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත්, අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෞ. සේ. අධිකාරී කාර්‍යාලවලැ, ලේකම්/ගණකාධිකාරී වෙත බාර දී ඊට ලදුපතක් ලබාගැනීමට ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන්ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් සහ මකා දැමීම් සියල්ල ටැන්ඩර්කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

7. බඩු ඇදීම සඳහා සෑහෙන තරම් ප්‍රවාහන පහසුකම් සැලසීමට ටැන්ඩර්කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොදා ගැනීමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විට දක්විය යුතුයි.

8. ටැන්ඩර් පත්‍ර 1969.9.9 වනදා පෙරවරු 10ට ගාල්ලේ සෞ. සේ. අධිකාරී කාර්‍යාලයේදී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම් ලත් නියෝජිතයින්ට හෝ තමුන් කැමති නම්, ගාල්ලේ සෞ. සේ. අධිකාරී සමඟ විධිවිධාන සලසා ගෙන ඔහුගේ අවසරය පිට, ටැන්ඩර් විවෘත කරන විට පෙනී සිටිමින් තමන් ඉදිරිපත් කළ ටැන්ඩරයේ දෙවන පිටපත පිරික්සිය හැකිය.

9. ටෙන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළ ගණන්, ටැන්ඩර බාරගැනීම අවසන් වන දවසේ සිටැ හය මාසයක් පිළිගත හැකි සේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටෙන්ඩර් පත්‍ර පසුවැ අස් කළ හැකි නොවේ.

10. ගාල්ලේ සෞ. සේ. අධිකාරී ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදානමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටු කිරීමේදී ටැන්ඩර්කරු සේවයට ගත යුත්තේ ලාංකිකයින් පමණකි. මෙහිදී " ලාංකිකයා " යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි. ගාල්ලේ සෞ. සේ. අධිකාරීගේ අවසරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන්ට සේවයට ගැනීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළාක් සේ සලකා කොන්ත්‍රාත්තුව අවලංගු කොට එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරණ කම්කරු වන්දි මුදල් ආඥපනත හෝ එහි සංශෝධන, ලිහිල් කිරීම්, එකතු කිරීම් යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත්, කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම දෙයකින්මැ ආණ්ඩුව මුදගත යුතුයි.

13. ගාල්ලේ සෞ. සේ. අධිකාරී තැන ඉල්ලා සිටින පරිදි මුළු කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රුපියල් 300කට නොවැඩි ඇප මුදලක් තැබීම අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටැන්ඩර්කරු කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කරන බවට සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය බාරගත් බව ගාල්ලේ සෞ. සේ. අධිකාරී විසින් හෝ ඔහුගේ නිසි වරම් දරණ නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර්කරුට දන්වා දස දිනක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල තැබීමට හෝ ටැන්ඩර්කරු මැළි වූවහොත් හෝ අපොහොසත් වූවොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වී, රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් කිරීමටද හේතුවේ. ටැන්ඩරය බාරගත් බව දක්වෙන නිවේදනය ටැන්ඩර්කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපැලෙන් යවා තිබෙ නම්, නැතහොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබෙ නම්, එය ටැන්ඩර්කරුට ලැබුණු බව ගණන් ගනු ලැබේ.

15. ගාල්ලේ සෞ. සේ. අධිකාරීගේ අවසරය කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීම හෝ බෙදදීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරනු පිණිස අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

16. ගාල්ලේ සෞ. සේ. අධිකාරී තැන, සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැන සිය විරුද්ධත්වය ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කලැ ඒ කියන තැනැත්තා/තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිවැ ටැන්ඩර් සියල්ලමැ හෝ ඉන් කිසිවක් හෝ පිටුදැකීමත්, යම් ටැන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෞ. සේ. අධ්‍යක්ෂ තැන සමග කොන්ත්‍රාත්කරු බැඳුණු ගිවිසුම කවරක් වුවද, තමන් කැමැති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස ගාල්ලේ සෞ. සේ. අධිකාරී වෙත තිබේ. එබඳු විටෙකැදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරුවෙක්ද නොවේ.

19. ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙන ගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වූවොත් නැත්නම් අපොහොසත් වූවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ, ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාක් සේ සලකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදලද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදළ වෙයි.

21. ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිළි කිසි කලෙකත් සලකා බලනු නොලැබේ.

22. මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරටමැ සපුරා නැතොත් කිසිදු ටැන්ඩරයක් සලකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත 2 වැනි ඡෙදයේ දැක්වෙන කායඹාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

24. **දුර ප්‍රමාණ කිට්ටුවෙන්.**—දුම්රිය පොළවල සිට ආයතනවලට/කායඹාලවලට කොපමණ දුරක් තිබේද යන වග මේ සමග ඇති උපලේඛනයේ දැක්වේ. මෙහි දැක්වෙන දුර ප්‍රමාණයේ නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අයකිරීම.**—කොන්ත්‍රාත්කරු විසින් ගෙන ගොස් බාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවුවොත් හෝ සොරකම් කරනු ලැබුවොත් හෝ බඩු බාහිරාදියට අලාභයක්-හානියක් සිදු වුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට සිදුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එයද ඇතුළත් කොට, අලාභහානි සිදුවූ හෝ සොරකම් කරන ලද හෝ නැතිවූ බඩු බාහිරාදියෙහි මුළු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. **දැක්විය යුතු මිළ ගණන් :**

(අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී-I උපලේඛනයෙහි දැක්විය යුතු :—
පළමුවැ රාත්තල් 28 දක්වාද,
දෙවනුවැ රාත්තල් 28ට වැඩියෙන් රාත්තල් 56 දක්වාද,
තුන්වනුවැ රාත්තල් 56ට වැඩියෙන් රාත්තල් 84 දක්වාද,
සිව්වනුවැ රාත්තල් 84ට වැඩියෙන් හොණ්ඩර 1 දක්වාද,
පස්වනුවැ හොණ්ඩර 1ට වැඩියෙන් හොණ්ඩර 1½ දක්වාද,
හයවනුවැ හොණ්ඩර 1½ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වාද,
හත්වනුවැ හොණ්ඩර 2ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වාද,
අටවනුවැ හොණ්ඩර 2½ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වාද,
නමවනුවැ හොණ්ඩර 3ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වාද,
දසවනුවැ හොණ්ඩර 3½ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වාද වේ.

(ii) එක් බඩු පොදියක් මුළු දුරමැ ගෙනැ යාම සඳහා එක් එක් බර-ගොල්ල උදෙසා මිළ ගණන් දැක්විය යුතුයි.

(iii) මුදල් ගෙවනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දැක්වෙන බර කුමක් වූවද මුළු දුර ප්‍රමාණයමැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවැයි.

(iv) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4කට අඩු නම්, ඒවායේ ගෙවීම් බී-I උපලේඛනය යටතේ විය යුතුයි. එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4කට වැඩි වේ නම් ඒවායේ ගෙවීම් තොග ප්‍රවාහණ ගෙවීම් යටතේ බී-II උපලේඛනය යටතේ විය යුතුයි.

(ආ) හොණ්ඩර 4ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යැම සඳහා මතු සඳහන් වැටි 4 යටතේ බී-(II) උපලේඛනයෙහි මිළ ගණන් දැක්විය යුතුයි :—

(1) හොණ්ඩර 4කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා.

(2) හොණ්ඩර 10කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා.

(3) හොණ්ඩර 15කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා.

(4) ටොන් 1කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යැම සඳහා ඒ ඒ වැටි යටතේ මිළ ගණන් වෙන වෙනම, දැක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දැක්වූ මිළ ගණන් මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැලකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(ඇ) සඳහන් කර ඇති මිළ ගණන් සාධාරණ විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.

27. මේ දැන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ආපසු එවිය යුතුයි.

බී. ජී. ඩී. ප්‍රනාන්දු,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

1969 අගෝස්තු මස 6 වැනි දින.

———————,
නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

දිනය : 196————.

———————,
ටැන්ඩර්කරුගේ අත්සන.

දිනය : 196————.

## ගබඩා බඩු ප්‍රවාහනය කිරීමේ ටෙන්ඩර් කොන්දේසිවලට 24 වැනි වගන්තියේ සඳහන් උපලේඛනය—1969–70

### ගාල්ල සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය—දුම්රිය ස්ථානවල සිට ආයතනයන්ට ඇති දුර ප්‍රමාණය දළ වශයෙන්

| දුම්රිය ස්ථානයේ සිට I ගණය | ආයතනයට | දළ දුර ප්‍රමාණය සැතපුම් |
|---|---|---|
| අළුත්ගම | බෙන්තොට මැදි ඔසුහල | 1 |
| | හබුරුගල මාතෘ නිවාසය | 6½ |
| | බෙන්තොට ගාමිණී විද්‍යාලය දන්ත චිකිත්සාගාරය | 1 |
| ඉඳුරුව | ඉඳුරුව පයඹන්තික රෝහල | 1½ |
| | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කායඹාලය | 1¾ |
| කොස්ගොඩ | කොස්ගොඩ මැදි ඔසුහල | ¼ |
| | ඌරගහ ග්‍රාමීය රෝහල | 4 |
| | හිපන්කන්ද මැදි ඔසුහල | 7 |
| බලපිටිය | බලපිටිය රෝහල | 1¾ |
| | බලපිටිය සිද්ධාර්ථ විද්‍යාලය දන්ත චිකිත්සාගාරය | 1¼ |

| දුම්රිය ස්ථානයේ සිට | ආයතනයට | දළ දුර ප්‍රමාණය සැතපුම් |
|---|---|---|
| I ගණය : | | |
| අම්බලන්ගොඩ | අම්බලන්ගොඩ රෝහල | 2 |
| | අම්බලන්ගොඩ මැදි ඔසුහල | $\frac{1}{4}$ |
| | අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්‍යාලය | 1 |
| | මාදම්පෙ ග්‍රාමීය රෝහල | $2\frac{1}{2}$ |
| | බොරකන්ද පයර්න්තික ඒකකය | 5 |
| | ඇල්පිටිය රජයේ රෝහල | $10\frac{1}{2}$ |
| | ඇල්පිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්‍යාලය | 10 |
| | කහදූව මැදි ඔසුහල | 16 |
| | පිටිගල මැදි ඔසුහල | 17 |
| | අමුගොඩ මාතෘ නිවාසය | $15\frac{3}{4}$ |
| | අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාල දන්ත චිකිත්සාගාරය | $\frac{1}{4}$ |
| | ඇල්පිටිය ආනන්ද මහා විද්‍යාල දන්ත චිකිත්සාගාරය | $10\frac{1}{2}$ |
| | කුලීගොඩ මහා විද්‍යාල දන්ත චිකිත්සාගාරය | 3 |
| කහව | බටපොල ග්‍රාමීය රෝහල | 7 |
| හික්කඩුව | හික්කඩුව පයර්න්තික ඒකකය | $2\frac{1}{2}$ |
| | හික්කඩුව මැදි ඔසුහල | $\frac{1}{2}$ |
| | බද්දෙගම පයර්න්තික ඒකකය | 8 |
| | බද්දේගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්‍යාලය | 8 |
| | ගෝනපීනුවල සාරාලංකාර විද්‍යාල දන්ත චිකිත්සාගාරය | 3 |
| දෙඩන්දූව | රත්ගම මැදි ඔසුහල | $1\frac{3}{4}$ |
| | රත්ගම දේවපතිරාජ විද්‍යාල දන්ත චිකිත්සාගාරය | 1 |
| II ගණය : | | |
| ගාල්ල | රිපන් බාලිකා විද්‍යාල දන්ත චිකිත්සාගාරය | $2\frac{1}{2}$ |
| | අක්මීමන මැදි ඔසුහල හා මාතෘ නිවාසය | 6 |
| | නාගොඩ මැදි ඔසුහල හා ග්‍රාමීය රෝහල | 18 |
| | උඩුගම රජයේ රෝහල | 22 |
| | හිනිදුම රජයේ රෝහල | 34 |
| | ඕපාත මැදි ඔසුහල | 44 |
| | නෙළුව මැදි ඔසුහල හා මාතෘ නිවාසය | 42 |
| | වඳුරඹ මැදි ඔසුහල | 12 |
| | යක්කලමුල්ල මැදි ඔසුහල | 14 |
| | අළුත්නායම්ගොඩ මැදි ඔසුහල | 22 |
| | ගාල්ල රිච්මන්ඩ් විද්‍යාල දන්ත චිකිත්සාගාරය | $2\frac{1}{2}$ |
| | ගාල්ලේ සංඝමිත්තා විද්‍යාල දන්ත චිකිත්සාගාරය | 1 |
| | උඩුගම මහා විද්‍යාල දන්ත චිකිත්සාගාරය | 24 |
| | නාගොඩ මහා විද්‍යාල දන්ත චිකිත්සාගාරය | 19 |
| අහංගම | ඉමදූව පයර්න්තික ඒකකය | 6 |
| | අහංගම ගැමි රෝහල | $2\frac{1}{2}$ |
| | අහංගම මැදි ඔසුහල | $\frac{1}{4}$ |
| තල්පෙ | හබරාදූව ගැමි රෝහල | $3\frac{1}{4}$ |
| උණවටුන | උණවටුන රෝහල | $\frac{3}{4}$ |
| | උණවටුන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්‍යාලය | 1 |
| | පිලාන මැදි ඔසුහල | 4 |

8–748—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### අංගොඩ මානසික රෝහලට දර සැපයීම

1969 ඔක්තෝබර් මස 1 වැනිද සිට 1970 සැප්තැම්බර් මස 30 වැනිදයින් අවසන් වන වර්ෂය තුල මේ සමඟ ඇති උප ලේඛණයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති දර සැපයීම සඳහා එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර ලාංකිකයන් ගෙන් හෝ ලාංකීක ආයතන වලින් අංගොඩ මානසික රෝහල් අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මගින් සපයන ලද පෝර්ම වල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සමඟ ඇති උපලේඛනයේ 4 වන තීරයෙහි සඳහන් දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිල ගණන්ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර්පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් මානසික රෝහල් අධිකාරී හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු ගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළහැකිය.

4. මේ සමඟ ඇති උප ලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කරන ලද කුවිතාන්සියක් ටෙන්ඩර්පත්‍ර ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර නිකුත් කරන දිනට පෙර දින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපැලෙන් පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට ප්‍රථම තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු මානසික රෝහල් අධිකාරි වෙත දන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය පෝර්ම එම කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු කල් වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම ඉහත සඳහන් මානසික රෝහල් අධිකාරීතැන ගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙලවරේ එය කවර සේවාවක්ද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන්

හෝ ලේකම්වරයාට එය පුද්ගලිකව භාරදීමෙන් හෝ එය ලැබුන බවට කුවිතාන්සියක් ද ලබාගත හැක. ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් ද එවීමට පුළුවන. ටෙන්ඩර් භාරගන්නා අවසාන දින පෙ. ව. 10 ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාර දෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. මෙම ආයතනය සඳහා සැපයිය යුතු දර ප්‍රමාණය දල වශයෙන් ආයතනය භාර වෛද්‍ය නිලධාරිතුමා ගෙන් හෝ මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේ ය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීමද නැතහොත් සියලුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලයද රජය සතුව ඇත.

11. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම්පතක් එවීමෙන් දැනගත හැකිය.

ඇම්. ජී. ජයසුන්දර,
මානසික රෝහල් අධිකාරී.

මානසික රෝහල් අධිකාරි කාර්යාලය,
අංගොඩ,
1969.8.6 වෙනි දින.

උපලේඛනය

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
| ආයතනයේ නම සහ සේවය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
| | රු. | රු. | |
| අංගොඩ මානසික රෝහලට දර සැපයීම | 50 ... | 300 ... | 1969 සැප්තැම්බර් මස 4 වෙනි දින පෙ.ව. 10 ට |

8–752—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහනුවර සෞඛ්‍ය අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 සැප්තැම්බර් මස 1 වැනි දින සිට 1969 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ මේ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවැනි තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර මහනුවර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—(I) මෙහි උපලේඛනයෙහි දෙවන තීරයෙහි සඳහන් නියම කරන ලද මුදල් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතු ය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති හෝ ඇතුළත් සංගම් හා විවිධ සංගම්වලට අයිති සංගම්වලටද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිළිව සඳහන් කළ යුතු ය.

(II) ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, බදුල්ල, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන් ගේ කාර්යාලවලින් ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (II) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වෙනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, මහනුවර'', කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර්පත්‍ර මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වෙනි තීරයෙහි සඳහන් දිනයන්හි පෙ.ව. 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත්‍ර තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල් අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර්පත්‍රයේ සඳහන් මිල ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිල ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

8. **ටෙන්ඩර්පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර්පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයෙහි සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ දී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරනු ලැබූ ඕනෑම ටෙන්ඩර්යක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීම මා සමඟ කලින් පිළියෙළ කරගත් දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

9. **ටෙන්ඩරයේ සඳහන් කරන මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවැනි ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් ම සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතු ය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුගේ බඩුබාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**— ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වන්නේය.

තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයින් විසින් භාර දී ඇති කූපන් වෙනුවෙන් සහන මිල යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ජී. ඊ. ගජනායක,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී.

1969 අගෝස්තු 7 දින,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය.

## උපලේඛනය

| ආයතනයේ නම | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් බාරගන්න අවසාන දිනය | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයනට | | | | රෝගීන්ට | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| ගෝනාගංතැන්න, මා. නි. ... | 100 ... | 300 | 1969 අගෝස්තු 30 වැනි දින පෙ.ව. 10 ට | 1,50... | 1,50... | 200... | 600... | 250... | 250... | 250... | 900 |
| බොක්කාවල, මා. නි. ... | 100 ... | 200 | | 50... | 50... | 50... | 50... | 100... | 100... | 100... | 500 |
| ගලහ, මා. නි. ... | 100 ... | 200 | | 50... | 50... | 50... | 50... | 100... | 100... | 100... | 500 |
| මඩවල, මා. නි. ... | 100 ... | 200 | | 50... | 50... | 50... | 50... | 100... | 100... | 100... | 500 |

8–817—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව — කුරුණෑගල

### කුරුණෑගල අධ්‍යාපන ප්‍රදේශයේ පාසැල්වලට කිරි, බිස්කෝතු ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම

1969.10.1 සිට 1970.9.30 දක්වා කාලය තුල මෙහි පහත දැක්වෙන සේවාවන් සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969.9.5 වැනි දින පෙ ව. 10.30 තෙක් බාර ගනු ලැබේ :—

(අ) කුරුණෑගල හා මහව රජයේ ගබඩාවල සිට හාඩ් බෝඩ් පෙට්ටි වල හා ටින්වල අහුරන ලද බිස්කෝතු පහත දැක්වෙන මණ්ඩලයන්හි පිහිටි රජයේ පාසැල් වෙත ගෙන ගොස් විදුහල්පතීන්ට භාර දීම. පෙට්ටියක සාමාන්‍ය බර රා. 20 කි.

(ආ) රජයේ ගබඩා වෙත පාසැල්වලින් හිස් බිස්කෝතු පෙට්ටි ආපසු ගෙන ඒම. හිස් බිස්කෝත්තු පෙට්ටි ගෙන ආ යුත්තේ දෙපාර්තමේන්තුව අවශ්‍යයයි දැන් වූවහොත් පමණි.

සඳහන් කරන ලද පාසැල් මණ්ඩල මෙපරිදිය:—

(1) කුරුණෑගල
(2) පොල්ගහවෙල
(3) මාවතගම
(4) වාරියපොල (1)
(5) වාරියපොල (2) (හෙට්ටිපොල ප්‍රදේශය)
(6) දොඩන්ගස්ලන්ද
(7) දඹදෙණිය
(8) කුලියාපිටිය
(9) කටුගම්පොල
(10) හිරියාල (i) ඉබ්බාගමුව ප්‍රදේශය
(11) හිරියාල (ii) (පොල්පිතිගම ප්‍රදේශය)
(12) මහව
(13) ගල්ගමුව.

මහව හා ගල්ගමුව මණ්ඩලවලට මහව ගබඩාවෙනුත් අනිකුත් සියලුම මණ්ඩලවලට කුරුණෑගල ගබඩාවෙනුත් බිස්කෝත්තු ගෙන යා යුතුව ඇත.

2. එක් ටෙන්ඩර් කරුවෙකුට මණ්ඩල එකක් හෝ ඊට වැඩි ගණනක් ඉල්ලුම් කළ හැකිය. නමුත් එක් එක් මණ්ඩලය සඳහා වෙන වෙනම ගණන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර්කරුවන් මෙම සේවය සඳහා ටෙන්ඩර් පිළියෙල කිරීමේදී හොන්ඩරයක් බර බිස්කෝතු සඳහා දුර ප්‍රමාණය නොතකා ගබඩාවේ සිට පාසැල දක්වා ගෙන ගොස් පාසැල් ප්‍රධානීන්ට බාර දීම සඳහා අය කරන ගාස්තුව සඳහන් කළ යුතුය. හිස් පෙට්ටි එකක් ආපසු ගෙන ඒම සඳහා ගාස්තුව වෙනම සඳහන් කළ යුතුය.

3. කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයෙන් ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍ර මත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර රු. 100ක තැන්පත් මුදලක් කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය. 1969.9.4 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිතියක් නම් එකී මුදල තැන්පත් කිරීම අනවශ්‍යය. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර පිටපත් දෙකකින් යුක්ත විය යුතුය.

4. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් බාරදීම අපෙක්ෂා කරන අයවලුන් විසින් කුරුණෑගල අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත රු. 15,000 ක් වටිනා ස්ථිර දේපල ඇති බවට ඒත්තු යන පරිදි සහතිකයක් හා ඉල්ලුම්කරුගේ නමින් ලියා පදිංචි කරන ලද 1969 වර්ෂයට බල පත්‍රයක් ලබාගත් එක ලොරියක්වත් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ලියා පදිංචි කරන ලද සමූපකාර හෝ ග්‍රාම සංවර්ධන සමිති මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට කලින් කුරුණෑගල අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වරයාගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමාගෙන් හෝ කම්කරු කොමසාරිස් තුමාගෙන් එකී සමිතියට මෙම සේවය ඉටු කිරීමට හැකියාව ඇති බවට සහතිකයක් යථා යෝග්‍ය පරිදි ලබා ගෙන ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවන් සම්පූර්ණ නොකල අයට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු නොලැබේ.

5. කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගෙන් හෝ ඇදිහැස සංවිධානයෙන් හෝ නිකුත් කිරීමේ ඇනවුම් පත් ලැබී දින හතක් ඇතුළත පාසැල්වලට බිස්කෝතු ගෙන ගොස් බාර දී අවසන් කළ යුතුවේ. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි කොටසක් පමණක් බාර ගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ටෙන්ඩර් අපේක්ෂකයින් ඔවුන්ගේ ටෙන්ඩර පත්‍ර පිළිබඳ අවසාන තීරණය සඳහා ටෙන්ඩර් පත්‍ර බාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක් කල් දිය යුතුය.

6. බාර ගන්නා ලද ටෙන්ඩර් පත්‍ර 1969.9.5 වැනි දින පෙ.ව. 10.30 ට කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර ඇත.

7. අධ්‍යාපන අධ්‍යක්ෂතුමා නියම කරන මුදලක් ඇප වශයෙන් තැන්පත් කිරීමට තෝරාගත් ටෙන්ඩර් කරුවන් සූදානම් විය යුතුය.

8. මේ පිළිබඳව සියලුම කොන්දේසි හා වෙනත් විස්තර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩී. ඇස්. කලුගම්පිටිය,
කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 2 වැනි දින දීය,
අධ්‍යාපන කාර්යාලය,
කුරුණෑගල.

8–680—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 5 වැනිදා පෙ. ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| මාර/වැලිගම මුස්ලිම් ම. වි. ... | රැස්වීම් ශාලාවේ (ඉතිරි වැඩ). |

සංලක්ෂයය : මාර=මාතර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රු. 150,000 හා ඊට වැඩි ගණන කට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 සැප්තැම්බර්

මස 4 වන දින පස්වරු 3.30 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

5. 1969 සැප්තැම්බර් මස 5 වැනිදා පෙ.ව. 10.30ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කල දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් මාතර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකා බලනු ලැබේ.

ජේ. එල්. එම්. ප්‍රනාන්දු,
මාතර, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 අගෝස්තු මස 4 වැනි දින,
මාතර, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

8–735—69.8.15 දින අංක 14,867 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 සැප්තැම්බර් මස 5 වැනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩෙහි සවභාවය |
|---|---|
| කු/කුලියාපිටිය මහා විද්‍යාලය ... | විද්‍යාගාරය |

සංලක්ෂ්‍යය : කු=කුරුණෑගල දිස්ත්‍රික්කය.

